අන්තර් ජාතික ආයෝජන නීතිය

හැඳින්වීම

අන්තර් ජාතික ආයෝජන නීතිය යටතේ ආයෝජනය යන්නට ප්‍රාග්ධන ආයෝජනය පමණක් අයත් නොවන බව එකී නීතියේ නිර්වචනවලට අනුව පෙනීයයි. එනම් අන්තර් ජාතික ආයෝජන නීතිය යටතේ ආයෝජනය යනු, එක් රටක් තවත් රටක් වෙත භාණ්ඩ, පුද්ගලයින්, ප්‍රාග්ධන හා සේවාවන් පැවරීමකි. මෙහි දී සේවා සම්පාදනය තාක්ෂණික හෝ උපදේශාත්මක විය හැක.

ආයෝජනය සම්බන්ධයෙන් වැදගත් වන පාර්ශවයන් දෙකකි.

1. මව් රාජ්‍යය (Home state)
2. සත්කාරක රාජ්‍යය (Host state)

ආයෝජන කැඳවන රාජ්‍යය සත්කාරක රාජ්‍ය යනුවෙන් හැඳින්වෙන අතර ආයෝජන ලබාදෙන රාජ්‍යය මව් රාජ්‍යය වේ.

විදේශ ආයෝජන නිර්වචනः

මහාචාර්ය ස්වර්ණරාජා දක්වන පරිදි

1. ස්පර්ශනීය හෝ ස්පර්ශනීය නොවන දේපලක් එක් රටක සිට තවත් රටක් කරා එම වත්කම් අයිතිකරුගේ පූර්ණ හෝ අර්ධ පාලනය යටතේ දෙවන රටේ ආර්ථික සංවර්ධනය උදෙසා එනම් එම රටේ ධනය වර්ධනය කිරීමේ අරමුණින් ලබා දෙන්නකි.

2. විදේශීය ආයෝජකයෙක් තවත් රටක දේශ සීමාව තුළ එම රටේ නීතින්ට හා ප්‍රතිපත්තීන්ට යටත්ව සිදු කරන ප්‍රාග්ධන ආයෝජනයකි.

මූලික ලෙසම විදේශ ආයෝජන කැඳවනු ලබන්නේ රටක ආර්ථික උන්නතිය සඳහාය. විදේශීය ණය මගින් යම් රටක ආර්ථික උන්නතිය අත්පත් කර ගැනීමට කටයුතු කිරීමේ දී ලබා ගත් ණය සඳහා විශාල පොළියක් ගෙවීමට යටත් වීමටත්, ණය දෙන ආයතනයන්හි කොන්දේසීන්වලට යටත් වීමටත් සිදු වේ. ඒ අනුව බලන විට විදේශ ආයෝජන ලබා ගැනීම මගින් සත්කාරක රාජ්‍යයට සහ මව් රාජ්‍යයට සිය එකඟතාව යම්තාක් දුරට ස්වාධීනව පවත්වා ගෙන යා හැකි වේ. විදේශ ආයෝජන අන්තර්ජාතික ආයෝජන ගිවිසුම් (contracts) හා සම්මුතීන්ට (treaties) මෙන්ම සත්කාරක රාජ්‍යයේ දේශීය නීතියට හා අන්තර් ජාතික නීතියට යටත්ව පවතී. මේ ආශ්‍රිතව නීති පැනවීමේ දී සත්කාරක රට වෙත වඩා වැඩි අයිතියක් හිමි වේ. මෙය ආයෝජකයන්ට රිසි නොවන තත්වයකි. මේ නිසා ආයෝජකයන් සිය ආයෝජනය සම්බන්ධයෙන් සත්කාරක රාජ්‍යය තමා වෙත ඉහළම සත්කාරය (Most Favoured Nation Treatment) ලබා දිය යුතු බව පවසයි. ඉහළම සත්කාරය යනුවෙන් අදහස් කරන්නේ සත්කාරක රටක් ආයෝජන සම්බන්ධයෙන් ලබාදෙන ඉහළම සත්කාරය වන අතර අන්තර්ජාතික සම්මුතීන්හි පිළිගත් නීතිවලට එකගව එය සැකසිය යුතු බව ඔවුන් තර්ක කරයි.

විදේශ ආයෝජන ආශ්‍රිතව සත්කාරක රටේ නීතියට අමතරව, එකී ආයෝජන සම්බන්ධයෙන් පවතින විදේශ ආයෝජන ගිවිසුම් වැදගත් වේ. විදේශ ආයෝජන ගිවිසුම්හි පාර්ශවකරුවන් වනුයේ විදේශ ආයෝජකයා සහ සත්කාරක රාජ්‍යයයි. සත්කාරක රාජ්‍යය වෙත ජාත්‍යන්තර නීතිය තුළ හිමිවන නෛතික පුද්ගලභාවය හේතුවෙන් ආයෝජන ගිවිසුම යටතේ සත්කාරක රාජ්‍යයට වඩා ප්‍රබල තත්ත්වයක් හිමි වේ. විදේශ ආයෝජකයෙක් යනු එක්කෝ තනි පුද්ගලයෙක් නැතිනම් පුද්ගල කණ්ඩායමක් හෝ බහු ජාතික සමාගමක් වන අතර ඊට ජාත්‍යන්තර නීතිය හමුවේ නෛතික පුද්ගලභාවය හිමි නොවේ.

විදේශ ආයෝජන නීතිය ආශ්‍රිතව අන්තර් ජාතික සම්මුතීන් (treaties) ද වැදගත් වේ. අන්තර්ජාතික සම්මුතීන් මූලික වශයෙන් තෙයාකාර වේ.

1. ද්වි පාර්ශවීය ආයෝජන සම්මුතීන් (Bilateral Investment Treaties)
2. කලාපීය සම්මුතීන් (Regional Treaties)
3. බහු පාර්ශවීය සම්මුතීන් (Multilateral Treaties)

1. ද්වි පාර්ශවීය සම්මුතීන්

රාජ්‍යයන් දෙකක් අන්‍යෝන්‍ය වශයෙන් තමන් අතර සිදුවන ආයෝජනයන් වර්ධනය කර ගැනීමේ සහ ආරක්ෂාකර ගැනීමේ අරමුණින් ඇති කර ගන්නා සම්මුතීන් වේ.

2. කලාපීය සම්මුතීන්

ආසියාතික රාජ්‍යයන්ල සාක් කලාපීය රාජ්‍යයන් වැනි යම් කලාපීය රාජ්‍යයන් ඉහත දැක්වූ පරිදි වෙනත් දැ අතර ආයෝජන ආරක්ෂාව සහ වර්ධනය සඳහා ඇති කරගනු ලබන සම්මුතීන් මින් අදහස් වේ.

3. බහු පාර්ශවීය සම්මුතීන්

රාජ්‍යයන් සමූහයක් ඉහත අරමුණු අත්පත් කර ගැනීම සඳහා ඇති කරගනු ලබන සම්මුතීන් වේ.

විදේශ ආයෝජන ගිවිසුම් සහ අන්තර්ජාතික සම්මුතීන් අතර පවතින්නා වූ ප්‍රධාන වෙනස වනුයේ ගිවිසුමක එක් පාර්ශවයක් රාජ්‍යයක් වුවද අන් පාර්ශවය එසේ නොවේ. නමුත් සම්මුතියක පාර්ශවයන් දෙකම ජාත්‍යන්තර නීතිය යටතේ නෛතික පුද්ගලභාවය හිමි පරමාධිපත්‍ය රාජ්‍යයන් දෙකකි. එබැවින් ඉතාමත් සීමිත ව්‍යතිරේක යටතේ හැර එක් රාජ්‍යයකට ඒක පාර්ශවීය ලෙස සම්මුතියේ ප්‍රතිපාදන උල්ලංඝනය කළ නොහැකි වේ.

විදේශීය ආයෝජකයින් සිය ආයෝජනයන් සිදු කරනු ලබන්නේ ලාභ උපරිම (profit maximization) කර ගැනීමේ අපේක්ෂාවෙනි. ආයෝජකයා සත්කාරක රාජ්‍යය කරා පැමිණි විට එහි පවතින්නේ සපුරා වෙනස් ආර්ථික, සමාජීය පසුබිමක් විය

හැකිය. එබැවින් ගැටලු පැනනැගිය හැකි අතර ආයෝජකයාගේ මෙන්ම සත්කාරක රටේ අයිතීන් ද සලකා බැලීමෙන් මෙම ගැටලු නිරාකරණය කරගත යුතු වේ.

විදේශ ආයෝජන වර්ග

1. විදේශ සෘජු ආයෝජන (Foreign Direct Investments)
2. ආයෝජන කලඹ (Portfolio Indirect Investments)

1. විදේශ සෘජු ආයෝජන (Foreign Direct Investment)

විදේශ ආයෝජකයෙක්, සිය දේශ සීමාවට ඔබ්බෙන් සිදු කරන්නා වූ ප්‍රාග්ධනය, භාණ්ඩ හා සේවාවන් ආයෝජනයක් මින් අදහස් වේ.

2. ආයෝජන කලඹ (Portfolio Indirect Investments)

එක් රටක ස්ථාපනය කරන ලද හෝ ක්‍රියාත්මක වන්නා වූ සමාගමක කොටස් මිලදී ගැනීමේ අරමුණින් සිදු කරන මුදල් සංසරණයක් මින් අදහස් වේ.

විදේශ සෘජු ආයෝජන සහ ආයෝජන කළඹ අතර පවතින්නා වූ ප්‍රධාන වෙනස්කම්

ආයෝජන කලඹක දී සමාගමේ භාරකාරත්වය හා පාලනය සමගින් එම සමාගමෙහි හිමිකාරත්වය මුළුමනින්ම වෙනස්ව පවතී. කෙනෙක් සමාගමේ අයිතිකරුවකු වූ පමණින් එම සමාගමේ භාරකාරත්වය හෝ පාලනය හිමි නොවේ. නමුත් සෘජු ආයෝජනවල දී ආයෝජකයා තමාගේ ආයෝජනය සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් පාලනය කරමින් එහි භාරකාරත්වය දරයි.

ආයෝජන කලඹක දී, එවන් ආයෝජනයක් සිදු කිරීමේ සම්පූර්ණ අවධානම ආයෝජකයා තනිව බාර ගනී. නමුත් සෘජු විදේශ ආයෝජනයකදී ආයෝජකයා සත්කාර රටේ ගෘහස්ථ නීතිය යටතේ මෙන්ම හා මව් රාජ්‍යයේ මැදිහත් වීම තුළින් තානාපති රැකවරණය ඇතුළු නොයෙකුත් ආරක්ෂාවන් සලසා ගනී.

අවධානම භාර ගැනීම සම්බන්ධයෙන් අනුගමනය කරන වෙනසට හේතු

සිය සිතැඟි පරිදි තෝරාගනු ලබන ආයෝජනය සම්බන්ධයෙන් ආයෝජන කලඹ ආයෝජකයා මෙන්ම සෘජු විදේශ ආයෝජකයා ද එක හා සමානව අවධානම භාරගත යුතු වුව ද අන්තර්ජාතික නීතිය යටතේ සාමාන්‍යයෙන් පිළිගනු ලබන තත්ත්වයන්ට අනුව මෙම වර්ගීකරණය සම්බන්ධයෙන් වෙනස් සැලකීමක් දක්වනු ලැබේ.

විදේශීය සෘජු ආයෝජනයකදී ආයෝජකයා රැගෙන එන සම්පත් හා වත්කම් මව් රාජ්‍යය සලකනු ලබන්නේ මව් රටේ ආර්ථික වර්ධනය සඳහා උපයෝගී කරගත හැකි දේ එම රාජ්‍යයෙන් පිටතට රැගෙන යාමක් ලෙසයි. එමනිසා මෙම සම්පත් ආරක්ෂාකාරීව පවතින බව තහවුරු කර ගැනීමට විවිධාකාර උපක්‍රම මව් රාජ්‍ය විසින් අනුගමනය කරනු ලබයි. එමෙන්ම ආයෝජන කලඹක දී ආයෝජකයාට සිය ආයෝජනය සම්බන්ධයෙන් යම් අවධානමක් පවතින බව පෙනීයයි නම් සිය ආයෝජනය ඉවත් කර ගැනීමේ නිදහස ඔහුට තිබේ. නමුත් එවන් අවධානමක් පැවතියත් සිය ආයෝජනය ඉවත් කර ගැනීමට විදේශ සෘජු ආයෝජනයකදී ආයෝජකයකු හට හැකියාවක් නොමැත.

ආයෝජන කලඹක දී ආයෝජකයා සත්කාරක රාජ්‍යය කරා පැමිණීම අවශ්‍ය නොවේ. නමුත් විදේශ සෘජු ආයෝජනයක දී ආයෝජකයා සිය දේපල හා කළමනාකරණ කාර්‍යය මණ්ඩලය සමග සත්කාරක රාජ්‍යය කරා පැමිණ එහි රැඳී සිටීම අපේක්ෂා කරයි. එමනිසා අන්තර්ජාතික නීතිය පිළිගන්නා ආකාරයට විදේශ ආයෝජන නංවාලීම සඳහා ආයෝජකයාටත්, ඔහුගේ කාර්ය මණ්ඩලයටත්, දේපල වලටත් ආරක්ෂාවක් සලසාදීම අත්‍යවශ්‍ය වේ. එවන් රැකවරණයක් ලබා නොදෙයි නම් විශ්වමය වශයෙන් විදේශ ආයෝජන ක්‍රියාත්මක වීමක් ද සිදු නොවනු ඇත. මෙලෙස විදේශ ආයෝජන ක්‍රියාත්මක වීම සාමූහික වශයෙන් සියලුම ජාතීන්ගේ සුභසිද්ධිය පිණිසම වේ. ඉන් සත්කාරක හා මව් රාජ්‍යයන් දෙකටම ප්‍රයෝජන අත්පත් වේ. මෙම කාරණා හේතුවෙන් විදේශ සෘජු ආයෝජන කෙරෙහි වැඩි සැලකිල්ලක් හිමි වේ.

ආයෝජන කලඹ මෙන් නොව විදේශ ඍජු ආයෝජනයක දී බොහෝ දුරට ආයෝජනයන් සිදු කරන්නේ බහු ජාතික සමාග ම්ය. එමනිසා විශාල මුදල් ප්‍රමාණයක් ඊට යටත් වේ. එම නිසා සිය ආයෝජන රැක ගැනීම සහ ඒවා පාලනය කිරීම සඳහා බහු ජාතික සමාගම් විසින් ගෝලීය උපක්‍රම සියල්ලම අනුගමනය කරමින් මෙලෙස සැලකිය යුතු පාලනයක් සිය ආයෝජනය සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීමට බහුජාතික සමාගම් වගබලා ගන්නා අතර ඒවායේ මව් රාජ්‍යයන් ද මෙකී ආරක්ෂාව තව දුරටත් තහවුරු කිරීම පිණිස ක්‍රියාකාරී ලෙසින් මැදිහත් වේ. නමුත් ආයෝජන කලඹ සම්බන්ධයෙන් ආයෝජකයාට හෝ මව් රාජ්‍යයට එවන් බලයක් ක්‍රියාත්මක කළ නොහැක.

විදේශ ඍජු ආයෝජනයක දී ආයෝජකයා හා සත්කාරක රාජ්‍යය අතර තිරසාර සම්බන්ධතාවක් නිර්මාණය වේ. ආයෝජකයා කායික වශයෙන් සත්කාරක රාජ්‍යය කරා පැමිණීම සහ ආයෝජකයා සත්කාරක රටේ ආර්ථිකය වර්ධනය සඳහා දක්වන සහය මීට හේතු වේ. එම නිසා සත්කාරක රටේ ආර්ථික හා දේශපාලන ක්‍රියාවලිය සමඟ විදේශීය ඍජු ආයෝජකයන් ක්‍රියාකාරී හා ඍජු සම්බන්ධතාවක් දක්වයි. ආයෝජන කලඹක දී මෙවන් තත්ත්වයක් ඇති නොවේ.

විදේශ ආයෝජන ආශ්‍රිතව කුමනාකාරයක පාලනයක් පැවතිය යුතු ද?

සත්කාරක රාජ්‍යය තර්ක කරනුයේ විදේශ ආයෝජන දේශීය නීතියකට යටත්ව පැවතිය යුතු බවයි. එනම් බාහිර බලපෑම්වලින් නිදහස්ව ආයෝජන ක්‍රියාත්මක විය යුතු බව ඔවුන්ගේ මතයයි. මන්ද විදේශ ආයෝජන තුළින් සත්කාරක රටේ අභිමතාර්ථ මුදුන් පමුණුවා ගත හැක්කේ දේශීය නීතිය තුළින් එය පාලනය වීම සිදු වුවහොත් පමණක් බව සත්කාරක රාජ්‍යයන් පෙන්වාදෙයි.

අන් අතට විදේශ ආයෝජකයා තර්ක කරන්නේ දේශීය නීතියෙන් වෙනස් වූත් දේශීය නීතියට ඉහළින් පවතින්නා වූත් (Supra National System) නීති ක්‍රමයකට විදේශ ආයෝජන යටත් වීම අවශ්‍ය බවයි. විදේශ ආයෝජකයින් සත්කාරක රටේ දේශීය නීතියට එරෙහි වන්නේ සත්කාරක රටට ඒකපාර්ශවීය ලෙස සිය

දේශීය නීතිය වෙනස් කොට විදේශ ආයෝජනයන්ට අහිතකර වන ආකාරයේ තත්ත්වයක් නිර්මාණය කිරීමේ හැකියාවක් පවතින බැවිනි.

තිරසාර සංවර්ධනය

තිරසාර ආර්ථික සංවර්ධනය පවත්වා ගැනීමට මානව සංවර්ධනය අවශ්‍ය වේ. ඉන් ප්‍රධාන කාරණා දෙකක් ඉස්මතු වේ. එනම් මනා සෞඛ්‍ය සම්පන්නභාවය හෙවත් ඉහළ ආයු අපේක්ෂාව නැතිනම් ජීවන අපේක්ෂාවත් සහ ඉහළ අධ්‍යාපන මට්ටමක් පැවතීමත්ය.

මෙම කරුණු දෙක සතුටුදායක අයුරින් පවතී නම් මානව සංවර්ධනය ඉහළ මට්ටමක පවතී. රටක මානව සංවර්ධනය කිරීමට රජයට දායක වීමට නම් රටේ දළ දේශීය නිෂ්පාදනය ඉහළ මට්ටමක පැවතිය යුතු වේ. එවිට ජාතික ආදායම ඉහළ යයි. එවිට එම රටට මානව සංවර්ධනය සිදු කිරීමට අවශ්‍ය පියවර ප්‍රමාණවත් පරිදි ගත හැකිය. නමුත් රටක ආදායම් ව්‍යාප්ත වීමේ විෂමතාව දැඩිව පවතී නම් මානව සංවර්ධනයට වැඩි දායකත්වයක් ලබා දිය නොහැකි විය හැකිය.

ඉහළ අධ්‍යාපන මට්ටමකින් යුත් මනා සෞඛ්‍ය සම්පන්න ජනතාවක් සිටී නම් ඔවුන්ට ආර්ථික වර්ධනයට දායක විය හැකිය. කෙසේ වෙතත් අප රටේ ඇති ආර්ථික ව්‍යුහය, ශ්‍රම හමුදාව අන්තර් ග්‍රහණය කිරීමට තරම් ප්‍රමාණවත් තත්ත්වයක නොමැත. අප රටේ දුගී බව, රැකියා විරහිතභාවය ඉහළ මට්ටමක පවතී. ආර්ථික සංවර්ධනය යටපත් වීමට හේතු වන්නේ රාජ්‍යය වශයෙන් හා පෞද්ගලික වශයෙන් දේශීය ආයෝජනයක් සතුටුදායක ලෙස සිදු නොවීමයි. ඊට හේතු වන්නේ ආයෝජනය සඳහා අතිරික්තයක් නොමැති වීමත් අපේක්ෂිත ආකාරයට විදේශ ආයෝජන නොලැබීයාමත්ය. මානව සංවර්ධනයක් ප්‍රමාණවත් පරිදි තිබුණත් ආර්ථික සංවර්ධනයක් ඊට සරිලන පරිදි සිදු නොවීමට ඉහත කාරණා හේතු වේ.

පරිසරය හා තිරසාර සංවර්ධනය

තිරසාර සංවර්ධනය හා පරිසරය අතර විශාල සබඳතාවක් පවතින බව බොහෝ අය දක්වයි. විදේශ ආයෝජකයන් පැමිණ ගොඩනැගිලි ඉදි කිරීම වැනි විවිධ සංවර්ධන කටයුතුවල නියැලීමල වනහරණය නිසා විශාල පාංශු ඛාදනයක් වීම ඉතා බරපතල ලෙස සිදු වේ. එමගින් ගංගාවල ජල ධාරිතාව අඩු වේ. මෙහි දී වනහරණය සිදුවන තරමට ප්‍රතිරෝපණයක් නොවේ. පරිසර දූෂණය තිරසාර සංවර්ධනයට බාධාවක් වේ. පරිසරයට අපද්‍රව්‍ය දැරීමේ සීමාවක් ඇත. එසේ නොවන විට පරිසරය උණුසුම් වී වැසි ප්‍රමාණය අඩු වේ. විදුලිය කප්පාදු වීමට මෙය හේතු වේ. විදේශ ආයොජකයන් අප රටේ සම්පත් භාවිත කරයි. එහි දී සම්පත් පරිභෝජනය සීමිතව කළ යුතු අතර අසීමිත පරිහරණය නුසුදුසු වේ. ආයෝජකයන් රැගෙන එන යල්පැන ගිය නුසුදුසු තාක්ෂණය සහ සංවර්ධිත රටවල ප්‍රතික්ෂේපිත තාක්ෂණය පරිහරණය මගින් පරිසරය තව තවත් දූෂණය වේ. පරිසරය සංවර්ධනය නොවී ආර්ථික සංවර්ධනයක් සිදු නොවේ.

ඉන්දියාවේ බෝපාල් සිදුවීම මීට කදිම නිදසුනකි. විෂ වායුව මගින් මිනිස් ජීවිත විනාශ වූ අතර විශාල භූමි භාගයක් ද විනාශ වියග ආයෝජකයා විසින් සිදු වූ වරදට වන්දි ගෙවනු ලැබුවත් තව දුරටත් එහි අතුරු ප්‍රතිඵල එම ප්‍රදේශය ආශ්‍රිතව දැකිය හැකිය. මීට සමාන සිදුවීම් රැසක් විදේශ ආයෝජන හේතුවෙන් ශ්‍රී ලංකාව තුළ උද්ගතව පවතී.

තිරසාර සංවර්ධනය හා පරිසරය අතර වෙන් කළ නොහැකි අන්‍යෝන්‍ය සබඳතාවක් තිබේ. මන්ද පරිහානියට පත් වන පරිසරයක් මත තිරසාර සංවර්ධනයක් අත්පත් කර ගත නොහැකිය.

ක්ෂය වන සම්පත් සමබරව පරිභෝජනය කිරීමේ අවශ්‍යතාව අවබෝධ කරගත යුතු වේ. එසේ නොවුනහොත් එනම් සැපයීමේ ප්‍රමාණය ඉක්මවා සම්පත් පරිභෝජනය කළ විට ඒවා ඉක්මනින් නාස්ති වීම හා අවසන් වීම සිදු වේ. ජලය මෙලෙස ක්ෂය වන සම්පතක් නොවුවත් එය යළි යළිත් ඇති වන්නක් වුවත් වාර්ෂිකව සැපයිය හැකි ජල විදුලිබල ප්‍රමාණය, අදාළ ජලාශවලට ලැබෙන

ජල ප්‍රමාණය මත රඳා පවතින බැවින් තිරසාර ජල සැපයුමක් සඳහා පරිසරය ආරක්ෂා කිරීම ඉතා වැදගත් වේ. එසේම, පරිසරයේ දැරීමේ ධාරිතාව තුළ අපද්‍රව්‍ය බැහැර කිරීමට ද වගබලා ගත යුතුය. අසීමාන්තික ලෙස අපද්‍රව්‍ය බැහැර කළහොත් එමගින් ගෝලීය වශයෙන් මිනිසාට අහිතකර බලපෑම් එල්ල විය හැකිය. එනම් වායුගෝලය උණුසුම් වීමෙන්, ඕසෝන් ස්ථරයට හානි වීම මගින් මිනිසාට මහත් බලපෑම් සිදු විය හැකි බව පරිසරවේදීන් පෙන්වා දෙයි. මෙනිසා ආර්ථික සංවර්ධනය පමණක් සැලකිල්ලට ගෙන පරිසරය දූෂණය වීමට ඉඩ හළහොත් ඉන් සිදුවන්නේ සංවර්ධනය අඩපණ වීමක් පමණි.

විදේශ ආයෝජන හා තරඟකාරිත්වය අතර ඇති සම්බන්ධතාව

වෙළඳපොළ තුළ තරඟකාරිත්වය යනුවෙන් අදහස් වෙන්නේ, වෙළඳ සමාගම් (ආයතන / වෙළෙන්දන්) සිය භාණ්ඩ සහ නිෂ්පාදන සඳහා සාධාරණ හෝ අසාධාරණ කුමන හෝ මාර්ගයකින් පාරිභෝගිකයා දිනා ගැනීම සඳහා ඇති තරඟ කාරිත්වයයි. අන් අතට වෙළඳපොළ වෙත පහසුවෙන් ප්‍රවේශ වීමට ඇති හැකියාව වෙළඳපොළ තුළ ඔවුන් සම්බන්ධයෙන් පවතින විවෘතභාවය මින් අදහස් වේ. ඒ අනුව තරඟකාරිත්ව හෙවත් සංඝති විරෝධී (anti trust) නීතිවලින් අදහස් වන්නේ වෙළඳපොළ තුළ පවතින වෙළඳ සමාගම්, ආයතන හා වෙළෙන්දන් සිය පිළිවෙත් තරඟකාරිත්වයට එරෙහි වන ආකාරයෙන් පවත්වාගෙන නොයන බවට වගබලා ගැනීමයි.

ලෝකය පුරා පැතිරගත් වැදගත් ආර්ථිකමය වෙනස්වීම් හේතුවෙන් තරඟකාරීත්වය කෙරෙහි විශාල අවධානයක් යොමුව ඇත. 90 දශකය පමණ වන විට රටවල් 4080 දක්වා ප්‍රමාණයක් තරඟකාරිත්වය හා අදාළව දේශීය නීතීන් පැනවීමට පියවර ගැණින. 1987 දී ශ්‍රී ලංකාවත් 1987 අංක 1 දරන සාධාරණ වෙළඳ කොමිෂන් සභා පනත (Fair Trading Commission Act) නමින් දේශීය ව්‍යවස්ථාවක් පැනවීය. මෙම පනතේ ප්‍රධාන අරමුණ වන්නේ පාරිභෝගිකයන්ව සූරාකෑම වැළැක්වීමයි. එනම් ඒකාධිකාරය හා මිල වැඩි වීම මර්දනය කිරීමට ප්‍රමාණවත් නීති නොමැති වුවහොත් එමගින් ජීවන වියදම ඉහළ යාම සහ බඩු මිල පාලනය කිරීමට නොහැකි වේ. නමුත් මෙම පනත යටතේ පිහිටවූ සාධාරණ

වෙළඳ කොමිසමට හෝ අභ්‍යන්තර වෙළඳ දෙපාර්තමේන්තුව යන ආයතන දෙකට කූට වෙළඳුන් හා නිෂ්පාදකයින් පාලනය කිරීමට හෝ හැසිරවීමට ප්‍රමාණවත් බලයක් නොවූ බැවින් පාරිභෝගික ආරක්ෂාව තහවුරු කරලීම සඳහා උපරිම බලතල සහිතව 2003 ජනවාරි 09 වන දින පාරිභෝගික ආරක්ෂණ අධිකාරී පනත (Consumer Affairs Authority Act) පනවන ලදී. මෙහි දී සාධාරණ වෙළඳ කොමිසම හා අභ්‍යන්තර වෙළඳ දෙපාර්තමේන්තුව ඒකාබද්ධ කොට පාරිභෝගික ආරක්ෂණ අධිකාරියක් පිහිටුවනු ලැබීය. මෙම ආයතනය මගින් පාරිභෝගික ජනතාව ආරක්ෂා කිරීමේ අරමුණින් විශාල මෙහෙයක් සිදු කිරීම අපේක්ෂා කරයි. මෙම පනත යටතේ වෙළෙඳ ඒකාධිකාරයන් පවත්වාගෙන යාම වලක්වාලනු ලැබේ. අධිකාරිය අනුමැතිය ලබා දුන්නොත් පමණක් භාණ්ඩ මිල වැඩි කළ හැකි අතර ඊට අවශ්‍ය හේතු සාධක නිෂ්පාදකයා විසින් අධිකාරියට ඉදිරිපත් කළ යුතු වේ.

මින් පෙනී යන්නේ අසාධාරණ ලෙස හිතුමතේ භාණ්ඩයක මිල වැඩි කළ නොහැකි බවයි. නමුත් සාධාරණ හේතුවක් මත මිල වැඩි කරන්නේ නම් සති හතරකට කට පෙර ඒ බව ඉහත අධිකාරියට දැනුම් දී ඊට පදනම් වන හේතු සාධක ඉදිරිපත් කර අධිකාරියේ අනුමැතිය ලබා ගැනීම මේ සඳහා අවශ්‍ය වේ. පාරිභෝගිකයා අපහසුතාවට ලක් කෙරෙන වැරදි සම්බන්ධයෙන් නව නීතිය යටතේ වැඩි දඬුවම් ලබා දෙනු ලැබේ. එනම් දඩ මුදල් පැනවීම, සිරදඬුවම් ලබා දීම හා දේපල අහිමි කිරීම පවා මේ යටතේ දඬුවම් වශයෙන් ලැබේ.

මෙම පනත යටතේ පාරිභෝගිකයා පමණක් නොව සාධාරණ වෙළඳාමේ නියුතු වෙළෙන්ඳා හා නිෂ්පාදකයා ද ආරක්ෂා කිරීමට පියවර ගෙන තිබේ. එනම් සාධාරණ නොවන වෙළඳ කටයුතු ලෙස සැලකෙන මිල වෙනස් කිරීම්, නිෂ්පාදන තරඟකාරිත්වය, අසාධාරණ වෙළඳ දැන්වීම්, අනුකරණයන් වැනි දේ පාලනය කිරීමට මෙහිලා පියවර ගනු ලැබේ.

තරඟකාරිත්වයේ ප්‍රයෝජන

තරඟකාරිත්වය හේතුවෙන් වෙළඳුන් කාර්යක්ෂම ලෙස කටයුතු කිරීමටත් අඩු මිලකට හොඳ නිෂ්පාදන ලබා දීමටත් පෙළඹෙයි. මන්ද තරඟකාරිත්වයෙන් යුත් වෙළඳපොලක් තුළ රැඳී සිටීමට හැකියාව ලැබෙන්නේ එලෙස කටයුතු කරන අයකුට පමණි. මිල පහළ යාම හේතුවෙන් පාරිභෝගිකයාගේ මිලදී ගැනීමේ හැකියාව ද ඉහළ යයි.

තරඟකාරිත්වය, සාධාරණ තරඟකාරිත්වය (Fair competition) සහ අසාධාරණ තරඟකාරිත්වය (Unfair competition) යනුවෙන් කොටස් දෙකකි. සාධාරණ තරඟකාරිත්වය යනු වෙළඳුන් වඩා හොඳ තාක්ෂණය අනුගමනය කිරීමෙන්, ගුණාත්මක භාණ්ඩ හා සේවා සැපයීමෙන් සාධාරණ මිලක් අය කිරීමෙන් සිදු කරන තරඟකාරිත්වයයි. අසාධාරණ තරඟකාරිත්වය යනු වෙළඳපොළේ සිටින අනිකුත් වෙළෙන්ඳන් නෙරපා හැරීමට භාණ්ඩ වල මිල එහිලා වන වියදමට වඩා අඩුවෙන් නියම කිරීම, අන් නිෂ්පාදන පහත් කරමින් සිදු කරන අසාධාරණ වෙළඳ දැන්වීම් වැනි අසාධාරණ වෙළඳ පිළිවෙත් අනුගමනය කරමින් සිදු කරන තරඟකාරිත්වයයි.

තරඟකාරිත්ව ප්‍රතිපත්තිය හා තරඟකාරිත්ව නීතිය **(Competition Policy and Law)**

තරඟකාරිත්ව නීතියේ අරමුණු වන්නේ යම්කිසි වෙළඳාමක් සාධාරණ ලෙස පවත්වා ගෙන යාමට අවශ්‍ය පදනම දැමීමයි. එක් එක් සමාගම් තමන්ට ඇති ආර්ථික බලය හෝ ශක්තිය සහ වෙනත් හේතු පදනම් කරගෙන වෙළඳපලේ බලය තහවුරු කර ගනියි නම් එය පාලනය කළ යුතුයි. මන්ද වෙළඳාමක් පාලනයකින් තොරව පවත්වාගෙන යාමට ඉඩ දුන්නොත් එක් එක් සමාගම් ජනතාව පීඩාවට පත් කරන්නට ඉඩ ඇත. එසේම වෙළඳුන් එකතු වී මිල ගණන් තහවුරු කරගෙන මිල ඒකාධිකාරයක් තුළින් ජනතාවට අහිතකර, පීඩාකාරී තත්ත්වයක් නිර්මාණය කළ හැකිය. නිදසුනක් ලෙස කතිපයාධිකාරී වෙළඳාම දැක්විය හැකිය.

වෙළඳ ආයතනයන්හි හැසිරීම හා ව්‍යාපාරයන්හි ව්‍යුහය කෙරෙහි සෘජුවම බලපාන අයුරින් රජයක් විසින් අනුගමනය කරනු

ලබන ක්‍රියාදාමන් තරඟකාරිත්ව ප්‍රතිපත්ති යන්නෙන් අදහස් වෙයි. එමනිසා තරඟකාරිත්ව ප්‍රතිපත්ති යන්නට රජය විසින් අනුගමනය කරනු ලබන ආර්ථිකමය ප්‍රතිපත්ති එනම් දේශීය හෝ ජාතික වෙළඳපළ තුළ තරඟකාරිත්වය වර්ධනය කිරීම සඳහා ආර්ථිකමය වශයෙන් සිදු කරන ලිහිල් කිරීම් සහ පුද්ගලීකරණය වැනි දෑ මීට අයත් වේ.

තරඟකාරිත්ව නීතිය යන්නෙන් වෙළඳ ආයතන විසින් තරඟකාරිත්වයට එරෙහිව කරනු ලබන වෙළඳ පිළිවෙත් නවතා දැමීමෙන් අදහස් වේ. එනම් සාධාරණ වෙළඳාම සුරක්ෂිත කිරීම සඳහා වන නීති මෙමගින් අදහස් කෙරේ. වෙනත් වචනින් පැවසුවහොත් තරඟකාරිත්ව ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නීතිය ව්‍යවස්ථාවක් තුළ අන්තර්ගත කොට එම නීතිය අධිකරණය ලවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පදනම සැකසීමයි.

රටක තරඟකාරිත්ව ප්‍රතිපත්ති පදනම් වන සාධක

1. පාරිභෝගික සුභසාධනය - Consumer Welfare

වෙළඳපළ වෙත යම් නිෂ්පාදනයක් සඳහා සමාගම් කිහිපයක් පැමිණි විට එකම භාණ්ඩය සම්බන්ධයෙන් තරඟකාරීත්වයක් බිහි වේ. එවිට ඒ ඒ සමාගම් විසින් තරඟකාරිත්වය මත හොඳ ප්‍රමිතියෙන් යුත් භාණ්ඩ අඩු මිලට පාරිභෝගිකයා වෙත ලබා දේ. එවිට එක පුද්ගලයකු හෝ ආයතනයක් සතු වූ වෙළඳ ඒකාධිකාරය බිඳවැටෙන අතර පාරිභෝගිකයාට සහන සැලසේ.

2. මහජන (පොදු) යහපත - Public Interest

යම් අවස්ථාපිත සාධක මත වෙළඳපොල තුළ තරඟකාරිත්වය ඇති වන ආකාරයේ පියවර ගැනීමෙන් අනිසි ප්‍රතිඵල උද්ගත වේ නම් පොදු මහජන යහපත සැලකිල්ලට ගෙන වෙළඳ ඒකාධිකාරය ඇතිවන ආකාරයේ පියවර ගැනීමට පෙළඹේ. එනම් රැකියා ආශ්‍රිතව ඇතිවන බලපෑම, සංස්කෘතිකමය වශයෙන් යම් වෙළඳාමක් පවත්වාගෙන යාමේ වැදගත්කම සැලකිල්ලට ගෙන රටකට මෙවැනි පියවර ගත හැකිය. නිදසුනක් ලෙස ''A'' සමාගම පරිගණක නිෂ්පාදන ආයතනයක් වශයෙන් රැකියාවන්

10,000 ක් සපයා දී ඇත. එය ලංකාවේ ඇති එකම පරිගණක නිෂ්පාදන ආයතනය නම් ඊට කැමති ආකාරයෙන් වෙළඳපොළ පාලනය කළ හැකිය. මෙනිසා ආධිපත්‍යය වැලැක්වීම සඳහා විදේශ සමාගමක් ගෙන්වයි. මෙම සමාගම සේවකයන්, නව තාක්ෂණය, නව යන්ත්‍රෝපකරණ සමඟින් පැමිණියහොත් ''A'' සමාගමට යම් ආකාරයක තර්ජනයක් වේ. යම් අවස්ථාවල එය වැසීයාම පවා සිදු විය හැකිය. මෙහි දී එහි සේවයේ නිරත වන්නන්ගේ ක්‍රියාවන් අහිමි වී යා හැකිය. පොදු යහපත මත ආධිපත්‍යයට ඉඩ දීමට මෙවන් අවස්ථාවල දී රටකට හැකියාව ලැබේ.

තවද නිදසුනක් නම් 1991 දී බහු ජාතික සමාගමක් වන Uni Liver සමාගමේ ඉන්දියානු පාලිත සමාගමක් වන හින්දුස්ථාන් ලීවර් සමාගම, ඉන්දියාවේ Tomco සමාගම සමඟ ඒකාබද්ධ විය. මෙම ඒකාබද්ධ වීමෙන් මොවුන් වෙත සබන් වෙළඳපොළේ 77% ක කොටසක් හිමි වූ අතර 99% ක් රෙදි පිරිසිදු කරන ද්‍රව්‍ය සැපයුවේය. මෙමගින් ඉන්දියානු සබන් නිෂ්පාදන සමාගම්වලට පහර වැදිණි. නමුත් ඉන්දීය රජය මෙහි දී මෙම ඒකාබද්ධ වීමට ඉඩ ප්‍රස්ථාව ලබා දුන්නේ පොදු යහපත යන සංකල්පය පදනම් කර ගෙනය. ඒ අනුව මෙම ඒකාබද්ධ වීම මත ක්‍රියා රාශියක් බිහි වූ අතර ඒකාබද්ධ වීමට ප්‍රථම Tomco සමාගම නිසි පාලනයක් නොමැති අකාර්යක්ෂම සමාගමක් විය. නමුත් මෙය හින්දුස්ථාන් ලීවර් සමාගම සමඟ ඒකාබද්ධ වී Tomco සමාගම දියුණු වූ අතර මෙම කරුණු මත ඉන්දීය රජය මෙම ඒකාබද්ධ වීමට අවසර ලබා දෙන ලදී.

2. කැනේඩියානු Havilland නමැති සමාගමක් ATR නම් වූ යුරෝපීය සමාගමක් සමඟ ඒකාබද්ධ විය. මීට යුරෝපීය රජය විරුද්ධ වුවද කැනේඩියානු රජය මෙයට ඉඩ ලබා දෙන ලදී. එයට හේතුව වූයේ එම කැනේඩියානු සමාගම පාඩු ලබන, අකාර්යක්ෂම ආයතනයක් වූ බැවින් එම ඒකාබද්ධ වීම නොසිදුවුනේ නම් එය වසා දමන තත්ත්වයක පැවතිණ. එබැවින් ක්‍රියාමය වශයෙන් උද්ගත විය හැකි අනිසි ප්‍රතිඵල සලකා බලා අවශ්‍ය ඉඩ ප්‍රස්ථාව සලසා දුනි.

3ග සමස්ත පද්ධතියේම සිදුවන සුභසාධනය - Overall aggregate Welfare - (Economic Theory)

මෙහි දී සමස්ත පද්ධතියේ සුභසාධනය සිදු වනුයේ තරඟ කාරීත්වයට ඉඩ දීම මගින් ද නැතිනම් ඒකාධිකාරයට ඉඩ දීම මගින් ද යන්න සොයා බැලේ. සංස්කෘතිකමය වටිනාකම් ආරක්ෂා කර ගැනීමට රජයක් විසින් ගනු ලබන පියවරවල දී මෙම තත්ත්වය ප්‍රයෝජනයට ගනී.

4. නිෂ්පාදකයාගේ යහපත - Producer Welfare

සමහර රාජ්‍යයන් තරඟකාරිත්වයට එරෙහිව වන ඒකාබද්ධ වීම් සහ අත්පත් කර ගැනීම් සඳහා අවසර ලබා දෙන අතර එහිලා දිරිමත් කෙරේ. මන්ද දේශීය වශයෙන් පවතින සමාගම් ව්‍යාප්ත වූ විට ඒවාට ගෝලීය වශයෙන් තරඟ කිරීමේ හැකියාව ලැබේ. මන්ද දේශීය වශයෙන් තරඟකාරිත්වයට ඉඩ නොදීම මත බාධා ඇති විය හැකි බැවිණි.

5. බාහිරව සිදුවන බලපෑම්වලට අනුකූල වීමක් නැතිනම් ප්‍රතික්‍රියා දැක්වීමක් වශයෙන් - Response to Outside Pressure

මෙහි දී එක් රටකට තවත් රටක් සම්බන්ධයෙන් තරඟ කාරීත්ව රීතීන් දැඩි ලෙස අනුගමනය කරන ලෙස බලපෑම් කළ හැකිය. එමෙන්ම රටකට තවත් රටක පවතින නීතින් පළමු රටේ අවශ්‍යතාවලට ගැළපෙන අයුරින් වෙනස් කරන ලෙස බලපෑම් කළ හැකිය.

නිදසුනක් ලෙස ඇමරිකා එක්සත් ජනපදය ජපානයට වෙළඳපළ මිල සම්බන්ධයෙන් තරඟකාරීත්ව ප්‍රතිපත්ති සකසා ගන්නා ලෙස බලපෑම් කරන ලදී. මෙහි දී ඇමරිකාවේ නීතිය වූයේ යම් භාණ්ඩයක් එක් රටක එක මිලකටත් තවත් රටක තවත් මිලකටත් තිබිය නොහැකිය යන ප්‍රතිපත්තියයි. ජපානයේ එවැනි නීතියක් නොමැති අතර එම රටේ එක නගරයක එකම භාණ්ඩයකට එක් මිලකුත් තවත් නගරයක වෙනත් මිලකුත් නියම කිරීමට හැකිය. එක්තරා අවස්ථාවක ජපානය ඇමරිකානු වෙළඳපොලේ විද්‍යුත් උපකරණ විකිණීමේ දී ඒවා සම්බන්ධයෙන් ජපන් වෙළඳපොළේ

පැවති මිලට වඩා අඩු මිලකට විකුණන ලදී. එමගින් ඇමරිකන් වෙළඳපොළේ විද්‍යුත් උපකරණ විකිණීමේ කාර්‍යය අපහසු විය. මෙය ජපාන නීතියට අනුව වැරැද්දක් නොවුනත් ඇමරිකන් නීතියට අනුව වැරදි සහගත වේ. එම නිසා ඇමරිකාව මෙම තත්ත්වය සම්බන්ධයෙන් ජපානයට බලපෑම් කරන ලද අතර එම තත්ත්වය ජපානය විසින් පිළිගන්නා ලදී.

මේ ආකාරයට සෑම රටක්ම පාරිභෝගිකයාගේ ආරක්ෂාව සලසා දීම සඳහා සහ සාධාරණ හා නිදහස් තරගකාරිත්වයක් සාක්ෂාත් කිරීම සඳහා තරඟකාරීත්ව ප්‍රතිපත්තීන් අනුගමනය කිරීමට වගබලා ගත යුතු වේ. නමුත් රාජ්‍යයෙන් රාජ්‍යයකට ආර්ථික, දේශපාලනමය සහ ඓතිහාසික සාධක වෙනස් වන බැවින් තරඟකාරිත්ව ප්‍රතිපත්තීන්හි ස්වභාවය සහ රටාව සකස් කිරීමේ දී මෙම සියලුම කාරණා සැලකිල්ලට ගත යුතුය. මෙනිසා රටක තරඟකාරිත්ව ප්‍රතිපත්තීන්හි සාර්ථකභාවයක් දැකීමට නම් එම ප්‍රතිපත්ති සමස්ත ආර්ථිකයේ පවතින අනෙකුත් ප්‍රතිපත්තින් සමඟ සම්බන්ධිත විය යුතු අතරම ඒවාට අන්‍යෝන්‍ය වශයෙන් ගැලපිය යුතු මෙන්ම තරඟකාරීත්ව නීතිය ද එම ප්‍රතිපත්තීන්ට ගැළපෙන එහි පවතින අඩුපාඩු සම්පූර්ණ කරන ස්වභාවයේ නීති පද්ධතියක් විය යුතුය.

වෙළඳපොළ තුළ ඇති තරඟකාරිත්වයේ විවිධ අදියරයන්

පූර්ණ තරඟකාරීත්වය (Perfect Competition)

මෙවන් සර්ව සම්පූර්ණ තරඟකාරිත්වයක් ඇතිවීම සඳහා පැවතිය යුතු කොන්දේසි :

1. යම්කිසි නිෂ්පාදනයක් හෝ සේවාවක් සඳහා වෙළඳපොළ තුළ විශාල වශයෙන් වෙළඳුන් සහ මිලදී ගනු ලබන්නන් සිටිය යුතුයි.
2. මිලදී ගන්නාට නිවැරදි තීරණයක් ගැනීමට හැකි වන පරිදි යම් නිෂ්පාදනයක් හෝ සේවාවන් සම්බන්ධ සම්පූර්ණ තොරතුරු ඔහු වෙත ලැබිය යුතුය.

3. එකම ආකාරයේ භාණ්ඩ සියලුම නිෂ්පාදකයින් විසින් නිපදවිය යුතුය.
4. විවෘත ලෙස වෙළඳපොළ තුළට පිවිසීමට හෝ ඉන් පිටව යාමට හැකියාවක් තිබිය යුතුයි.

පූර්ණ තරඟකාරීත්වයේ ප්‍රධාන ලක්ෂණ දෙකක් පවතී.

1. ඉල්ලුම හා සැපයුම මත තීරණය වන එකම මිලක් පමණක් වෙළඳපොළ තුළ පවතී.
2. කිසිම නිෂ්පාදකයකුට වෙළඳපොළ තුළින් තීරණය වන මිල හැර වෙනත් කිසිදු මිලක් කිසිදු නිෂ්පාදනයක් සඳහා නියම කළ නොහැක.

පූර්ණ ඒකාධිකාරිත්වය (Perfect Monopoly)

මේ යටතේ එක් ආයතනයක් හෝ ඉතා සුළු ප්‍රමාණයක් මගින් වෙළඳපොළ මුළුමනින්ම පාලනය කරයි. එම නිසා සම්පූර්ණ වෙළඳපොළට හෝ එහි විශාල කොටසක් එක් තනි නිෂ්පාදකයෙක් විසින් මෙහෙයවනු ලබයි. මේ යටතේ වෙළඳපොළ තුළට පිවිසීමට ඇති අවකාශයන් ඉතාමත් විරල වේ. එනම් ඒකාධිකාරය මත පදනම් වන වෙළඳපොලක්. එසේ වී ඇත්තේ එම වෙළඳපොළ තුළට පිවිසීමට වැය කළ යුතු මුදල් ප්‍රමාණය ඉතා විශාල වන බැවින් විය හැකිය. නිදසුනක් ලෙස අහස් යානා ආශ්‍රිත ව්‍යාපාරයක් පිහිටුවීම සඳහා විශාල මුදලක් වැය වන බැවින් මෙම අංශය සම්බන්ධයෙන් සෑම විටම ඒකාධිකාරයක් ක්‍රියාත්මක වේ. මේ යටතේ ඒකාධිකාරී නිෂ්පාදකයා විසින් භාණ්ඩයේ මිල තීරණය කරන අතර භාණ්ඩයේ මිල, ගුණාත්මක බව සහ සැපයිය යුතු ප්‍රමාණය ද තීරණය කරනු ලබයි.

කතිපයාධිකාරි වෙළඳපොළ [Oligopoly / Oligopolistic Market]

මෙවන් වෙළඳපොළක් තුළ සීමිත නිෂ්පාදකයන් සංඛ්‍යාවක් දක්නට ඇත. මෙම නිෂ්පාදකයන් එක් එක් විශේෂිත වෙළඳ නාමයන් යටතේ භාණ්ඩ විකුණනු ලබයි. තමන්ගේ වෙළඳ නාමය

ජනප්‍රිය කරවීම සඳහා විශාල වශයෙන් වෙළඳ දැන්වීම් ප්‍රචාරය කරනු ලබයි. එක් නිෂ්පාදකයෙක් අන් නිෂ්පාදනයන්ගේ ක්‍රියාවන් මත සිය ක්‍රියාවන් හැඩගස්වා ගනී. සබන් සහ රෙදි සෝදන ද්‍රව්‍ය ආශ්‍රිත වෙළඳපොලේ මෙම තත්ත්වය පහසුවෙන් දැකිය හැකිය.

ඒකාධිකාරී තරඟය - භාගික/අර්ධ ඒකාධිකාරය [Monopolistic Market]

සර්ව සම්පූර්ණ තරඟය සහ ඒකාධිකාරය යන දෙකෙහිම ලක්ෂණ මෙහි දක්නට ඇත. මෙහි දී වෙළඳපොළට පිවිසීමට ඇති බාධක ඉතාමත්ම විරලය. ගැණුම්කරුවන් හා වෙළෙන්දන් යන දෙවර්ගයම සුලබව දක්නට ඇත. එක් එක් නිෂ්පාදකයා තමා විසින් සපයනු ලබන නිෂ්පාදනයේ හෝ භාණ්ඩයේ විශාල වශයෙන් වෙනස්කම් පවත්වාගෙන යනු ලබයි. මෙම වෙනස්කම් මත නිෂ්පාදකයා තමා සපයන භාණ්ඩය ආශ්‍රිතව ඒකාධිකාරීත්වයක් ද පවත්වාගෙන යනු ලබයි. පරිගණක ආශ්‍රිත වෙළඳපොළෙහි මෙම තත්ත්වය දැකිය හැකි වේ.

රටක් තුළ තරඟකාරිත්ව නීතීන් බිහි නොවීමට හේතු

තවමත් බොහෝ රාජ්‍යයන් සතුව තරඟකාරිත්ව නීතින් දක්නට නොමැත. මෙහිලා බොහෝ දුරට හේතු දෙකක් බලපා ඇත.

1. තරඟකාරිත්ව නීතීන් රටකට හඳුන්වාදීමේ අවශ්‍යතාව නොදැන සිටීම හෝ එහිලා අවබෝධයක් නොමැතිකම සහ එවන් නීති සංග්‍රහිත කිරීමට හෝ හඳුන්වා දීමට අවශ්‍ය පසුබිම හෝ වාතාවරණය රට තුළ නොමැති වීම.
2. තරඟකාරීත්ව නීති අනවශ්‍ය යැයි සිතීම එම නීති හඳුන්වාදීම සම්බන්ධයෙන් විරෝධතාවක් රට තුළම හට ගැනීම. මෙවන් විරෝධතාවක් නීති සම්පාදකයන්ගෙන් නැතිනම් දේශීය වෙළඳුන්ගෙන් හටගත හැකිය.

තරඟකාරීත්වයක් හට ගැනීම සඳහා අවශ්‍ය සාධක

1. විවෘත වෙළඳ ප්‍රතිපත්තියක් තිබිය යුතුයි (Open Trade Policy)

තරඟකාරිත්වයක් ක්‍රියාත්මක වීමට නම් රටක් අනිවාර්යයෙන්ම විවෘත වෙළඳ ප්‍රතිපත්තියක් අනුගමනය කළ යුතුයි. මක් නිසාද යත් විවෘත වෙළඳ ප්‍රතිපත්ති නිසා ආනයනයට ඉඩ ප්‍රස්තාව සැලසෙන බැවින් දේශීය වෙළෙන්දන්ට ආනයන හා තරඟ වැදීමට සිදු වේ. මේ නිසා තරඟකාරීත්වයක් ඉබේම නිර්මාණය වේ. කෙසේ වෙතත් බොහෝ රටවල සමහර අංශ මෙසේ විවෘත වී නොමැත. එමනිසා ආනයන සමඟ තරඟ වැදීමේ අවශ්‍යතාවක් නැත.

මේ නිසා මෙලෙස විවෘතව නොමැති නම් ආනයනය සඳහා තරඟ වැදීමක් ද උද්ගත නොවේ. මෙලෙස විවෘත ආර්ථිකයක් තිබූ පමණින් තරඟකාරීත්වයක් නිර්මාණය වීම හෝ නිෂ්පාදකයින් හා පාරිභෝගිකයන් අතර ලාභ හෝ ආදායම සාධාරණව බෙදී යාම අනිවාර්යෙන්ම සිදු නොවේ. මන්ද යත් විශාල වශයෙන් විවෘත ආර්ථිකයක් පවතින රාජ්‍යයන්හි පවා සමහර අංශ තරඟකාරීත්වය කෙරෙහි විවෘත නොවීමටත් සහ රජය විසින්ම සමහර අංශ තුළ තරඟකාරීත්වයට එරෙහිව සිදුවන ක්‍රියා සඳහා සහාය දැක්වීමක් දක්නට ඇත.

තරඟකාරීත්වය ක්‍රියාත්මක වීම සඳහා තරඟකාරී ප්‍රතිපත්තියක් ප්‍රමාණවත් වේද නැත්නම් එහිලා නීතියක් අවශ්‍ය වේද?

සමහරු පෙන්වාදෙන පරිදි රටකට එම රටේ ආර්ථිකය තුළ තරඟකාරිත්ව සංස්කෘතියක් පසුබිමක් හෝ වටපිටාවක් නිර්මාණය කිරීම සඳහා තරඟකාරීත්ව නීති පද්ධතියක් පැවතීම අවශ්‍ය නොවේ. නමුත් පවතින තරඟකාරීත්ව ප්‍රතිපත්තීන්ට නීතිමය භාවයක් ලබා දීම සඳහා තරඟකාරීත්ව නීතීන් ඉතාමත් වැදගත් වේ. එවිට එහි ස්ථිර භාවයක් (consistency) හා පාරදෘශ්‍ය භාවයක් (transparency) දක්නට හැකිය.

මැලේසියාවේ උද්ගතව පැවති තත්ත්වය නිසුනක් සේ දැක්විය හැකිය. විවෘත වෙළඳ ප්‍රතිපත්තියක් පවතින මැලේසියාවේ ආර්ථිකයේ බොහෝ අංශ තුළ විශාල වශයෙන් තරඟකාරිත්වයක් ක්‍රියාත්මක වේ. කෙසේ වෙතත් අනිසි ලෙස සැලසුම් කරන ලද පෞද්ගලීකරණ වැඩ පිළිවෙලක් දක්නට ඇති අතර ඉතාමත්ම වැදගත් අංශ සම්බන්ධයෙන් ද මෙම තත්ත්වය දැකිය හැකිය. රාජ්‍යය

අංශය සතුව පැවති ඒකාධිකාරයන් ඒ අන්දමට පෞද්ගලික අංශයට පවරා දී පෞද්ගලික ඒකාධිකාරයන් බොහෝ අංශ තුළ ගොඩනැගී ඇත. මේ නිසා අධික මිල නැංවීම, භාණ්ඩවල ගුණත්වය පිරිහීම වැනි බොහෝ ප්‍රශ්නවලට පාරිභෝගිකයන්ට මුහුණ දීමට සිදුව ඇත. නමුත් මැලේසියාවේ තරඟකාරිත්ව නීති පද්ධතියක් නොමැති නිසා මේ ආකාරයට අළුතින් පෞද්ගලීකරණය කරන ලද අංශ තුළ තරඟකාරිත්වය වර්ධනය කිරීම සඳහා අවශ්‍ය නීත්‍යනුකූල පියවර ගැනීමට සුදුසු ආයතනයක් නොමැත. මේ නිසා තරඟකාරිත්වය නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට නම් එනම් වෙළඳපොළ තුළ ඇති අසමානභාවයන් නැති කොට තරඟකාරිත්වය වර්ධනය කිරීම සඳහා සුදුසු ආයතනයක් තිබීම සහ එහිලා යෝග්‍ය නීති පද්ධතියක් තිබීම ඉතාමත්ම අවශ්‍ය වේ.

තරඟකාරීත්වය නිසා උද්ගත විය හැකි අනිසි ප්‍රතිඵල

1. විදේශීය සමාගම්වලට මෙමගින් දේශීය සමාගම් පවරා ගැනීමට ඉඩ ප්‍රස්ථාව සැලසීම

එනම් එතෙර සමාගම් හා තරඟවදිමින් වෙළඳපොළේ රැඳී සිටීමට දේශීය සමාගම් සතු හැකියාව රඳා පවතින්නේ එම සමාගම් සතුව පවතින ශක්තිය මතයි. එම නිසා එම සමාගම් ආරක්ෂා කිරීම සඳහා යම් පියවර තරඟකාරීත්ව නීතීන් මගින් ගනු ලබන්නේ නම් මිස යම් යම් තරඟකාරීත්වයට එරෙහි පිළිවෙත් අනුගමනය කරමින් විදේශ සමාගම් විසින් දේශීය වෙළඳපොළ අත්පත් කර ගැනීම වළකාලිය නොහැක. බොහෝ විදේශීය සමාගම්වලට ඔවුන් සතු ආර්ථික ශක්තිය මත, මනා කළමනාකාරිත්වය සහ නිෂ්පාදන ක්‍රියාවලියේ ඇති ඉහළ කාර්යක්ෂමතාව හේතු කොට ගෙන ඒවාට දේශීය වෙළෙන්ඳන්ට වඩා අඩු මිලකට භාණ්ඩ සැපයිය හැකිය. මෙලෙස බැලූ විට විදේශ සමාගම්වල පැමිණීම පාරිභෝගිකයාගේ සුභසාධනය සඳහා හේතු වේ. නමුත් විදේශ සමාගම් විසින් දේශීය වෙළෙන්ඳන්ව වෙළඳපොළෙන් නෙරපා වෙළඳපොළේ ඔවුන් සතු කොටස අත්පත් කර ගැනීම සඳහා කෘත්‍රිම ලෙස භාණ්ඩවල මිල අඩු කිරීම ද දැකිය හැකි කරුණකි. එමගින් පසුව වෙළඳපොළ තුළ ඒකාධිකාරී තත්ත්වය තහවුරු කොට ගෙන ඉහළ මිලක් අය කර

ගැනීමට ඔවුන්ට හැකියාව ලැබේ. එම නිසා අසාධාරණ තරඟ කාරීත්වය තුළින් දේශීය සමාගම් ආරක්ෂා කිරීමට පියවර ගත යුතු වේ.

2. දේශීය සමාගම් විශාල සමාගම් බවට පත්වීම වලක්වයි

සංවර්ධනය වෙමින් පවතින රටවල ඇති දැඩි තරඟකාරිත්ව රීතීන් මගින් පවරා ගැනීම් හා ඒකාබද්ධ වීම් (mergers and aquicitions) වලක්වාලීම තුළින් දේශීය සමාගම් වලට ගෝලීය වෙළඳපොළ තුළ බහු ජාතික සමාගම් හා තරඟවැදිය හැකි විශාල සමාගම් බවට පත්වීම වැලකිය හැකිය. එමනිසා දියුණු තරඟ කාරීත්ව නීතින් ඇති රටවල් ඒකාබද්ධ වීමක් හෝ පවරා ගැනීමක් තරඟකාරීත්වයට එරෙහි ද නැද්ද යන්න තීරණය කිරීමේ දී ඉන් සිදුවනුයේ අන්තර් ජාතික වෙළඳපොල වෙත පිවිසීම සඳහා මාර්ගය පාදා ගැනීමක් නම් එහිලා ඒකාබද්ධ වීම සඳහා ඉඩ සලසා දෙනු ලැබේ. නිදසුනක් ලෙස 2001 දී නවසීලන්තය එහි පැවති ප්‍රධානතම හා විශාලතම කිරි ආශ්‍රිත නිෂ්පාදනයේ යෙදුණු සමාගම් දෙකක් අතර ඒකාබද්ධ වීමට ඉඩ සලසා දෙනු ලැබුවා. එයට හේතුව වූයේ මෙම සමාගම් විදේශීය සමාගම් හා හොඳින් තරඟවැදින. එම නිසා එම තරඟකාරීත්වය පවත්වාගෙන යාම සඳහා මෙම එකතු වීම අවශ්‍ය විය. මේනිසා තරඟකාරිත්ව නීතින් ආශ්‍රිතව ඇති මෙම විරෝධතාව වලකා ගැනීම සඳහා එම නීතිය විධිමත් ලෙස සංගෘහිත කිරීම අවශ්‍ය වේ. එනම් ඒකාබද්ධ වීමක් හෝ වෙනත් තරඟකාරිත්වයට එරෙහි ක්‍රියාවක් නීත්‍යානුකූල ද නැද්ද යන්න විමසීම සඳහා අවශ්‍ය නීතිය පැහැදිලිව සංගෘහිත කිරීම තුළින් බොහෝ රටවල් තමන්ගේ රටවල ඇති කුඩා, මධ්‍යම හා එතරම් ශක්තිමත් නොවන ව්‍යාපාර (micro enterprises) රටක ආර්ථික සංවර්ධනය සඳහා විශාල මෙහෙවරක් කළ හැකි නිසා රජයේ සහාය නොමැතිව එම ව්‍යාපාරවලට ගෝලීය වෙළඳපොළ තුළ තරඟවැදිය නොහැකි බව වටහාගෙන ඇත. එම නිසා ජාතික සංවර්ධන උපාය මාර්ගයන් ලෙසින් මෙම සමාගම්වලට තරඟ කාරිත්වයට එරෙහි වුවද දේශීය නීතිය යටතේ යම් විශේෂිත ව්‍යතිරේක සපයනු ලැබේ.

තරඟකාරීත්වය පිළිබඳ ශ්‍රී ලංකා නීති තත්වය

1977 ශ්‍රී ලංකා ආර්ථිකය තුළ නිදහස් වෙළඳ ආර්ථිකයක් බිහි විය. 1987 වන තෙක් තරඟකාරීත්ව ප්‍රතිපත්ති හෝ කාර්මික ප්‍රතිපත්ති බිහි නොවිණි. 1979 පාරිභෝගික ආරක්ෂණ පනත පැනවීය. එම පනතේ අරමුණ වූයේ ලිහිල්කරණයට ලක් වූ වෙළඳ ආර්ථිකයක් තුළ පාරිභෝගිකයා සූරාකෑමට ලක් නොවන බව සාක්ෂාත් කර ගැනීමයි. 1989 දී විධිමත් පෞද්ගලීකරණ වැඩපිළිවෙළක් ශ්‍රී ලංකාව තුළ හඳුන්වා දුනි. මෙම වැඩසටහනේ අරමුණ වූයේ තරඟකාරී වෙළඳ ආර්ථිකයක් බිහි කිරීම නොවේ. ඒ වෙනුවට මෙම වැඩසටහන කෙරෙහි වෙනත් කරුණු දෙකක් බලපෑවේය. එනම් අකාර්යක්ෂමභාවයට ලක්ව ඇති රාජ්‍ය අංශයට අවශ්‍ය මුදල් සොයා ගැනීම සහ අයවැය හිඟය පියවා ගැනීම සඳහා හා වෙනත් අවශ්‍ය අරමුණු මුදුන් පමුණුවා ගැනීමට අත්‍යවශ්‍ය මුදල් සොයා ගැනීමටයි.

1990 වන විට පෞද්ගලීකරණයට ලක් වූ අංශ තුළ නොයෙකුත් අයුතු වෙළඳ පිළිවෙත් සිදු වෙමින් පවතින බව පෙනී යන ලදි. එනම් වෙළඳුන් හා ආයතන සිය ආධිපත්‍යය වෙළඳපොළ තුළ අනිසි ලෙස ක්‍රියාත්මක කිරීම ආරම්භ කර තිබුණි. එමනිසා මේ අවස්ථාව වන විට සාධාරණ වෙළඳ කොමිසම සතු බලතල හා කාර්යභාරය ඉතාමත්ම වැදගත් විය. වෙළඳ ආර්ථිකයක් තුළ තරඟකාරී වෙළඳ වටපිටාවක් පැවතීම ඉතාමත් වැදගත් බව පෙනී ගිය නිසා ඒකාධිකාරයන් ඒකාබද්ධ වීම් හා අත්පත් කර ගැනීම් ඇතුළු අනෙකුත් තරඟකාරීත්වයට එරෙහි ක්‍රියාවන් මැඩපැවැත්වීම අත්‍යවශ්‍ය බව පෙනී ගියේය.

තරඟකාරීත්ව නීතීන් ක්‍රියාත්මක කරමින් වෙළඳපොළ තුළ කාර්යක්ෂමභාවය නංවාලීමට සාධාරණ වෙළඳ කොමිසම වෙත පැවරී ඇති කාර්යභාරය

1987 අංක 1 දරන සාධාරණ වෙළඳ කොමිසන් සභා පනත මගින් මෙම ආයතනය පිහිටුවන ලදී. 1970 දශකයේ මැද භාගයේ පිහිටුවන ලද ජාතික මිල පාලන කොමිසම අවලංගු කරමින් මෙම ආයතනය පිහිටුවන ලදී. මෙම පනතට සංශෝධනයක් හඳුන්වා දෙමින් 1990 අංක 46 දරන කාර්මික ප්‍රවර්ධන පනත (Industrial Promotions Act) මගින් සාධාරණ වෙළඳ කොමිසන් සභා පනතේ 18 සිට 26 දක්වා වූ වගන්ති අවලංගු කරනු ලැබීය. මෙහි වගන්ති වලින් මෙම කොමිසමට අත්‍යවශ්‍ය ද්‍රව්‍ය වල මිල නියම කිරීමේ හැකියාව තිබුණි. නමුත් පෞද්ගලික අංශය රජයට පෙන්වා දෙනු ලැබුවේ මෙම වගන්ති හේතුවෙන් ආයෝජනයන් පැමිණීම කෙරෙහි බලවත් බාධාවක් සිදු වන බවයි. ඒ අනුව මේ වගන්ති යටතේ උපරිම මිල නියම කිරීමට මෙම කොමිසම සතුව මෙතෙක් පැවති බලය අහෝසි විය. නමුත් තවදුරටත් ඖෂධ වර්ග කෙරෙහි උපරිම මිල නියම කිරීමට ඇති අයිතිය පමණක් කොමිසම වෙත ඉතිරි විය. 1993 අංක 57 දරන සංශෝධනය මගින් මෙම පනතට දෙවන සංශෝධනයක් ද එකතු විය. මෙම පනත මගින් 9 (අ) වශයෙන් නව ප්‍රතිපාදනයක් එකතු විය. මින් දැක්වූ ආකාරයට සංස්ථාපිත ආයතනයක කොටස් හෝ වත්කම අත්කර ගැනීමක් සිදු කරයි නම් හා එහි ප්‍රතිඵලයක් වශයෙන් ඒකාබද්ධ වීමක් සිදුවේ නම් ඒ පිළිබඳව කොමිසම වෙත දැනුම්දීම අනිවාර්ය විය.

කොමිසමේ අභිමතාර්ථ

1. ඒකාධිකාරයන් හා ඒකාබද්ධ වීම් ඇතුළු අයථා වෙළඳ පිළිවෙත් පාලනය කිරීම.
2. මිල ප්‍රතිපත්තියක් ඇති කොට එය ක්‍රියාත්මක කිරීම.
3. තරඟකාරිත්ව හා පාරිභෝගික ප්‍රතිපත්තිවලින් අපේක්ෂා කරන පරිදි පාරිභෝගික යහපත පිණිස කටයුතු කිරීම.

මෙම ආයතනයට විමර්ශන හා අර්ධ අධිකරණ බලය හිමි වූ අතර විමර්ශනයක් අවසානයේ පහත සඳහන් නියෝග නිකුත් කිරීමට ද මෙම ආයතනයට හැකියාව තිබුණි.

1. ඒකාධිකාරයකට, ඒකාබද්ධ වීමට හෝ තරඟකාරීත්වයකට එරෙහි ක්‍රියාවකට අවසර දීමට.
2. ඉහත ක්‍රියාවක් වළක්වන ලෙස නියෝග කිරීමට.

3. යම් ආයතනයක් විසින් අනුගමනය කළ අයථා ක්‍රියාවන් නිසා ඉන් මහජන යහපතට හානියක් සිදුව ඇත්නම් එහිලා පියවර ගැනීමේ බලය.

4. පනතේ 7 වන වගන්තියට කොමිසමේ නියෝගයකින් අසහනයට පත් වන පුද්ගලයෙකුට දින 30 ක් තුළ අභියාචනාධිකරණයට අභියාචනයක් යොමු කළ හැකි අතර අභියාචනාධිකරණ තීන්දුවට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් යොමු කළ හැක.

5. 10 (3) දක්වන්නේ දිස්ත්‍රික් උසාවියක් වෙත ඇති බලය පැවරී ඇති බවයි.

රටක පවතින තරඟකාරීත්වය හා අදාළ නීතීන් ක්‍රියාත්මක කරන ආයතනයක් සතු විය යුතු අත්‍යවශ්‍ය බලතල

1. **විමර්ශනය** (Investigation)

මෙහි දී වෙළඳපොළ තුළට ගොස් හෝ තමාට ලැබුණු පැමිණිල්ලක් මත වෙළඳපොළ තුළ අයථා වෙළඳ ප්‍රතිපත්තියක් ඇති බව විමර්ශනය කිරීමේ හැකියාව තිබේ.

2. **අභිචෝදනයට ඇති බලය** (Prosecution)

විමර්ශනයක් පවත්වා මෙම ආයතනයට පෙනී ගියහොත් යම් වෙළෙන්දෙක් හෝ ආයතනයක් තරඟකාරිත්වයට බාධා වන ක්‍රියාවයන්හි නිරත වන බව එහිලා චෝදනා ඉදිරිපත් කිරීමේ බලය තිබිය යුතුයි.

3. **තමන්ගේ තීරණය ලබා දීමට ඇති අයිතිය** (Adjudication power)

අදාළ පරීක්ෂණය පවත්වා අවසානයේ යම් ආයතනයක ක්‍රියාවන් සීමා කරන ලෙස නැතිනම් ඒවා නවතා දමන ලෙසට තහනම් නියෝග කිරීමේ හැකියාවන් තිබිය යුතුයි. බොහෝ රටවල තරඟකාරිත්ව බලධාරිත්වයකට අධිකරණ බලයක් ලබා දී නොමැත. මේ සඳහා එක්කෝ රටේ සාමාන්‍ය අධිකරණය වෙත යා යුතු අතර

නැතිනම් මේ අරමුණ සඳහාම විශේෂ අධිකරණයක් හෝ පර්ෂදයක් පිහිටුවා තිබිය හැකිය.

ශ්‍රී ලංකාවේ සාධාරණ වෙළඳ කොමිසමට සිය නියෝග බලාත්මක කිරීමේ හැකියාවක් නොමැති වේ. එයට හේතුව වන්නේ එක්කෝ අභියාචනා කළ හැකි වීමත් සහ අභියාචන තීන්දුව නිකුත් කරන තෙක් අදාළ වෙළන්දාගේ හෝ ආයතනයේ ක්‍රියාව නැවැත්වීමට තහනම් නියෝග ගෙන ඒමට නොහැකි වීමයි.

4. **උපදේශාත්මක බලය** (Advocacy)

උපදේශාත්මක බලය කොටස් දෙකකි.

i. Upward direction

ii. Down ward direction

Upward Advocacy යන්නෙන් අදහස් වන්නේ මෙම ආයතනයට රජයට උපදෙස් හා යෝජනා ඉදිරිපත් කිරීමට ඇති හැකියාවයි. එනම් රජය විසින් අලුත් නීතියක් හෝ ප්‍රතිපත්තියක් පනවන විට එය තරඟකාරීත්වයට එරෙහි ද යන්න පිළිබඳව හා පවතින නීතියක් තරඟකාරිත්වයට එරෙහි නම් එය වෙනස් කරන ලෙසත් වෙළඳපොළ තුළ තරඟකාරිත්වය වර්ධනය කිරීම සඳහා අළුතින් නීතියක් පනවන ලෙසටත් යනාදී වශයෙන් උපදෙස් හා නිර්දේශ ඉදිරිපත් කළ හැක.

Down ward Advocacy යනුවෙන් හඳුන්වන්නේ නීති අදාළ වන්නා වූ පුද්ගලයින් වෙළෙන්දන් හා පාරිභෝගිකයන් දැනුවත් කිරීම සඳහා වැඩසටහන් පවත්වා ගෙන යාමයි.

විදේශීය ආයෝජන ආශ්‍රිත සත්කාරක රාජ්‍යය පාලනය

රාජ්‍යය පරමාධිපත්‍යය නම් වූ සංකල්පයේ බලපෑම හේතු කොටගෙන රටකට ඒ රටට ඇතුල්වන විදේශීය ආයෝජනයන් පාලනය කිරීම සඳහා අසීමිත බලයක් පවතී. ඒ අනුව පිටස්තර පුද්ගලයකු එනම් විදේශිකයකු වෙනත් රටකට ඇතුළු වීමත් සමග ම ඔහු සහ ඔහුගේ දේපළ සියල්ලම සත්කාරක රටේ ගෘහස්ථ නීතියට යටත් විය යුතුයි. මෙලෙස විදේශිකයකු සත්කාර රාජ්‍යයට ඇතුළු වූ පමණින්ම ඔහු සිය කැමැත්තෙන්ම එම රටේ නීතියට යටත් වෙතැයි පිළිගනු ලැබෙයි.

කෙසේ වෙතත් අන්තර්ජාතික නීතිය පිළිගත් යම් යම් සම්මතයන්හි බලපෑම හේතුවෙන් යම් විටෙක විදේශිකයා ගෘහස්ථ නීතියේ බලපෑමෙන් ඉවත්ව යම් අවස්ථානහිදී අන්තර්ජාතික නීතියට යටත්වන අවස්ථාවන් ද දැක්විය හැකිය. එනම් අන්තර්ජාතික නීතිය යටතේ සාමාන්‍යයෙන් පිළිගෙන ඇති තත්ත්වයක් වනුයේ විදේශිකයා වෙත අවම සම්මතයන්ට අනුව සලකනු ලැබීමට අයිතිවාසිකමක් වන බවයි. නමුත් මෙම සම්මතයයෙන් කුමක් වැටහේද යන්න මතභේදයට තුඩු දී ඇත. සමහරු එය රටක් සිය රටේ පුරවැසියන්ට දැක්විය යුතු ජාතික සම්මතය (national treatment) ලෙස සලකන අතර සමහරු එය අන්තර්ජාතික නීතිය පිළිගත් අවම සම්මතය යයි දක්වයි. කෙසේවුවද රාජ්‍යයන් අතර පවතින සන්ධානයන් (treaties) තුළ මෙලෙස සැලකීමේ අවශ්‍යතාවය පිළිගෙන තිබුණත් නැතත් මෙම සැලකිල්ල දැක්විය යුතු යයි සමහරු තර්ක කරති. රටවල් අතර පවතින ද්වි පාර්ශවීය සම්මුතීන් (Bilateral Investment

Treaties) යටතේ සහ මිත්‍රත්ව, නෞකා සහ වාණිජ සම්මුතීන් (Treaties of Friendship, Commerce and Navigation) යටතේ මේ වගට ප්‍රතිපාදන සාමාන්‍යයෙන් අන්තර්ගත කරනු ලැබේ. එමෙන්ම විදේශිකයකු සත්කාරක රාජ්‍යය වෙත පැමිණියේ යම් කොන්දේසීන්ට යටත්ව නම් පසුව එම කොන්දේසීන්ට පරිබාහිර වන ලෙස විශේෂ රැකවරණයන් ඉල්ලා සිටිය නොහැකිය.

Attorney General for Canada Vs. Cain[1] හිදී පෙන්වා දුන් පරිදි සෑම රටකටම සිය රට වෙත පැමිණීමට පුද්ගලයන්ට අවසර නොදිමේ පරම අයිතියක් පවතී. ඒ නිසා යම් හෙයකින් අවසරය දානය කරයි නම් එහිලා රටකට සිය කැමැත්ත පරිදි කොන්දේසි නියම කිරීමටත් නැවත නෙරපා දැමීමටත් අයිතිය පවතී. මිතුරු රටක ජාතිකයන් සම්බන්ධයෙන් වුවද එම තැනැත්තාගේ රැඳී සිටිම සත්කාරක රටේ සාමයට, නීතියට සහ යහපත් ආණ්ඩුවක පැවැත්මට හෝ එහි සමාජීය අයිතීන්ට එරෙහි වේ නම් එවැන්නකු පළවා හැරීමේ අයිතිය පවතින බවයි. මේ අනුව විදේශීය ආයෝජකයකු ඇතුළු වීම සම්බන්ධයෙන් මෙන්ම එහි කටයුතු කළ යුතු සහ රැඳී සිටිය යුතු ආකාරය පිළිබඳව ද කොන්දේසි නියම කළ හැකිය.

UNCTC විසින් යෝජිත බහුජාතික සමාගම්වල හැසිරීම පිළිබඳ ව වූ සංග්‍රහයෙහි 50 වන ව්‍යවස්ථාවෙහි ද ඉහත තත්ත්වය හා සමාන විධිවිධාන අන්තර්ගත වෙයි.

'සෑම රටකටම බහුජාතික සමාගම් සිය රටට ඇතුළු කර ගැනීමේ දී හෝ ඒවා ස්ථාපනය කර ගැනීමට ඉඩ ප්‍රස්ථාව සලසා දිමේ දී, සත්කාරක රටේ ආර්ථික හා සමාජයීය සංවර්ධනය පිණිස සිය කාර්යභාරය ඉටු කිරීමේ දී එහිලා අදාළ වන සීමාවන් හා කොන්දේසි නියම කිරීමට හැකියාව පවතින බවයි.'

මේ නිසා සෑම රටකටම සිය පරමාධිකාරී බලය තුළින් සිය රටෙහි වෙසෙන විදේශිකයන් නෙරපා හැරීමටත් ඔවුන් ඇතුළු වීමේ දී නියම කළ කොන්දේසි උල්ලංඝනය කරයි නම් ලබාදුන් බලපත්‍රල අවසරයන් ඉවත් කරගෙන නැවත යැවීමටත් හැකියාව පවති.

1. (1906) AC 542

මේ අනුව විදේශ ආයෝජන කාර්යාවලිය මුළුමනින්ම සත්කාරක රටේ නීතින්ට යටත් විය යුතුයි යන්න පොදුවේ පිළිගත් තත්ත්වයකි. මේ අනුව විදේශ ආයෝජන ඇතුළත් වීමේ දී ස්ථාපනය කළ යුතු අවශ්‍යතා, පිටතින් රැගෙනා හැකි ප්‍රාග්ධනය ඇතුළු වෙනත් සම්පත් සහ ඒවායේ ස්වභාවය, සැලසුම් හා පරිසරාත්මක පාලනයන්ල විදේශීය සමාගම් ගිවිසුම් අවසානයට පත් කරයි නම් එහිලා අදාළ වන නියමයන් වැනි දෑ පිළිබඳ ව අදාළ වන නීතිය මෙහිලා වැදගත් තැනක් ගනියි. මෙලෙස අදාළ නීතිමය පද්ධතිය දක්වනවා සේම විදේශ ආයෝජනයන් සිදු කිරීමේ දී විදේශිකයන් වෙත සැලසෙන සහනයන් සහ දිරිමත් කිරීම් හා ඒවා ආකර්ශනය කර ගැනීමට අනුගමනය කරන පිළිවෙත් පිළිබඳ ව ද දැක්විය යුතුයි. මන්දයත්, දියුණු වෙමින් පවතින රාජ්‍යයන් විදේශ ආයෝජන සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන පිළිවෙතට අනුව ආයෝජකයන් ආකර්ශනය කර ගන්වන විධිවිධාන හා එහිලා වන පාලනයන් යන දෙකම ආශ්‍රයෙන් නීති සංග්‍රහිත කරයි. මෙය ‘Carrot and stick method’ යනුවෙන් හඳුන්වයි. අන් අතට සංවර්ධිත රටවල් වඩා අවධානය යොමු කරන්නේ ආයෝජන ආකර්ශනය කර ගැනීම පිළිබඳව නොව විදේශ ආයෝජන කෙරෙහි දැක්විය යුතු පාලනමය නීති පැනවීම කෙරෙහි පමණි.

සාමාන්‍යයෙන් එක් අවස්ථාවක විදේශ ආයෝජන ඇතුළත් කර ගැනීමේ දී සත්කාරක රාජ්‍යය විසින් ලබා දෙන පොරොන්දු සහ එකඟත්වයන් මගින් එම රට බැඳීමට යටත් නොවන අතර අනාගතයේ ඔවුන් විසින් ඇති කර ගන්නා නීතින් හි වෙනස්කම් එම ගිවිසුමට ද බල පැවැත්වෙන පරිදි එම නීතින් අදාළ කරගත හැකිය. කෙසේවෙතත් ඇති කරගත් ගිවිසුමක් අනාගතයේ වෙනස් නොකරන බවට සත්කාරක රාජ්‍යය සන්ධානයක් මගින් එකඟව ඇත්නම් එවන් වෙනස් කිරීමක් අනාගතයේ සිදු කිරීම තරමක් සැක සහිත ය. සාමාන්‍යයෙන් රටවල් අතීතයේ ඇති කරගත් මිත්‍රත්ව, නෞකා වාණිජ සම්මුතීන් යටතේ මෙන් නොව වර්තමාන ද්වි පාර්ශවීය සම්මුතීන් යටතේ සාමාන්‍යයෙන් මෙවන් පුළුල් බලයක් විදේශීය ආයෝජකයාට හිමි නොවෙයි. එහෙයින් විදේශීය ආයෝජන ඇති කර ගැනීමේදී ඒකපාර්ශවීය ලබා දෙන පොරොන්දු

මගින් අනාගත රජයන් බැඳීමට සමත් නොවන අතර තෙවන පාර්ශවයන් වෙනුවෙන් වගකීමට යටත් වීමට සිදු නොවේ. එසේම රටකට ව්‍යවස්ථා පැනවීම සඳහා ඇති බලය විදේශ ආයෝජනය පිළිබඳ ගිවිසුමකින් යටපත් කිරීම ද එකඟ විය නොහැකි කරුණකි.

මේ අයුරින් විදේශ ආයෝජන ඇතුළත් වීම හා ඒවායේ ක්‍රියාකාරීත්වය පාලනය කරන ගෘහස්ථ නීති පද්ධතියක් ඇති කිරීමේ අරමුණ විදේශීය ආයෝජකයන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ හැකි පාලනයේ ප්‍රමාණය තීව්‍ර කිරීමයි. මෙහි ප්‍රතිඵලය මේ සම්බන්ධයෙන් අදාළ වන යම් අන්තර්ජාතික නීති ප්‍රමාණයක් පවතී ද ඒවායේ බලපෑම සීමා වීමයි. මෙලෙස පනවන ව්‍යවස්ථාවන්හි අන්තර්ගත උපක්‍රම සහ ඒවායේ පාලනමය ප්‍රමාණයන් රාජ්‍යයෙන් රාජ්‍යයට වෙනස් විය හැකි නමුත් එම සෑම රාජ්‍යයකම මූලිකම අභිප්‍රාය වන්නේ විදේශීය ආයෝජන කෙරෙහි පරිපාලනමය කාර්යාවලියන් ක්‍රියාත්මක කිරීමයි. සමහර රාජ්‍යයන් විදේශ ආයෝජනවලට අවකාශ සැලසීමේ දී යම් යම් උපක්‍රම උපයෝගි කර ගැනීමෙන් ඒවා සීමා කිරීමට තැත් කරන අතර එමගින් පහසුවෙන්ම පාලනයක් පවත්වා ගෙන යාමට උත්සාහ ගනු ලැබෙයි. නිදසුනක් ලෙස විදේශ ආයෝජකයා වෙත ඉඩ ප්‍රස්ථාව ලබා දීමේ දී එහිලා දේශීය හවුල්කරුවකු සමගින් සන්ධීය ව්‍යාපාරයක් (joint venture) ඇති කර ගන්නා ලෙසටත් හා එහිලා විදේශ අයෝජකයාට දැරිය හැකි කොටස් හිමිකාරීත්වයේ ප්‍රමාණය ද නියම කළ හැකිය. බොහෝ අවස්ථාවල මෙවන් සන්ධීය ව්‍යාපාරයන්හි දේශීය හවුල්කරුවා වන්නේ රජය හෝ රජය නියෝජනය කරන ආයතනයක් වෙයි. එමගින් අදාළ ව්‍යාපාරයේ සෑම අදියරයකදීම රාජ්‍ය ප්‍රතිපත්ති ඉෂ්ට වන පරිදි කටයුතු කිරීමේ හැකියාව සැලසේ.

මෙයට අමතරව විදේශ ආයෝජන කෙරෙහි පාලනමය උපක්‍රම සැකසීමේ දී සත්කාරක රාජ්‍යයේ අරමුණු ඉටුවන පරිදි ඒවා සැකසීමට වගබලා ගනු ලැබෙයි. එහි දී විදේශ ආයෝජකයා සත්කාරක රාජ්‍යය සමග ඇතිකර ගනු ලබන නොයෙකුත් ගිවිසුම් මගින් අදාළ ගිවිසුම දේශියත්වයෙන් පිටත වූ නීතියකින් පාලනය වීම වැළකේ. එය තවදුරටත් සත්කාරක රටේ දේශීය නීතියට යටත් කිරීමට හැකි වන ස්වභාවයේ නීති සකසාලනු ලබයි.

කෙසේ වුවද, මෙම ප්‍රයත්නයට පරිබාහිර ලෙස සෑම විටෙකම විදේශ ආයෝජකයා සිය ආයෝජනය හැකිතාක් දේශීය නීතියේ බලපෑමෙන් මුදාගෙන එය අන්තර්ජාතික නීතියේ ක්ෂේත්‍රයට ගෙන යාමට කටයුතු කරන නිසා රටකට සිය දේශ සීමාව තුළට පැමිණෙන විදේශ ආයෝජකයා කෙරෙහි පූර්ණ ලෙස දේශීය නීතිය ක්‍රියාත්මක කිරීම වැළකී ඇත.

මේ ආකාරයට විදේශ ආයෝජන වෙනස් ස්වභාවයක ඒවා වන හෙයින් එය අන්තර්ජාතික නීතියේ බලැපෑමට යටත්වීම වැළැක්විය නොහැක්කකි. විදේශිකයන් සහ ඔවුන්ගේ දේපල අන්තර්ජාතික නීතියේ රැකවරණයට භාජනය වන වැදගත් අවස්ථා තුනක් පවතී.

මින් පළමුවැන්න විදේශිකයන්ට සිදුවන හානි සඳහා වන රාජ්‍යය වගකීම (state responsibility) නම් වූ සංකල්පයයි. මේ යටතේ දක්වන්නේ විදේශ ආයෝජකයන් කෙරෙහි සැලකීමේ අවම සම්මතයන් පවතින බවත් සත්කාරක රාජ්‍යය විසින් මේවා උල්ලංඝනය කළ නොහැකි බවත් ය. මුල්කාලීනව මෙම සැලකීමේ අවම සම්මතය යන්න බලවත් රාජ්‍යයන් විසින් අනිසි ලෙස සත්කාරක රාජ්‍ය වෙත මැදිහත් වීමට මාර්ගයක් වශයෙන් භාවිත කරන ලදී. කෙසේ වෙතත් වර්තමානයේ වර්ධනය වී ඇති මිනිස් අයිතිවාසිකම් පිළිබඳ නැමියාවන් හේතු කොටගෙන මෙම අවම සම්මතයන් නව ආරක් ගෙන ඇත. මේ ආශ්‍රිතව බොහෝ ඉල්ලීම් උද්ගතව ඇත්තේ සත්කාරක රටේ හටගත් ප්‍රචණ්ඩකාරී හා කලබලකාරී තත්ත්වයන් ගෙන් විදේශීය ව්‍යාපාරිකයන්ට හා ඔවුන්ගේ දේපළට රැකවරණය සලසාදීම සම්බන්ධයෙන් රාජ්‍යයක් සතු යුතුකම් හා වගකීමේ ප්‍රමාණය තීරණය කිරීම සම්බන්ධයෙනි.

දෙවනුව වැදගත් වන කරුණක් වන්නේ අන්තර්ජාතික වෙළඳාම කෙරෙහි බලපවත්වන අන්තර්ජාතික නීතියයි. සමහර විටෙක විදේශීය ආයෝජනය කෙරෙහි ක්‍රියාත්මක වන ගෘහස්ථ නීතින් අන්තර්ජාතික වෙළඳාම ආශ්‍රිතව පවතින අන්තර්ජාතික නීති තත්ත්වයන් හා පටහැනි විය හැකිය. නිදසුනක් ලෙස යම් විටක ගෘහස්ථ නීතිය මගින් විදේශීය ආයෝජකයන් සිය ව්‍යාපාර සඳහා දේශීය අමුද්‍රව්‍ය පමණක් උපයෝගි කරගත යුතු බවට නීති පැනවිය

හැකිය. මෙය අන්තර්ජාතික නීතිය පිළිගෙන ඇති වෙළඳ නිදහස සමගින් පටහැනි විය හැකිය. එහෙත් පරිසරයට හානිදායක වන නිෂ්පාදන ක්‍රියාවලින් සම්බන්ධයෙන් පවතින සීමා අන්තර්ජාතික නීතිය පිළිබඳ පරිසර නීතින් යටතේ පවා සාධාරණීකරණය කළ හැකිය.

මෙහිලා අන්තර්ජාතික වශයෙන් පිළිගෙන ඇති තෙවන කාරණය නම් සත්කාරක රටට ද්වි පාර්ශවීය ආයෝජන ගිවිසුම් යටතේ තමා කැමති පරිදි විදේශ ආයෝජකයන් කෙරෙහි නීති පැනවීමට වන පරම අයිතිය සීමා වන බවයි. එනම් යම් කරුණක් ආශ්‍රයෙන් රාජ්‍යයන් අතර සන්ධානයක් රැ සම්මුතියක් බිහිව ඇත්නම් එහිලා ක්‍රියාත්මක වන ගෘහස්ථ නීතිය සීමා වේ. මන්ද මේ යටතේ රාජ්‍යයන් දෙකම එක්ව යම් යම් සම්මතයන් විදේශ ආයෝජනයන්හි ආරක්ෂාව පිණිස අනුගමනය කරනු ලබයි. මෙලෙස ඇති කරගනු ලබන සන්ධානයන් ගෙන් බැඳීමට යටත් වීමට අඩු වශයෙන් ඊට අත්සන් කළ පාර්ශවයන්වත් එකඟ වන බැවින් එමගින් විදේශ ආයෝජනය පිළිබඳ අන්තර්ජාතික නීතිය නිර්මාණය වේ.

වර්තමාන විදේශ ආයෝජන පිළිබඳ නීතිය පරීක්ෂා කර බැලීමේ දී පෙනී යන්නේ විදේශ ආයෝජනවලට මුළුමනින්ම විරුද්ධ වන ව්‍යවස්ථා පැනවීම වර්තමානයේ සිදු නොවන බවයි. ඒ වෙනුවට සත්කාරක රාජ්‍යයට ප්‍රයෝජනවත් වන ස්වරූපයේ විදේශ ආයෝජන කෙරෙහි යහපත් වන වාතාවරණයක් සැලසෙන නීති පැනවීම සිදුවෙයි. විදේශ ආයෝජන සිය රට තුළ සංවර්ධයක් ඇති කිරීමට උපයෝගි වෙතැයි රාජ්‍යයන් විශ්වාස කරන බැවින් එහිලා අවකාශ සලසාදීම, ඊට එරෙහි වනවාට වඩා වැඩි කැමැත්තක් දක්වයි.

මෙය 1970 දශකයේ මුල් භාගයේ රාජ්‍යයන් අනුගමනය කළ තත්ත්වයට සපුරා වෙනස් ය. විදේශ ආයෝජන සහ තාක්ෂණය කෙරෙහි ඉතා දැඩි නීති මාලාවක් අනුගමනය කිරීම එහි අරමුණ නොවීය. මූලික වශයෙන්ම මෙමගින් විදේශ ආයෝජන සුපරීක්ෂාකාරීත්වයට යටත් වූ අතර ඒවා ලියාපදිංචි කිරීම අනිවාර්ය කිරීමත් යම් යම් ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විදේශ ආයෝජන ඇති

කිරීම සීමා කිරීම හෝ මුළුමනින්ම තහනම් කිරීමත්, පවරා ගැනීම් පාලනය කිරීමත්, යම් යම් ක්ෂේත්‍රවල විදේශ ආයෝජන සහභාගීත්වය සුළුතර පාලනයකට පමණක් යටත් කිරීමටත් තාක්ෂණ ගිවිසුම් සම්බන්ධයෙන් නීති සම්පාදනය කිරීමටත්, යම් යම් අහිතකර ව්‍යාපාරික පුරුදු සීමා කිරීමටත් යනාදී වශයෙන් වූ කාරණා සම්බන්ධයෙන් විධිමත් නීති පද්ධතියක් සකසාලීම මෙහි අරමුණ විය. නමුත් පසුකාලීනව වඩා නම්‍ය හා සාධාරණ විදේශ ආයෝජන ගලා ඒම සීඝ්‍ර කරවන ස්වභාවයේ නීති පැනවීමේ නැම්යාවක් රාජ්‍යයන් විසින් අනුගමනය කරන්නට යෙදිණ. මුලින් පනවනු ලැබූ නීති මාලාව තවදුරටත් ක්‍රියාත්මක වුවද, ඒවා වඩා නම්‍යශීලි ලෙස අර්ථ නිරූපණය කිරීමටත් පරිපාලනමය ආයතන විදේශ ආයෝජන සඳහා අවසර දීමේ දී එහිලා වඩා අභිමතානුසාරී බලයක් ඔවුන් වෙත ලබාදීමක් වර්තමානයේ සිදු වේ.

තවද, විදේශ ආයෝජන ගිවිසුම් වර්තමානයේ පාර්ශවයන් දෙකක් අතර උද්ගත වන පුද්ගලික ගිවිසුමක ස්වභාවයක් නොග න්නා අතර මෙහිලා යම් පරිපාලන ආයතන මගින් නිකුත් කරන බලපත්‍ර ලබාදීම්, අවසරයන් නිකුත් කිරීම් ද සිදුවන නිසා ඒවා මහජන නීතියේ (Public Law) විෂය පථයට ද අයත් වේ. මෙලෙස මහජන නීතියේ යම් යම් අංගයන් විදේශ ආයෝජන කාර්යාවලිය කෙරෙහි අදාළ වීම නිසා උද්ගත වූ වෙනස් ප්‍රතිඵල ද පවතී. මේ නිසා විදේශ ආයෝජන ගිවිසුම් පුද්ගලික ස්වභාවයේ ගිවිසුම් ගණයෙන් මිදී ඒවා පරිපාලන නීතියට ද යටත් වීමට සිදුවේ. එහෙයින් සත්කාරක රාජ්‍යයට පිවිසෙන විදේශීය ආයෝජකයකුට විදේශ ආයෝජන ගිවිසුමට එකඟව කටයුතු කරනවා සේම එම ගිවිසුම් හා අදාළ වන සත්කාරක රාජ්‍යයේ ක්‍රියාත්මක වන පරිපාලන හා වෙනත් නීතින්ට ද යටත් වීමට සිදු වේ.

වෙළඳ ආර්ථිකයක් (market economy) කෙරෙහි නැඹුරුව ඇති බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල් වල වර්තමාන නැම්යාව වී ඇත්තේ සවිස්තරාත්මක විදේශ ආයෝජන පිළිබඳ නීති පද්ධතියක් නිර්මාණය කිරීමයි. මෙහිලා අදාළ වන පදනම වනුයේ බහුජාතික සමාගම් විසින් රැගෙන එන විදේශීය ආයෝජන නිසි ලෙස සත්කාරක රාජ්‍යයේ ආර්ථික වර්ධනය පිණිස යොදා

ගනියි නම් එමගින් මහත් ප්‍රතිඵල සත්කාරක රාජ්‍යයට අත්පත් කරගත හැකි බවයි. මෙම අරමුණ මුදුන් පමුණුවා ගැනීම සඳහා සත්කාරක රාජ්‍යයන් එකිනෙකාට පටහැනි වන නීතින් විදේශ ආයෝජන විෂයෙහි පැනවීමට නැම්යාවක් දක්වයි. එනම්, එක් අතකින් විදේශ ආයෝජන කෙරෙහි යම් යම් ආරක්ෂාවන් සහතික වෙමින්, එසේම වන්දි නොගෙවා විදේශ ආයෝජකයන්ගේ දේපළ සහ වත්කම් ජනසතු නොකරන බව තහවුරු කරමින් යම් යම් බදු සහන සහ වෙනත් දිරි ගැන්වීම් විදේශ ආයෝජකයන් ආකර්ශනය කිරීම පිණිස ලබා දෙමින් නීති පනවනු ලැබේ. නමුත් අන් අතට විදේශ ආයෝජනයන් තුළින් සත්කාරක රටට ලැබෙන ප්‍රයෝජන උපරිම කර ගැනීම පිණිස නොයෙකුත් සීමාවන් අන්තර්ගත වන ව්‍යවස්ථා පනවන අතර මෙහිලා අනුගමනය කරනු ලබන එක් උපක්‍රමයක් වනුයේ යහපත් යයි සැලකෙන ආයෝජනවලට පමණක් ඉඩ ප්‍රස්ථාව ලබාදීමයි. එසේම විදේශ ආයෝජකයාට සත්කාරක රට තුළ ක්‍රියාත්මක විය හැකි ආකාරය සම්බන්ධයෙන් සීමා පැනවීම සිදු කරයි.

මේ ආකාරයට නීති පැනවීම පරීක්ෂා කර බැලීමෙන් පෙනී යනුයේ සංවර්ධනය වෙමින් පවතින රටවල් බොහෝමයක් එකම ක්‍රියාවලියක් අනුගමනය කරන බවයි. මන්දයත්, එක්කෝ රාජ්‍යයන් වෙනත් රාජ්‍යයන් විසින් අනුගමනය කරන වඩාත් සාර්ථක උපක්‍රම අනුගමනය කිරීම හෝ අන්තර්ජාතික සංවිධාන විසින් යෝජනා කළ ක්‍රම අදාළ කර ගනියි.

සත්කාරක රාජ්‍යය විසින් විදේශ ආයෝජනයන්ට වාසිදායක වන අයුරින් ලබාදෙනු ලබන විවිධාකාර සහනයන්:

ජනසතු නොකරන බවට ලබාදෙන සහතිකය (Guarantee against nationalizaion)

ව්‍යවස්ථාවන්හි අන්තර්ගත වන සාමාන්‍ය ලක්ෂණයක් නම් වන්දි නොගෙවා විදේශ ආයෝජන ජනසතු නොකරන බවයි. ආයෝජකයන්ගේ වත්කම් වන්දි නොගෙවා ජනසතු කිරීමට නැම්යාවක් පැවති වකවානුවේ විදේශ ආයෝජන බරපතල ලෙසින් සීමා වූ හෙයින් එවන් තත්ත්වයක් නැවත උද්ගත වේ යයි

පවතින බිය නිසා මෙවන් සහතිකයක් ලබාදීමට සෑම රාජ්‍යයක් විසින් ම පියවර ගනු ලබයි. විශේෂයෙන් කොමියුනිස්ට් රාජ්‍යයන් සම්බන්ධයෙන ජනසතු කිරීම කෙරෙහි පැවති පැරණි මතවාදවල බලපෑම් තුරන් කරනු වස් මෙවන් සහතිකයක් ලබාදීමට දැඩි ඕනැකමක් දක්වයි.

නිදසුනක් ලෙස චීනයේ Foreign Enterprise Law of China හි පස්වන ව්‍යවස්ථාව මෙහිලා ලබාදිය හැකි උපරිම සහතිකය දක්වමින් පවසන්නේ ජනසතු කිරීමත දී උපරිම වන්දි ගෙවන බවයි. කෙසේ වෙතත් චීනයේ ගෘහස්ථ නීතින් මෙම ප්‍රතිපාදන හා පරස්පර වේ. එනම් එහි ඤසබඑ ඍැබඑමරු ඛ්අ හි දෙවන ව්‍යවස්ථා පවසන්නේ නීතියට අනුකූලව විදේශ ආයෝජන සඳහා ආරක්ෂාව සැපයෙන බවයි. එසේම රාජ්‍යයන් හි ආර්ථිකමය අයිතිවාසිකම් සහ වගකීම් පිළිබඳ චාටර් පත්‍රයෙහි :The Charter of Economic Rights and Duties of States) 2 (2) c වගන්තිය පවසනුයේ ජනසතු කිරීම් සඳහා වන්දි ගෙවීමේ කාර්ය රටක ගෘහස්ථ නීතියට අනුව සිදුවිය යුතු බවය. මෙයට පක්ෂව චීනය විසින් ඡන්දය භාවිත කරනු ලැබිණ. කෙසේ වෙතත් මෙම සහතිකය ලබාදීමේ මූලික අරමුණ විදේශ ආයෝජකයා කෙරෙහි වන ප්‍රධාන තර්ජනය වළක්වාලන බවට විදේශ ආයෝජනයන් කෙරෙහි යම් තහවුරු කිරීමක් ලබාදීමයි. විශේෂයෙන්ම වන්දි නොගෙන දේපළ ජනසතු කිරීම කෙරෙහි වඩා නැඹුරුවක් මුලින් දැක්වූ රටවල් විශ්වාස කරනුයේ මෙවන් සහතික කිරිමක් ලබාදීම තුළින් විදේශ ආයෝජකයන් තුළ වන බිය හා සැකය තුරන් කළ හැකි බවයි. නමුත් සාමාන්‍ය වශයෙන් එවන් දැඩි අවදානමක් නොමැති රාජ්‍යයන් මෙවන් සහතික කිරීමක් ලබාදීමට එතරම් දැඩි උත්සාහයක් ගනු නොලබයි. නිදසුනක් ලෙස රුසියානු විදේශ ආයෝජන ආශ්‍රිතව පනවා ඇති ව්‍යවස්ථාවෙහි ඉතා දැඩි ලෙස මෙවන් තහවුරු කිරීමක් ලබාදෙන අතර සෑම ජනසතු කිරීමක් සම්බන්ධයෙන්ම සීඝ්‍ර, ප්‍රමාණවත් හා ක්‍රියාශීලි (prompt, adequate and effective) වන්දියක් ලබාදෙන බවයි. නමුත් මෙවන් වන්දි ආශ්‍රිත අධිකරණ පාත්‍රතාව හිමිව ඇත්තේ රුසියානු ශ්‍රේෂ්ඨාධිකරණයටයි. කෙසේ වුවද, විදේශ ආයෝජන ආශ්‍රිතව රාජ්‍යයන් අතර ඇති වන ද්වි පාර්ශවික ගිවිසුම්වල මේ

වගට සහතික කිරීමක් ඇතුළත් වන අතර මින් පෙන්වා දෙන්නේ මුල් කාලීනව ඒ රටවල විදේශීය ආයෝජන ආශ්‍රිතව පැවති ප්‍රතිපත්තීන්හි මූලික වෙනස්කම් ඇතිවී තිබෙන බවයි.

කෙසේවෙතත් මේ ආකාරයට ලබා දෙන සහතික කිරීම් සම්බන්ධයෙන් එල්ල වී ඇති එක් විවේචනයක් වන්නේ ගෘහස්ථ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතියට අනුව එක් ආණ්ඩුවක් (government) විසින් ලබාදුන් පොරොන්දු යනාදියෙන් තවත් ආණ්ඩුවක් බැඳීමට යටත් නොවන බවයි. විශේෂයෙන් මෙවන් ආණ්ඩු වෙනස්වීමක් විප්ලවීය වෙනසක් නිසා සිදු වූයේ නම් මෙම තත්ත්වය වඩාත් උග්‍ර වේ. මන්දයත් මේ අයුරින් බිහිවෙන රජයක් මගින් විදේශ ආයෝජකයන් කෙරෙහි උද්ගත වන අවදානම ඉතා දැඩි වෙයි. විශේෂයෙන්ම පැවති රජයත් දැන් බලයට පැමිණ ඇති රජයත් අතර මතවාද ආශ්‍රිතව මූලික වෙනසක් පවතී නම් මුල් රජය විසින් දුන් පොරොන්දු මගින් පසුව බලයට පත් විප්ලවීය රජයක් බැඳීමට යටත් නොවෙයි. මෙම තත්ත්වය සාධාරණීකරණය කරනු පිණිස Hans Kelsen විසින් දක්වන ලද නියමයක් උපයෝගි කරගනු ලැබේ. ඔහු පවසනුයේ සෑම නීති පද්ධතියක්ම මූලික නීති සිද්ධාන්ත මත පදනම්ව ඇති බවත් එම නීති පද්ධතියෙහි අනෙකුත් සිද්ධාන්ත මෙම මූලික සිද්ධාන්ත තුළින්ම පැන නැගෙන බවයි. එහෙයින් මෙම මූලික සිද්ධාන්තයෙහි විප්ලවීය වෙනසක් සිදු වුනොත් එම නීති පද්ධතියෙහි පවතින අන් සිද්ධාන්තවල වෙනස්වීම සාධාරණ වන බව ඔහු දක්වයි. මින් පැහැදිලි වන කරුණක් නම් විදේශීය ආයෝජන ආශ්‍රිත නීති සංග්‍රහයන්හි අන්තර්ගත මෙම සහතික කිරීම් අයෝජකයන් පොළඹවා ගැනීම සඳහා මිස වෙනත් වටිනාකමක් හෝ අර්ථයක් ඒවායෙහි නොමැති බවයි.

නමුත් මෙහිලා වන තවත් මතයක් නම් විදේශීය ආයෝජන ආශ්‍රිතව ලබා දෙන සහතිකයන්, ඉහත දැක්වූ පරිදි ආණ්ඩු වෙනසක් වුවද ඒවායේ නෛතික ප්‍රතිඵල පවතින බවයි. ඉන් පවසන්නේ යම් යම් සහතික කිරීම් ලබාදීමෙන් ආකර්ශනය කරගත් විදේශ ආයෝජන ආශ්‍රිතව උද්ගත වන ආරවුල් අන්තර්ජාතිය විනිශ්චය සභාවක් වෙත ඉදිරිපත් කිරීමේ කැමැත්ත මෙම සහතික කිරීම් තුළින් ගම්‍ය වන බවයි. මෙම මතයෙන් පෙනී යන්නේ ඒකපාර්ශවීය

ලෙස එක් ආණ්ඩුවක් විසින් ජනසතු නොකරන බවට ලබා දෙන සහතිකය, යම් ආරවුලක් එම දේපළ ජනසතු කිරීම හේතුවෙන් උද්ගත වුවහොත් ඒවා දේශීය ආරවුල් නිරාකරණය කරන විනිශ්චයාසනයක් වෙතින් ඉවත්ව අන්තර්ජාතික අධිකරණයක් වෙත ගෙන යාමේ හැකියාවක් උද්ගත වන බවයි.

මෙම තත්ත්වය Southern Pacific Properties (middle East) Ltd vs Egypt[2] හිදී සාකච්ඡා විය. මෙහිදි ජනාධිපති Sadat ගේ රජය විසින් ඊජිප්තු රජය සම්බන්ධයෙන් විදේශීය ආයෝජන නීති ලිහිල් කිරීමක් ප්‍රකාශයට පත් කළ අතර ඉන් අනතුරුව රජය නියෝජනය කරන ආයතන විසින් ආයෝජන ආකර්ශනය කර ගැනිමේ විශාල වැඩ පිළිවෙලක් මෙහෙයවිය. මෙහිදී මෙම රජය නියෝජනය කරන අයදුම්කරු ඊජිප්තු පිරිමීඩ අසල සංචාරක නිකේතනයක් ගොඩ නැගීම සඳහා ගිවිසුමකට එළඹුණි. මෙම ගොඩනැගිල්ල එම ඓතිහාසික පිරිමීඩ කෙරෙහි ඉතා සමීප වීම නිසා එය දේශපාලන සිදුවීමක් බවට පත්විය. ජනාධිපති Sadat ඝාතනයෙන් පත් වූ නව රජය විසින් මෙම ව්‍යාපෘතිය අවලංගු කළේය. මෙහිදී පැන නැගුණු ප්‍රශ්නය වූයේ මෙම ගිවිසුමට අන් පාර්ශවය වූ රජය නියෝජනය කරන ආයතනයේ වගකීම කුමක් ද යන්නයි. මේ නිසා පත් වූ බේරුම්කරණ මණ්ඩලය ඊජිප්තු රජයේ වගකීම පිළිගනිමින් පැවසුවේ මේ ආකාරයේ සහතික ලබා දෙමින් රජය විදේශීය ආයෝජකයන් ආකර්ශනය කරගත් බවත් එම සහතික උල්ලංඝනය කිරීම රජයේ වගකීම උද්ගත වීමට හේතු වන බවයි. මෙහිදී බේරුම්කරණ මණ්ඩලය ඊජිප්තු ආයෝජන නීතින් කෙරෙහි අවධානය යොමු කරනු ලැබිණි. ඉන් දැක්වූයේ විදේශීය ආයෝජන ආශ්‍රිත ව්‍යාපෘතීන් අධිකරණ ක්‍රියා පටිපාටියකින් තොරව ජනසතු කිරීමක් හෝ පවරා ගැනීමක් නොකරන බවයි. ඒවායේ තවදුරටත් අන්තර්ගත වූයේ ආයෝජන කෙරෙහි දැඩි සුරක්ෂිතභාවයක් ලබාදීම නීතියේ ප්‍රතිපත්ති හා එකඟ වන බවයි.

මේ නිසා අන්තර්ජාතික අධිකරණයක් විසින් මෙම ආරවුල විසඳීම සාධාරණ බව තීරණය විය. කෙසේ වුවද, මෙම බේරුම්කරණ තීන්දුව කෙරෙහි නොයෙකුත් විවේචන ද ඉදිරිපත් විය. මන්දයත්

2. (1983) 22 ILM 752

අදාළ පනතේ සඳහන් වූයේ විදේශ ආයෝජන අධිකරණ ආශ්‍රිත ක්‍රියාවලියකට යටත් වීම අවශ්‍ය බව මිස එය අන්තර්ජාතික බේරුම්කරණයක පරීක්ෂාවකට ලක්විය යුතු බව නොවේ. එසේ පැවසුවේ සම්පූර්ණ වන්දි ගෙවීමකින් තොරව ජනසතු නොකරන බවට යම් අන්තර්ජාතිකමය වශයෙන් බලපෑමක් නොමැති බවයි. මන්දයත් මෙම සහතික කිරීම් එක්කෝ තනි පුද්ගලයන් වෙත නැතිනම් බහුජාතික සමාගම් වෙත ලබාදුන් ඒවා වේ. බහුජාතික සමාගම් සතුව ජාත්‍යන්තර නීතිය යටතේ පෞරුෂත්වයක් නොමැති නිසා එවන් පෞරුෂත්වයක් නොමැති අය හා ආයතන සමග ඇති කරන සන්ධානයකින් නීතිමය ප්‍රතිඵල උද්ගත නොවන බවයි. නමුත් වර්තමාන සංවර්ධිත රටවල් විදෙස් රටවල ආයෝජනයන් සිදු කරන ආයෝජකයින්ගේ රැකවරණය පිණිස රක්ෂණ මාලාවන් ඇති කොට ඇති අතර ඒ අනුව මෙම සහතික කිරීම් විදේශ ආයෝජකයා අයත් මව් රාජ්‍යය වෙත කරන ලද්දක් ලෙසින් ද සැලකිය හැකිය. මෙම තර්කය පිළිගත හොත් ඉහත සහතිකය කඩකළ විට මව් රාජ්‍යය කෙරෙහි සත්කාරක රටේ වගකීම උද්ගත විය හැකිය. මේ නිසා ඉහත දැක්වූ සහතික කිරීමක වලංගුභාවය නැති නම් එහි බැඳ තැබිය හැකි භාවය මතභේදයට ලක්ව ඇත.

විදේශීය ආයෝජකයන් වෙත ලබාදෙන බදු සහන සහ වෙනත් දිරි ගැන්වීම් (tax and other concessions and incentives)

මෙකී සහන සහ දිරි ගැන්වීම් බොහෝ රාජ්‍යයන් ආයෝජකයන් ආකර්ශනය කර ගැනීම පිණිස ලබා දෙන සුලබ සහතිකයකි. බොහෝ විට සෑම ගණනයකම ආයෝජකයන් වෙත මෙම සහනය නොලැබෙන නමුත් උසස් තාක්ෂණය රැගෙන එන සහ සිය කලාපීය මූලස්ථානයන් (regional headquarters) සත්කාරක රාජ්‍යය තුළ පිහිටුවාලන ආයෝජකයන් වෙත බොහෝ විට ලැබෙන්නකි. මෙම සහනයන් ලබාදීම කෙරෙහි සාමාන්‍ය වශයෙන් අන්තර්ජාතික නීතිය යටතේ කිසිදු බලපෑමක් නොමැති අතර එය මුළුමනින්ම රඳා පවතින්නේ සත්කාරක රාජ්‍යයේ අභිමතය මතය.

එක් අතකින් මෙම සහනයන් ලබාදීම විදේශීය ආයෝජකයා සත්කාරක රාජ්‍යයේ කැමැත්තට අනුකූලව කටයුතු කරන බව පෙන්වා දීමකි. මන්දයත්, මෙම සහන ලබාදෙනුයේ සත්කාරක රාජ්‍යයේ කොන්දේසීන්ට අනුකූලව කටයුතු කරන අයට පමණක් වන බැවිනි. එමගින් සත්කාරක රාජ්‍යයට සෘජුවම සිය අරමුණු විදෙස් ආයෝජකයාගෙන් ඉටුකර ගත හැකි අතර යම් හෙයකින් ආයෝජකයා සිය අරමුණුවලට පටහැනි වන අයුරින් ක්‍රියා කරයි නම් සත්කාරක රාජ්‍යය මෙම සහනය ඉවත් කිරීමෙන් විදේශිය ආයෝජකයාට එරෙහිව වන සිය විරුද්ධත්වය සෘජුවම ප්‍රකාශ කළ හැකිය. නිදසුනක් ලෙස නව තාක්‍ෂණ උපකරණ මිලට ගෙන ව්‍යාපෘති ආරම්භ කිරීම, ව්‍යාපෘතියේ කොටස්වලින් යම් ප්‍රතිශතයක් දේශීය පුද්ගලයන් වෙත ලබාදීම මෙලෙස සහන ලබාගැනීමට හේතු වන කොන්දේසි විය හැකිය. කෙසේ වෙතත්, මෙලෙස ආයෝජකයන් තෝරා ගෙන යම් පිරිසකට පමණක් සහන ලබාදීම වෙනස් ලෙස සැලකීමක් ලෙස ද සැලකිය හැකිය. මෙම වෙනස් ලෙස සැලකීම ජාතිකභාවය (racial grounds) මත පදනම් වූ වෙනස් ලෙස සැලකීමක් නොවන තාක් දුරට හා එහි අරමුණු මුළුමනින්ම ආර්ථිකමය අරමුණු මුදුන් පමුණුවා ගැනීම මත පදනම් වේ නම් එහිලා කිසිදු ප්‍රශ්නයක් උද්ගත නොවේ.

කෙසේවෙතත් මෙමගින් අන්තර්ජාතීය වෙළඳාමට එරෙහි වීමක් සිදුවිය හැකිය යන පදනම මත ඇමෙරිකා එක්සත් ජනපදය මෙවන් වෙනස් කොට සැලකීම් සම්බන්ධයෙන් සාමාන්‍යයෙන් විරුද්ධ වේ. ඉහත දැක්වූ පරිදි විදේශිකයන් ආකර්ශනය කර ගන්නවාට අමතරව මෙම සහන ලබාදීමේ අනෙක් පදනම වන්නේ සත්කාරක රාජ්‍යය ලබා දෙන කොන්දේසීන්ට විදේශ ආයෝජකයන් එකඟ කරවා ගැනීමකි. මෙවන් තාක්‍ෂණ පවරා දීමේ, උපයන ලාභ නැවත ආයෝජනය කිරීමේ, යම් කොටස් සහභාගීත්වයක් දේශීය පුද්ගලයන් වෙත ලබාදීමේ, නිෂ්පාදනයන්ගෙන් යම් ප්‍රතිශතයක් අපනයනය කිරීම වැනි මෙම කොන්දේසින්ද අන්තර්ජාතීය වෙළඳාමට එරෙහි වන බවට ඇමෙරිකානු එක්සත් ජනපදය තර්ක කරයි. මේනිසා ඇමෙරිකානු එක්සත් ජනපදය සිය විදේශ ආයෝජන ආශ්‍රයෙන් ද්වි පාර්ශ්වීය ගිවිසුම් ඇතිකර ගැනීමේ

දී සිය ආයෝජකයන් මත මෙම කොන්දේසි (Performance requirements) නොපනවන බවට වග බලා ගන්නා අතර සිය ආයෝජකයා කෙරෙහි එක්කෝ ජාතික සම්මතය නැතිනම් සැලකීමේ ඉහලම සම්මතය (national or most favoured nation treatment) ලබා ගැනීමට කටයුතු කරයි. යම් හෙයකින් මේ කොන්දේසීන් ඉටු කිරීමට අන් පාර්ශ්වය සන්ධානයකින් එකඟ වුනොත් ඒවා සන්ධානීය වගකීම් (treaty commitments) බවට පත්වන අතර ඒවා ඉටු කිරීමට අන්තර්ජාතික නීතිය යටතේ ඔවුන් බැඳී සිටියි. කෙසේ වෙතත් මෙලෙස performance requirements අහෝසි කිරීමට හෝ ඒවා සීමා කිරීමට ඇමෙරිකා එක්සත් ජනපදය ගන්නා උත්සාහය නිසා ඔවුන්ගේ ද්වි පාර්ශවීය ගිවිසුම් ප්‍රතිපත්තිය එතරම් සාර්ථක නැත. එමෙන්ම අන්තර්ජාතික නීතිය යටතේ performance requirements සම්බන්ධයෙන් එතරම් විරුද්ධභාවයක්ද නොමැත.

විදේශ ආයෝජන ඇතුළුවීම සීමා කිරීම (screening of entry of foreign investments)

මුල්කාලීන Victoria සහ Vattel වැනි ලේඛකයන් පැවසුවේ මිනිසා සතු සන්නිවේදන අයිතිය සාක්ෂාත් කර ගැනීම සඳහා සෑම පුද්ගලයෙකුටම වෙනත් දේශයක සිටින පුද්ගලයන් හා වෙළඳාමේ නිරත විය හැකි බවත් මෙය මූලික මිනිස් අයිතිවාසිකම් හා එකඟ වන බවත් ය. කෙසේ වෙතත් රාජ්‍යයන් වෙළඳාම පිළිබඳ මෙම නිදහස තවදුරටත් පිළි නොගනියි. මෙහි වන මූලික විරෝධය වනුයේ බලවත් රාජ්‍යයන් වෙළඳාම කෙරෙහි වන සිය බලය, බලයෙන් අඩු රාජ්‍යයන් කෙරෙහි උපයෝගි කර ගැනීමට ඇති ඉඩ ප්‍රස්තාවයි. එම නිසා සෑම රජයක්ම අහිතකර යැයි සැලකෙන විදේශ ආයෝජන ඇතුළුවීම වළක්වාලීමේ ක්‍රම අනුගමනය කරන අතර කිසිදු රාජ්‍යයක් සෑම හා සියළුම ආයෝජන ඇතුළත් කර ගැනීමේ පියවර අනුගමනය නොකරයි. කෙසේ වෙතත් යම් රාජ්‍යයක් මෙහිලා සීමාවන් නොපැනවීමට කැමති වේ නම් ඊට ඉඩ ප්‍රස්ථාව ද පවතී. සංවර්ධිත රටවල් වඩා විවෘත ප්‍රතිපත්තියක් කෙරෙහි කැමැත්තක් දැක්වුව ද ජපානය, ඕස්ට්‍රේලියාව වැනි රාජ්‍යයන් ද සෘජු හා වක්‍ර ලෙස සීමාවන් අනුගමනය කරයි.

යුරෝපීය රටවල් ඇතුළු බොහෝ රාජ්‍යයන් මෙහිලා පරිපාලනමය ආයතන (screening agencies) පිහිටුවා ඇති අතර මේවායේ කාර්යභාරය ද්විත්වාකාර වෙයි. එනම් එක් අතකින් ඔවුන් සිය රටට විදේශීය ආයෝජන ලබා ගැනීම සඳහා නොයෙකුත් ආකර්ශනීය පියවර ඉදිරිපත් කරන අතරම සිය රාජ්‍යයේ ආර්ථික සංවර්ධන අරමුණු මුදුන් පමුණුවාලන අයුරින් එම විදේශ ආයෝජන යොදා ගන්නා ආකාරයට ද ක්‍රම සකසාලයි. මේ නිසා යම් ආයෝජනයක් ඇතුළත් කර ගන්නා විට එමගින් දේශීය ආර්ථිකයට අත්පත් වන ප්‍රයෝජන පිළිබඳ යම් ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් (feasibility study) ආයෝජකයාගෙන් මෙමගින් අපේක්ෂා කරයි. බොහෝ රාජ්‍යයන් සන්ධීය ව්‍යාපාර තුළින්ම විදේශීය ආයෝජන ඇතුළත් කර ගන්නා නිසා මෙම ශක්‍යතා අධ්‍යයන වාර්තාව එහිලා වන පූර්ව අවශ්‍යතාවක් ලෙසින් ක්‍රියාත්මක වෙයි. එහිලා පාර්ශවයන් දෙකටම අදාළ ව්‍යාපෘතිය පිළිබඳ තොරතුරු හුවමාරු කර ගැනීමටත් සන්ධීය ව්‍යාපාරය කෙරෙහි ඒ ඒ පාර්ශවයේ කාර්යභාරය හා එහිලා අවශ්‍ය අමුද්‍රව්‍ය හා වෙනත් දෑ යෙදීම යනාදිය මෙම අධ්‍යයනය තුළින් අනාවරණය කරගත හැකිය. මේ නිසා උද්ගත වන ප්‍රශ්නය නම් මෙම ශක්‍යතා අධ්‍යයන වාර්තාවෙහි අන්තර්ගත වන තොරතුරක් නිවැරදි නොවෙතොත් හෝ එහිලා යම් උල්ලංඝනයක් පසුව සිදු වුවහොත් උද්ගත වන තත්ත්වය කුමක් ද යන්නයි. ආයෝජකයා වෙතින් මෙවන් වරදක් සිදු වුවහොත් එහිදී එම ගිවිසුම කෙරෙහි මැදිහත් වීමට, ආයෝජන සඳහා අවසර දානය කළ ආයතනයට නිතැතින්ම අවස්ථාව සැලසේ. මෙහිලා උද්ගත විය හැකි තවත් දැඩි ප්‍රතිඵලයක් නම් එම වැරදිම විදේශිය ආයෝජකයා විසින් චේතනාන්විතව කරන ලද වංචාවක් තුළින් උද්ගත වූවේ නම් ගිවිසුම අවලංගු කිරීමට හැකියාව ලැබීමයි. Amco vs Indonesia[3] හි දී ප්‍රාග්ධනය ආශ්‍රිතව ලබාදුන් පොරොන්දු ඉටු කිරීමට ආයෝජකයා අසමත් වීම නිසා ගිවිසුම අවලංගු කරනු ලැබිණ. කෙසේ වෙතත් ආයෝජකයා විසින් කරන ලද වරදවා දැක්වීමක් වුවද එය නිසි කාර්ය පටිපාටියකට අනුකූලව විසඳීම අවශ්‍යතාවකි. මන්දයත් නිසි සහ සාධාරණ සවන්දීමක් නොමැති

3. (1984) 23 ILM 351; I ICSID Reports 589

කල යුක්තිය ඉටු වීමක් සිදුවිය නොහැකි බැවිනි. නමුත් මෙවන් සවන් දීමක් කළ යුතු ද නැද්ද යන්න පරිපාලනමය තීරණයක් ද නැද්ද යන්න එතරම් පැහැදිලි නැත.

මෙලෙස විදේශීය ආයෝජකයා සඳහා ඉඩ ප්‍රස්තාව සලසා දීමේ දී පරිපාලන නියෝජ්‍යායතන (administrative agency) විසින් සෑම විටම සත්කාරක රාජ්‍ය වෙත යම් යම් ස්පර්ශනීය ප්‍රයෝජන අත්පත් කර ගැනීම අපේක්ෂා කරයි. මෙහිදි දේශීය ආර්ථිකය කෙරෙහි සිදුවන බලපෑම කෙරෙහි මෙම ආයතන දැඩි සෙයින් අවධානය යොමු කරන අතර මෙලෙස සිය රටට ඇතුළු වන බලවත් විදේශ සමාගම් නිසා දේශීය ව්‍යාපාරිකයන්ට බලපෑමක් සිදු නොවන වගට වග බලා ගැනීමද ඔවුන් වෙත පැවරෙන යුතුකමකි. මේනිසා එම ආයතන විසින් අනුගමනය කරන උපක්‍රම විදේශ ආයෝජකයා සත්කාරක රට වෙත පැමිණීමට පෙර හෝ පසුව අනුගමනය කළ ද එමගින් ඔවුන් වෙත වෙනස් ලෙස සැලකීමක් උද්ගත වේ. කෙසේ වෙතත් එය සාධාරණීකරණය කරන වලංගු ආර්ථිකමය හේතු පවතින තාක් දුරට එය නීති විරෝධි නොවේ. නිදසුනක් ලෙස තායිලන්ත විදේශ ආයෝජන නීතින් විමසා බැලීමෙන් පෙනී යනුයේ විදේශ ආයෝජන සිදුකළ නොහැකි යම් යම් ක්ෂේත්‍ර ඔවුන් හඳුනාගෙන ඇති බවයි. එනම් වී වගාව, ධීවර කර්මාන්තය හා දේශීය ව්‍යාපාරිකයන්ට හසුරුවා ගත හැකි අඩු තාක්ෂණ කර්මාන්ත යන අංශයන් සම්බන්ධයෙනි. මෙය සාධාරණ වනුයේ එසේ නොවුවහොත් විශාල විදේශ සමාගම් මගින් දේශීය ව්‍යාපාරිකයන් වෙත නොයෙක් තර්ජන එල්ල විය හැකි බැවිණි. එමනිසා නව සහ නිපුණ තාක්ෂණය අවශ්‍ය කර්මාන්ත දේශීය ව්‍යාපාරිකයන්ට හසුරුවාලිය නොහැකි බැවින් එහිලා විදේශිකයන් වෙත අවස්ථාව සලසා දෙන අතර එතරම් දැඩි තාක්ෂණ අවශ්‍යතාවක් නැති ශ්‍රමය අරමුණු කොට ගෙන පවතින ව්‍යාපාර දේශීය පුද්ගලයන් වෙත පමණක් සීමා කර ඇත. නිදසුනක් ලෙස තායිලන්ත Alien Busines Law ට අනුව ව්‍යාපාර කොටස් තුනකි, පළමු වර්ගයට අයත් ව්‍යාපාරයන්හි නිරත විය හැක්කේ දේශීය පුද්ගලයන්ට පමණි. දෙවන ගණය සන්ධීය ව්‍යාපාර මගින් සිදුකළ හැකිය. තෙවැන්න උසස් තාක්ෂණය අවැසි කර්මාන්තවලින්

සමන්විත වන බැවින් එහිලා නිදහසක් විවෘත ලෙස විදේශ ආයෝජකයන් වෙත ලබා දී ඇත. මෙයට වෙනස් වූ සාධක මත සංවර්ධිත රටවල් ද යම් යම් කර්මාන්ත විදේශ මැදිහත් වීමෙන් ආරක්ෂා කොට ගෙන ඇත. නිදසුනක් ලෙස අවි ආයුධ ආශ්‍රිත නිපදවීම් විදේශිකයන් වෙත ලබා දෙනුයේ කලාතුරකිනි. දේශීය ආරක්ෂාව කෙරෙහි මෙය ඉතා අවැසි බැවින් එය සාධාරණ වේ. වර්තමානයේ ආර්ථික හා දේශපාලන සරණාගතයන්ගේ පැමිණීම ඉතා වර්ධනය වූ තත්ත්වයක් පවතින බැවින් සංවර්ධිත රටවල් ද අසීමිත හා කොන්දේසි විරහිත ලෙස පුද්ගලයන් සිය රටට පැමිණීම කෙරෙහි සහායක් නොදක්වයි. වර්තමාන රීතින් කෙතරම් දැඩි ද පවසතොත් ප්‍රමාණවත් ලෙස ප්‍රාග්ධනය රැගෙන ඒමක් පවතී නම් මිස සංවර්ධිත රටවල් ව්‍යාපාරික අරමුණු සඳහා පුද්ගලයන්ට පැමිණීමට අවකාශ සලසා නොදෙයි.

ඉහත දැක්වූ ලෙස මෙම සීමා කොන්දේසි යම් විශේෂිත ජාතියකට පමණක් සීමා වී නොමැති නම් ආයෝජකයන් හා ආයෝජන වර්ග අතර වෙනස්කම් දැක්වීම අන්තර්ජාතික නීතිය යටතේ වරදක් නොවේ. එමෙන්ම අන්තර්ජාතික වෙළඳාමේ දී ද මෙය වරදක් විය නොහැක. මන්දයත් කලාපීය වශයෙන් යුරෝපීය රටවල් ගනුදෙනු කිරීමේ දී එම කලාපයට අයත් ජාතීන් අතර පමණක් එම ගනුදෙනු සිදුවන අතර අන් ජාතීන් ඉන් පිටස්තරව තැබෙයි. එහෙත් මෙය නීතිවිරෝධි නොවේ. එසේම යම් විදේශීය රාජ්‍යයක් සතු බලය තවත් රාජ්‍යයක් තුළ ආර්ථිකමය වශයෙන් ගොඩනගා ගැනීමට හේතුවේ යැයි දෙවන රාජ්‍යයක් තුළ බියක් ඇතිව එම රාජ්‍යයේ පැමිණීම වළක්වාලීම ජාතියක් අරමුණු කොටගෙන කරන සීමා පැනවීමක් දැයි ප්‍රශ්නයක් පැන නැගෙයි. නිදසුනක් ලෙස එක් වකවානුවක ඕස්ට්‍රේලියාව සිය දේපළ විකිණීමේ දී ජපන් ජාතිකයන් වෙත එම දේපළ විකිණීමේදී යම් යම් සීමාවන් අනුගමනය කරන ලදී. මෙම සීමාවන් අනුගමනය සිදු වූයේ ජපන් ජාතිකයන් රාශියක් විසින් එහි දේපළ මිලට ගනු ලබන බව අනාවරණය කර ගැනීම නිසයි. මුල්කාලීනව විවෘත ලෙස විදේශිකයන් විසින් ඕස්ට්‍රේලියාවේ දේපළ මිලයට ගැනීම සිදුවිය. මෙමගින් වාර්ගික වෙනස්කම් (racial discrimination)

සිදුවේ යැයි තර්ක කළ ද එවැන්නක් සිදු නොවෙතැයි සමහරු පෙන්වා දෙයි. විශේෂයෙන්ම යටත් විජිතවාදය අවසන් වීමත් සමගම නව ස්වාධීන රාජ්‍යයන්, සිය ජනසතු ව්‍යාපාර ක්‍රියාත්මක කිරීමේ දී බොහෝ විට ජනසතු කළේ සිය දේශය යටත් කර ගෙන සිටි ජාතිකයන් සතු ව්‍යාපාර හා දේපළයි. මෙය ඔවුන් විසින් යටත් විජිත සමයේ දී ක්‍රියාත්මක කළ ආර්ථික බලය මැඬ පැවැත්වීමේ අරමුණින් කරන ලද්දක් හෙයින් මුළුමනින්ම නීත්‍යානුකූල වේ යයි තීරණය විය. මෙනිසා යම් ජාතියක් අරමුණු කොටගෙන කරන වෙනස් කොට සැලකීමක් නීති විරෝධි වුවද ඊට හේතු රාජ්‍යයක් තුළ යම් ජාතියක් විසින් කරනු ලබන ආර්ථික ආධිපත්‍යය තුරන් කිරීම සඳහා නම් එය වාර්ගික වෙනස්කම් නොකළ යුතුය (Rule Against Racial Discrimination) යන රීතිය උල්ලංඝනය කිරීමක් සේ නොසලකයි.

ප්‍රාග්ධනය රැගෙන ඒමේ අවශ්‍යතාව (capitalization clause / requirement)

රාජ්‍යයන් විදේශයන්හි සිට පැමිණෙන ආයෝජකයාට ඔහුට අවශ්‍ය සියළුම ප්‍රාග්ධනය හෝ ඉන් යම් ප්‍රතිශතයක් රැගෙන එන ලෙස නියම කරයි. මෙලෙස රාජ්‍යයන් අවශ්‍ය ප්‍රාග්ධනය විදේශිකයා විසින් රැගෙන ආ යුතු බවට නියම කරන්නේ විදේශිකයන් ගෘහස්ථ රාජ්‍යය තුළින් ප්‍රාග්ධනය ලබා ගැනීම වළක්වාලීමටයි. මන්දයත්, එවන් අවකාශයක් සලසා දුන්නහොත් රජයේ යම් අරමුණක් හෝ ව්‍යාපෘතියක් මුදුන් පමුණුවා ගැනීම සඳහා පවතින දේශීය මුදල් විදේශීය ආයෝජකයන්ට ඔවුන්ගේ අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා උපයෝගි කරගත හැකි වන බැවිණි. මෙලෙස විදේශිකයන්ට සත්කාරක රාජ්‍යය තුළ වන ප්‍රාග්ධනය උපයෝගි කර ගැනීමට අවකාශ නොදීම ඔහු වෙත කරන වෙනස්කමක් සේ නොසලකන්නේ එය සාධාරණීකරණය කිරීමට තරම් වූ ආර්ථිකමය හේතූන් පවතින බැවිණි.

මෙලෙස ප්‍රාග්ධන අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීමට එකඟවන විදේශියකයකු පසුව එම අවශ්‍යතාව ඉටු කිරීමට අසමත් වුවහොත් එහිලා ඔහුගේ ආයෝජනය නවතා දැමීමට හෝ ඊට මැදිහත් වීමට

සත්කාරක රාජ්‍යයේ මහජන අරමුණු මුදුන් පමුණුවාලීමට අවකාශ සලසා දීමක් වශයෙන් මෙවන් අයිතියක් ලබා දෙනු ලැබේ. මෙම අයිතිය ක්‍රියාත්මක කිරීමේ දී අවශ්‍ය සම්මතයන් අනුගමනය කිරීමෙන් මෙය අන්තර්ජාතික වශයෙන් වරදක් නොවන බවට වග බලා ගත හැකිය.

Amco vs Indonesia හිදී මෙවන් ආරවුලක් උද්ගත විය. මෙහිදී ඉන්දුනිසියාවේ සංචාරක නිකේතනයක් ගොඩනැගීම සඳහා වූ ව්‍යාපෘතියකට ඉන්දුනිසියානු ජාතිකයකු සමග සන්ධීය ව්‍යාපාරයක් යටතේ කටයුතු කිරීමට වූ ප්‍රධාන කොන්දේසිය වූයේ ආයෝජකයා විසින් අදාළ ව්‍යාපෘතිය සඳහා විදේශයෙන් එකඟ වූ ප්‍රාග්ධන මුදල රැගෙන ආ යුතු බවයි. අදාළ නීතිය යටතේ ඔහු විසින් අදාළ මුදල් ගෙන ආ බවට සහතිකයක් ඉන්දුනිසියානු රජයෙන් ලබාගත යුතු විය. නමුත් ඇත්තෙන්ම ඔහු එවන් ප්‍රාග්ධනයක් ඉන්දුනිසියාවට රැගෙන ආවේ නැත. විදේශිකයා එසේ රැගෙන ආ බව දැක්වූව ද ඒ බවට සහතිකයක් නොවිය. මෙය අදාළ එකඟත්වය අවලංගු කිරීම සඳහා පදනමක් ලෙස උපයෝගි කරගති. ICSID පර්ශදය (tribunal) ආයෝජකයාගේ වාසියට තීන්දුවක් දෙනු ලැබුව ද එකී තීන්දුව දීමේ දී ප්‍රාග්ධනය පිළිබඳ කරුණ කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් නොදැක්වීම නිසා තීන්දුව අවලංගු විය. මෙහිලා අළුත් නඩු විභාගයක් පවත්වන ලද අතර එහිදි ආයෝජකයා වෙත සත්කාරක රට තුළ ලබාදුන් අයිතිවාසිකම් අවලංගු කිරීමේ දී එහිලා අනුගමනය කළ යුතු නිසි සම්මත කාර්ය පටිපාටිය අනුගමනය නොකිරීමේ පදනම මත ආයෝජකයාට වාසි වන ලෙස තීන්දුව ලබාදෙන ලදී. මෙහිදි පැවසුවේ තීන්දුවක් ගැනීමට පෙර ආයෝජකයා වෙත පිළිගත් අවම සම්මතයන්ට අනුව අවස්ථාවක් සලසා දිය යුතුව තිබූ බවයි.

දේශීය සහභාගීත්වය පිළිබඳ අවශ්‍යතාව (requirement of local collaboration)

මුල්කාලීනව විදේශීය ආයෝජකයන් සඳහා ඉඩ ප්‍රස්ථාව සලසා දීමේ දී බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල් එහිලා අවකාශ සලසා දුන්නේ විදේශීය ආයෝජකයන් සත්කාර රටේ රාජ්‍ය

ආයතන හා එකතුව එම ආයෝජන පවත්වා ගෙන යන්නේ නම් පමණකි. මෙහි අරමුණ විදේශීය ආයෝජනවල ඵල නෙලා ගන්නා අතරම ඒවායේ පාලනය තවදුරටත් රජය වෙතම තබා ගැනීමයි. මෙලෙස රාජ්‍යය ආයතනයන් එකී ව්‍යාපාරයට සම්බන්ධ කිරීමෙන් රජයට සිය සාමාජිකයන් මාර්ගයෙන් සිය රාජ්‍යය ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක වන අයුරින් ව්‍යාපෘතියේ කටයුතු හැඩගස්වා ගැනීමට හැකිවීම මෙහි අභිලාෂයයි. මෙය කොතරම් දුරට ජනප්‍රිය යැයි ද පවසතොත් තවමත් බොහෝ නැගෙනහිර යුරෝපීයානු සහ ආසියානු රටවල විදේශීය ආයෝජන ලබාගනු ලබන්නේ බොහෝ දුරට රාජ්‍ය ආයතන හා සම්බන්ධ වීමෙනි. සංවර්ධිත රටවල තත්ත්වය මීට වෙනස් ය. ඔවුන් සන්ධීය ව්‍යාපාරයන්ට කැමැත්ත දක්වන්නේ බොහෝදුරට එක්කෝ එමගින් තාක්ෂණය හා ස්වභාවික සම්පත් එක්රැස් කිරීමට හැකියාව ඇති නිසාත් හෝ අසාර්ථක වීමේ අවදානම බෙදා ගැනීමට ඇති හැකියාව නිසාත් ය.

විදේශීය ආයෝජකයන් සංවර්ධනය වෙමින් පවතින රටවල් හා සන්ධීය ව්‍යාපාර ආරම්භ කිරීමට වැඩි කැමැත්ත දක්වන්නේ මෙහිලා ලබාදෙන දේශීය හවුල්කරුවා මගින් ඔවුන්ට සත්කාරක රාජ්‍යය හා සමග ක්‍රියාකාරී ලෙස අදාල කටයුතු පහසුවෙන් බේරුම්කරණය කර ගැනීමට ඇති හැකියාව නිසයි. මෙලෙස විදේශීය ආයෝජන ලබා ගැනීම සන්ධීය ව්‍යාපාර තුළින් පමණක් කටයුතු කළ යුතු බව නියම කිරීමෙන් යම් යම් බරපතල ප්‍රශ්න ද උද්ගත විය හැකිය.

සන්ධීය ව්‍යාපාර දේශීය වශයෙන් ස්ථාපනය කරන නිසා එහි ජාතිකත්වය තීරණය කිරීම සම්බන්ධයෙන් හා කොටස් හිමියන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ප්‍රශ්න උද්ගත විය හැකිය. ජාත්‍යන්තර බේරුම්කරණයක් ඉදිරිපිටට ගිය විටෙක සත්කාරක රටට එකී ව්‍යාපාරය සිය ජාතිකත්වයට අයත් බව තර්ක කළ හැකිය.

දේශීය සහභාගීත්වයෙන් යුතුව විදේශීය ආයෝජනයන් ආරම්භ කළ යුතු බවට වන අවශ්‍යතාව සම්බන්ධයෙන් ව්‍යතිරේක ද පවතී. එනම් බහුජාතික සමාගමක් සිය නිෂ්පාදන සියල්ල හෝ ඉන් විශාල ප්‍රමාණයක් අපනයන කිරීමට එකඟ වේ නම් එහිලා

ආදායම් ඉපයීමටත්, සේවක රැකියා ලබාදීමටත් හැකියාව පවතින නිසාත් එමෙන්ම කාර්මික වශයෙන් සංවර්ධනය නොවූ පෙදෙස්වල මෙම ව්‍යාපෘතීන් අරඹා එම ප්‍රදේශ සංවර්ධනය කිරීමට ඔවුන් සූදානම් වන නිසාත් සත්කාරක රාජ්‍යය ඊට ඉඩහල හැකිය. මෙම අපනයන රීතින් නිසි ලෙස ඉටු නොවුනහොත් එමනිසා වෙනත් ප්‍රශ්න උද්ගත විය හැකිය. එනම් භාණ්ඩ අපනයන නොකර ඒවා දේශීය වෙළඳපොළ වෙත යොමු කලොත් එමගින් දේශීය කර්මාන්තකරුවන්ට ඇති අවස්ථාවන් හිඟ වන නිසා සත්කාරක රාජ්‍යය කැමති නම් විදේශ ආයෝජන අවලංගු කළ හැකිය. මෙහිලා විදේශීකයන් වෙත වෙනස් අන්දමට සැලකීමේ ප්‍රශ්නයක් උද්ගත විය හැකි වුවද ආර්ථිකමය කරුණු සැලකිල්ලට ගනිමින් එය සාධාරණීකරණය කළ හැකිය. එහෙත් සත්කාරක හා මව් රාජ්‍යය අතර විදේශීකයන්ට ජාතික සැලකිල්ල ලබාදෙන බවට පොරොන්දු වූ අනිවාර්‍ය ප්‍රතිපත්තියක් පවතී නම් එවිට මෙය නීති විරෝධි විය හැකි හැකිය. එවන් සම්මුතියක් නැත්නම් අන්තර්ජාතික නීතිය පිළිගත් කිසිදු පදනමක් යටතේ විදේශිකයකුට ජාතිකත්වය මත සලකන සේ ඉල්ලා සිටිය නොහැකිය.

පරිසරය සුරැකිය යුතු බවට පවතින අවශ්‍යතා (requirements relating to environmental protection)

බොහෝ බහුජාතික සමාගම් තාක්‍ෂණය වශයෙන් යල් පැනගිය සහ නුසුදුසු තාක්‍ෂණය රැගෙන එන බැවින් වර්තමානයේ පරිසර ආරක්‍ෂාව පිණිස නීති සැකසීම කෙරෙහි සත්කාරක රාජ්‍යය වැඩි අවධානයක් යොමුකර ඇත. මෙහිදී මෙම සමාගම් එක්කෝ සිය මව් රාජ්‍යය තුළ භාවිතය සඳහා අවකාශ නොමැති තහනම් කළ තාක්‍ෂණය නැතිනම් එය භාවිත කිරීමේ දී යම් යම් පියවර අනුගමනය කිරීමට සිදුවන තාක්‍ෂණය සිය වියදම අවම කර ගැනීම සඳහා කිසිදු පියවරක් අනුගමනය නොකොට ඒවා සත්කාරක රාජ්‍යය තුළ උපයෝගි කර ගනියි.

මෙහිලා ශක්‍යතා අධ්‍යයනයක් කිරීමේ අරමුණ ආයෝජනයක් නිසා උද්ගත වන බලපෑම් පූර්ව වශයෙන් පරීක්‍ෂා කර බැලීමයි. පරිසරයට අහිතකර බලපෑම් සිදුවන බව පෙනී යයි නම් ආයෝජනය ප්‍රතික්‍ෂේප කර දැමීමට අවකාශ ලැබේ. දියුණු වෙමින් පවතින රටවල පරිසර සම්මතයන් උසස් මට්ටමක නොපවතින නිසා බොහෝ ආයෝජනවලට පහසුවෙන්ම මෙම පරීක්‍ෂණ සමත් කොට සත්කාරක රාජ්‍යයට ඇතුළුවීමේ අවකාශ සැලසේ. නමුත් මීට පටහැනි ලෙස සංවර්ධිත රාජ්‍යයන් සිය පරිසරය කෙරෙහි දැඩි අවධානය යොමු කරන අතර ආයෝජන ව්‍යාපෘතියකින් අත්වන ප්‍රයෝජනවලට වඩා දැඩි හානි ඉන් පරිසරයට සිදුවේ නම් ව්‍යාපෘතිය ආරම්භ කළ පසුද අහෝසි කිරීමට පෙළඹේ. නිදසුනක් ලෙස Dillingham-Moore vs Murphyores4 නඩුව දැක්විය හැකිය.

මෙහිලා වන සාමාන්‍ය පිළිගැනීම වනුයේ ආයෝජනයක් නිසා පරිසරයට හානියක් වේ නම් එය නවතා දැමීමට සත්කාරක රටට හැකියාව ලැබෙන බවයි. International Bank of Washinton Vs. OPIC[5] හිදී මෙම අයිතිවාසිකම පිළිගනිමින් පැවසුවේ රාජ්‍ය පරමාධිපත්‍යයට අමතරව සෑම රටකටම සිය දේශීය පරිසරය හානින්ගෙන් ආරක්‍ෂා කර ගැනීමේ අයිතියක් පවතින බවයි. එසේම නූතන අන්තර්ජාතික නීතිය පිළිගනු ලබන්නේ පොදු මනුෂ්‍ය වර්ගයාගේ යහපත පිණිස සිය පරිසරය ආරක්‍ෂා කර ගන්න සෑම රාජ්‍යයක්ම යුතුකමකින් ද බැඳී සිටින බවයි.

4. (1979) 136 CLR 1
5. (1972) 11 ILM 1216

ද්වි පාර්ශවීය සම්මුතීන්

ද්වි පාර්ශවීය සම්මුතියක් යනු අන්‍යෝන්‍ය වශයෙන් රාජ්‍යයන් දෙකක් අතර සිදුවන ආයෝජනයන් වලදී එකී ආයෝජන සහ ඒවා සිදුකළ පාර්ශවයන් ආරක්ෂා කිරීම සඳහා දෙරටක් අතර ඇතිවන සම්මුතියකි. නමුත් වර්තමානයේ දියුණු රාජ්‍යයන් හා දියුණු වෙමින් පවතින රාජ්‍යයන් අතර උද්ගතව ඇති ද්වී පාර්ශවීය සම්මුතීන් වලින් පෙනී යනුයේ ඒවා අසමාන පාර්ශවයන් අතර උද්ගතව ඇති සම්මුතීන් බවයි. මෙවන් සම්මුතීන් යටතේ දියුණු රාජ්‍යයන් ප්‍රාග්ධනය ලබාදීමට පොරොන්දු වන අතර දියුණු වෙමින් පවතින රාජ්‍යයන් එලෙස ලබා දෙන ප්‍රාග්ධනය කෙරෙහි රැකවරණය ලබා දෙන බවට ප්‍රතිඥා දෙයි. මේ අනුව ද්වී පාර්ශවීය සම්මුතියක් යටතේ ඊට පාර්ශවයන් වන දෙරට අතර අන්‍යෝන්‍ය වශයෙන් ආයෝජන ගලායාමක් සිදුවන බව දැක්වුව ද මෙහි දී සිදුවනුයේ එක් අතකට ගලා යන ආයෝජනයක් පමණකි. සම්මුතියට පාර්ශවයන් වන දෙරට අතර පවතින ධනය හා තාක්ෂණය අතර වන පරතරයන් මත මෙය සිදු විය හැකි කරුණකි. මේ නිසා මෙම රාජ්‍යය ද්වය ද්වී පාර්ශවීය සම්මුතීන් ඇති කරගන්නා අරමුණු අන්‍යෝන්‍ය වශයෙන් පරස්පර විය හැකිය. ප්‍රාග්ධනය ලබාදෙන දියුණු රටවල අරමුණ සිය ප්‍රාග්ධනයට රැකවරණයක් ලබාගැනීම වන අතර අන් අතට සංවර්ධනය වෙමින් පවතින රටවල අරමුණ සිය රට වෙත ආයෝජන ආකර්ශනය කරගැනීමයි. එනම් ආයෝජකයන් වෙත ප්‍රතිඥා දෙන ආරක්ෂාවන් තුළින් ඔවුන් තුළ විශ්වාසයක් ඇති කිරීමටත් යම් රාජ්‍යයක පූර්ව ක්‍රියා හේතු කොට ගෙන එම රාජ්‍යය කෙරෙහි උද්ගත වී ඇති යම් අවාසිදායක ආකල්පයන් වේ නම් එම තත්ත්වය ඉවත් කරගැනීමටත් ඔවුන් අපේක්ෂා කරයි. එනම් යම් රාජ්‍යයක් පෙර වකවානුවක විදේශ දේපළ වන්දි නොගෙවා ජනසතු කිරීමේ ක්‍රියාවලියක නිරත වූවා නම් එමගින් එම රාජ්‍යය අවධානම් සහගත රාජ්‍යයක් බවට මතයක් උද්ගතව ඇත්නම් එම මතය තුරන් කරගැනීම සඳහා ද්වී පාර්ශවීය සම්මුතීන් ඇති කරගැනීමට පෙළඹේ. ශ්‍රී ලංකාවේ ඉතිහාසය ආශ්‍රිතව ගතහොත් 70 දශකයේ වූ සමාජවාදී ආකල්ප රැගත් රජය විසින් ජනසතු කිරීමේ කාර්යාවලියක නිරත වූ අතර එමගින් උද්ගත වූ හානිකර ආකල්ප නැතිකර දැමීම පිණිස අනතුරුව බලයට පත් වූ රජය වසර තුනක් වැනි කෙටි කාලයක් තුළ ද්වී පාර්ශවීය සම්මුතීන් හතක් ඇතිකර ගනු ලැබීය. මෙම තත්ත්වය මලයාසියාව හා සිංගප්පූරුව හා සසඳන කල එම රාජ්‍යයන්ට ද්වී පාර්ශවීය සම්මුතීන් හතක් ඇතිකර ගැනීමට වසර 12 ක කාලයක් ගත විය. කෙසේවෙතත් මේ හේතුවෙන් සිංගප්පූරුවට හෝ මලයාසියාවට වඩා අධික වූ ආයෝජන ප්‍රමාණයක් ලංකාවට ලැබුනේ යයි නිශ්චිතව පැවසිය නොහැක. මන්ද විදේශ ආයෝජන ආකර්ශනය කරගැනීමෙහිලා වඩා වැදගත් වනුයේ විදේශ ආයෝජනයන්ට වාසිදායක වන ස්වභාවයේ ආර්ථිකමය හා දේශපාලනමය වාතාවරණයක් මිස ඊට ආරක්ෂාව සලසන නීති මාලාවක් නිර්මාණය කිරීම නොවේ.

ද්වී පාර්ශවීය සම්මුතියක පවතින අත්‍යාවශ්‍ය අංග

ද්වී පාර්ශවීය සම්මුති බහුතරයක පවතින ප්‍රධාන අංගයන් අතර මූලික සමානාත්මතාවක් පවතී. සෑම ද්වී පාර්ශවීය සම්මුතියකම එහි අරමුණ දක්වන පූර්විකාවක් පවතී. එනම් දෙරට අතර අන්‍යෝන්‍ය වශයෙන් ආයෝජනයන් සිදුවීම වර්ධනය කරන බවටත් ඒවා ධෛර්යයමත් කරන බවටත් හා ආරක්ෂා කරන බවටත් ය. මෙහි දී ගිවිසුම යටතේ ආරක්ෂාව සැපයෙන දේපල තීරණය කරනු ලැබේ. සාමාන්‍යයෙන් මෙම රැකවරණයේ ක්ෂේත්‍රය තුළට චංචල, නිශ්චල ස්පර්ශනීය දේපල මෙන් ම ස්පර්ශනීය නොවන දේ ද අයත් වේ.

ආයෝජන හා ආයෝජකයන් කෙරෙහි දැක්විය යුතු සැලකීමේ සම්මතය ද ද්වී පාර්ශවීය සම්මුතීන් වල අත්‍යාවශ්‍ය අංගයකි. මන්දයත් විදේශිකයන්ට එරෙහිව සිදුවන හානි සම්බන්ධයෙන්

වූ රාජ්‍යය වගකීම පිළිබඳ සංකල්පය ආශ්‍රිතව රාජ්‍යයන් අතර කිසිසේත්ම ඒකමතිකත්වයක් නොවීය. ලතින් ඇමරිකානු රාජ්‍යයන් ඇතුළු ප්‍රාග්ධනය ලබාගන්නා රාජ්‍යයන් (capital importing states) මේ සම්බන්ධයෙන් ජාතික සම්මතය මෙහිලා අදාල විය යුතු බව දැක්වීය. රාජ්‍යයන්ගේ ආර්ථිකමය අයිතිවාසිකම් හා යුතුකම් පිළිබඳ චාටර් පත්‍රයෙහි 2 (2) c ව්‍යවස්ථාව මගින් ද ජාතික සම්මතය පිළිබඳව දක්වයි. කෙසේවෙතත් ප්‍රාග්ධනය ලබාදෙන රාජ්‍යයන් (capital exporting states) මෙහිලා අන්තර්ජාතික අවම සම්මතය අදාල විය යුතු බව දක්වයි. මන්ද ජාතික සම්මතය පිළිගතහොත් එමගින් ආයෝජකයා වෙත ලැබිය හැකි ආරක්ෂාව අවම විය හැකි බැවිනි. නිදසුනක් ලෙස සත්කාරක රාජ්‍යය දේපල අයිතිවාසිකම් කෙරෙහි බලපෑම් සිදුකරන ස්වභාවයේ පනතක් පැනවූවහොත් හා එම පනත එම රටේ වෙසෙන දේශීය මෙන්ම විදේශීය පුද්ගල දෙකොට්ඨාශයටම බලපාන බවට තීරණය කළොත් එහිලා විදේශිකයාට ජාත්‍යන්තර නීතිය යටතේ සහනයක් ලද නොහැක. නමුත් මෙම තත්ත්වය ප්‍රතික්ෂේප කරන ප්‍රාග්ධනය ලබාදෙන රාජ්‍යයන් අන්තර්ජාතික අවම සම්මතය පිළිගන්නේ, එමගින් සත්කාරක රාජ්‍යය විදේශීය ආයෝජකයා වෙත සලකන ආකාරය නිරතුරුවම ජාත්‍යන්තර පරීක්ෂාවට යටත් කළ හැකි බැවිනි. නමුත් මෙම ජාතික සම්මතය පෙර දී මෙන් පූර්ණ ලෙසින් ප්‍රතික්ෂේප කිරීමක් වර්තමානයේ දක්නට නැත. මන්දයත් බොහෝ රාජ්‍යයන් එම රාජ්‍යයන්හි වැදගත් ආර්ථිකමය අංශ සහ වරප්‍රසාද එම රටේ පුරවැසියන්ට පමණක් සීමාකර ගැනීමක් සිදුවන නිසා එවන් රටක ජාතික සම්මතය අදාල කර ගැනීම විදේශිකයන්ට වඩා වාසිදායක විය හැකිය. මන්ද විදේශිකයන්ට ද දේශීය පුරවැසියන් භුක්ති විඳින වරප්‍රසාද එක සේ භුක්ති විඳිය හැකි බැවිනි. මේනිසා වර්තමානයේ ජාතික සම්මතය පිළිගැනීමටත්, යම්හෙයකින් සත්කාරක රාජ්‍යය විදේශ ආයෝජකයන්ට එම සැලකිල්ල නොදක්වයි නම් එහිලා එම රාජ්‍යයේ වගකීම උද්ගත කරවීමටත් ප්‍රාග්ධනය ලබාදෙන රාජ්‍යයන් නැඹියාවක් දක්වයි.

මෙලෙස විදේශ ආයෝජකයන් කෙරෙහි දැක්විය යුතු සම්මතය සම්බන්ධයෙන් රාජ්‍යයන් අතර ඒකමතිකත්වයක්

නොමැති නිසා ද්වි පාර්ශවීය සම්මුතීන් ඇති කර ගැනීමෙන් එහිලා එකඟත්වයක් ඇතිකර ගැනීමට වර්තමාන රාජ්‍යයන් පෙළඹ ඇත. මන්දයත් ද්වි පාර්ශවීය සම්මුතීන් ඇතිකර ගැනීමේ එක් අරමුණක් වන්නේ විදේශ ආයෝජන ආශ්‍රිතව ඇති අවිනිශ්චිතතාවන් නිරවුල් කර ගැනීමයි.

මෙහි දි ද්වි පාර්ශවීය සම්මුතීන් මගින් තෙයාකාරයක සැලකීමේ සම්මතයන් පිළිබඳව දක්වයි. සමහර ද්වි පාර්ශවීය සම්මුතීන් සාධාරණ සහ යුක්ති සහගත (just and equitable) ලෙස සැලකීමේ සම්මතය පිළිබඳව දක්වයි. මෙම සම්මතය තරමක් අපැහැදිලි වන අතර එහිලා විවිධාකාරයේ අර්ථ නිරූපණයන් පැනනැගී ඇත. එනම් සියලුම විදේශ ආයෝජන කෙරෙහි එක හා සමාන අයුරින් සැලකීම සාධාරණය සඳහා නොවේ නම් එහිලා ජාතික සම්මතයෙන් ඉවත්ව ගොස් ඊට වෙනස් අයුරකින් සැලකීමට අවකාශ සැලසෙන බවයි. එනම් නිදසුනක් ලෙස ආයෝජකයන් අතර වර්ගීකරණයක් කිරීම සාධාරණ වේ නම් එහිලා එක් කොටසකට එක් ආකාරයකිනුත් අනිත් කොටසට තවත් ආකාරයකිනුත් සැලකීම සාධාරන වන බවයි.

සමහරු දක්වන්නේ මෙම සම්මතය මගින් ජාතික සම්මතය පමණක් නියෝජනය කරන බවයි. ඉන් අදහස් වන්නේ සත්කාරක රාජ්‍යයට කිසිසේත්ම සිය රටේ පුරවැසියන් හා විදේශීය පුද්ගලයන් අතර වෙනසක් අනුගමනය කළ නොහැකි බවත් එවන් වෙනස්කමක් කරයි නම් එය අන්තර්ජාතික නීතිය යටතේ රාජ්‍ය වගකීම උද්ගත කිරීමට තුඩු දෙන බවයි. එනම් ආර්ථිකමය වශයෙන් වලංගු වූ හේතුවක් පැවතිය ද එවන් වෙනස් කොට සැලකීමක් සාධාරණීකරණය කළ නොහැකි බවයි.

මෙහිලා වන තවත් සම්මතයක් නම් සැලකීමේ ඉහළම සම්මතය (Most favoured nation treatment) වේ. මින් අදහස් වන්නේ ද්වි පාර්ශවීය සම්මුතියක පාර්ශවයන් වන රාජ්‍යයන් දෙකම විසින් ඊට පාර්ශවයක් නොවන රටක පුරවැසියන් වෙත යම් වාසිදායක සැලකිල්ලක් ලබාදෙයි නම් ගිවිසුමට පාර්ශවයන් වන දෙරටෙහිම පුරවැසියන්ට එම සැලකීමේ සම්මතය අදාල වන බවයි.

සමහර ද්වී පාර්ශවීය සම්මුතීන් ජාතික සම්මතය හා සැලකීමේ ඉහළම සම්මතය යන දෙකම පිළිබඳ ප්‍රතිපාදන ඇතුළත් කරයි. එමගින් සම්මතයන් දෙකෙන් වඩා වාසිදායක වන සම්මතයේ ප්‍රයෝජනය අයැද සිටීමට රාජ්‍යයන් දෙකටම හැකියාව ලැබෙයි.

උපයන ලාභ නැවත සිය රට වෙත යැවීම

සෑම විදේශ ආයෝජනයකම ප්‍රධාන අභිමතාර්ථය වනුයේ ලාභ ඉපැයීමත් එලෙස උපයන ලාභ සිය මව් රාජ්‍ය වෙත යැවීමත් ය. එමනිසා යම්හෙයකින් සත්කාරක රාජ්‍යය විදේශ ආයෝජකයා සතු මෙම අයිතිය වළකාලයි නම් විදේශ ආයෝජනයක මුඛ්‍ය අභිමතාර්ථය ව්‍යාර්ථ වෙයි. එමනිසා ද්වී පාර්ශවීය සම්මුතීන් ඇතිකර ගැනීමේ දී මෙම අයිතිය ආරක්ෂා කරදීම එක් මූලික අරමුණක් වී ඇත. බොහෝ ද්වී පාර්ශවීය සම්මුතීන් මෙහිලා පරම අයිතියක් ලබා දුන්නද එය එතරම් ප්‍රයෝගික නොවේ. මන්ද යම් රටක මූල්‍යමය වශයෙන් අර්බුදයක් පැනනැගුනහොත් එහිලා එම රාජ්‍ය පාර්ශවය ද්වි පාර්ශවීය ගිවිසුමක් යටතේ තවද රාජ්‍යයක් වෙත මෙහිලා පරම අයිතියක් ලබා දී තිබුනද අදාල විනිමය සීමා නීති පැනවීමට සිදුවෙයි. එක්සත් රාජධානිය විසින් ඇති කරගෙන ඇති බොහෝ ද්වී පාර්ශවීය සම්මුතීන් වල උපයන ලාභ සිය මව් රාජ්‍ය වෙත යැවීමට වන අයිතිය විශේෂ මූල්‍යමය හෝ ආර්ථිකමය අවස්ථාපිත සාධක යටතේ සීමා වන බව දක්වයි. තවද ගිවිසුම්වල උපයන ලාභයෙන් යම් නිශ්චිත ප්‍රතිශතයක් මූල්‍යමය අර්බුදයක් පැවතිය ද අනිවාර්යෙන්ම යැවිය යුතු බවට ප්‍රතිපාදන දැක්වේ. එනම් කිනම් තත්ත්වයක් උද්ගත වුව ද ඒ බව නොසලකා එම නිශ්චිත ප්‍රමාණය සෑම වසරකම යැවීමට අවකාශ සලසා දීමේ වගකීමක් පවතින අතර එවන් විශේෂිත තත්ත්වයක් පැනනැගී නැත්නම් සාමාන්‍ය පරිදි මෙම අයිතිය ක්‍රියාත්මක කළ හැකි වේ.

මෙම අයිතිය ආශ්‍රිතව පිළිගෙන ඇති නීති තත්ත්වය නම් මෙහිලා පූර්ණ අයිතියක් ද්වී පාර්ශවීය සම්මුතිය යටතේ සලසා දී තිබුන ද එය රාජ්‍යයක් මත බැඳීම් සහගත නොවන බවයි. මෙහිලා වන තර්කය නම් මූල්‍යමය අර්බුදයක් පැන නැගී ඇති කළ උද්ගත වූ අවස්ථාපිත සාධක නොවෙනස්ව පවතින තාක් කල් නම් වූ

න්‍යාය (rebus sic stanti bus) එතැනට ආදේශ වී එලෙස උද්ගතව ඇති නවතම තත්ත්වය හේතුවෙන් ලාභ සිය රට වෙත යැවීමට ලබා දුන් පූර්ණ අයිතිය පිළිබඳ ප්‍රතිපාදනයේ බලපැවැත්ම ශූන්‍ය වී යන බවයි. මෙම ප්‍රතිපාදන යටතේ උපයන ලාභ පමණක් නොව වෙන යම් ආකාරයක හෝ ගෙවීමක්, අයිතියක් හෝ රාජ්‍ය භාගයක් (royalty) විදේශ ආයෝජකයා වෙත ලැබිය යුතු නම් එම සියලුම ඉපැයීම් මව් රාජ්‍යය වෙත යැවීමේ අයිතිය ලැබේ.

ජනසතු කිරිම හා වන්දි ගෙවීම

ජනසතු කිරීම යනු විදේශ ආයෝජකයකු මුහුන දෙන බලවත්ම තර්ජනය වේ. ප්‍රාග්ධනය ලබාදෙන රාජ්‍යයන් නොයෙකුත් උපක්‍රම අනුගමනය කරමින් මෙම අයිතිය සීමා කර දැමීමට උත්සාහ ගනියි. නමුත් යම් යම් ව්‍යතිරේඛයන්ට යටත්ව රාජ්‍යයන් සතු ජනසතු කිරීමට වන අයිතිය ජාත්‍යන්තර නීතිය පිළිගෙන තිබේ. එහෙයින් පරස්පර කරුණු ස්ථාපනය කරයි නම් මිස නූතන නීතිය යටතේ සෑම ජනසතු කිරීමක්ම නීත්‍යානුකූල යයි සලකනු ලැබේ. ජනසතු කිරීමක දී වෙනස් කොට සැලකීමක් නොවිය යුතු බවටත්, එය මහජන අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා විය යුතු බවටත් රාජ්‍යයන් අතර ඉතා පුළුල් පිළිගැනීමක් පවතී. එහෙයින් එම කාරණා පදනම් වන කොන්දේසි මොනවාදැයි යන්න පිළිබඳව ද්වී පාර්ශවීය සම්මුතීන් වල ප්‍රතිපාදන දැක්වීම සාමාන්‍ය වශයෙන් සිදුවේ. වර්තමාන ජාත්‍යන්තර නීතිය යටතේ ජනසතු කිරීමක නීත්‍යානුකූලභාවය නිර්ණය කිරීමේ දී ඉහත කී සාධක ඉතා වැදගත් වන නමුත් යම් ප්‍රශ්නගත ජනසතු කිරීමක දි වෙනස් කොට සැලකීමක් පවතින බව ස්ථාපනය කිරීම ඉතා දුෂ්කර වනු ඇත. මන්දයත් ජනසතු කිරීම පාදක වූ යම් පැහැදිලි ආර්ථිකමය සාධකයක් වේ නම් ජනසතු කිරීමට හේතු වූ එකම හේතුව එය බවට සත්කාරක රාජ්‍යයට තර්ක කළ හැකි බැවිනි.

මේ ආශ්‍රිතව ද්වී පාර්ශවීය සම්මුතියක වන ප්‍රතිපාදන මගින් සෘජු ජනසතු කිරීමක් මෙන් ම වක්‍ර (indirect / creeping expropriation) ජනසතු කිරීමක් ද, සත්කාරක රාජ්‍යය විසින් පනවන නීතීන් මගින් සූක්ෂම ලෙස සිදුකරන විදේශ ආයෝජකයන්ගේ දේපල අයිතීන් සූරා ගැනීමක් ද එමගින් අරක්ෂා වේ.

මේ ආශ්‍රිතව ජනසතු කිරීමක නීත්‍යානුකූල භාවයට වඩා ප්‍රශ්න සහගත වී ඇත්තේ එහිලා සිදුකරන වන්දි ගෙවීමයි. මේ ආශ්‍රිතව ද රාජ්‍යයන් ජාත්‍යන්තර වශයෙන් ඒකමතික වන නීතියක් නිර්මාණය කිරීමට අපොහොසත්ව ඇති හෙයින් රාජ්‍යයන් ද්වී පාර්ශවීය සම්මුතීන් යටතේ අදාල නීති ප්‍රතිපාදන ගෙනහැර දක්වීමට නැමියාවක් දක්වයි. ප්‍රාග්ධනය ලබාදෙන රාජ්‍යයන් වෙසෙසින්ම ඇමරිකාව ස්ථිර වශයෙන්ම වන්දි ගෙවීමේ සම්මතය ලෙස hull මූලධර්මය (doctrine) යටතේ සම්පූර්ණ වන්දිය (full compensation) එනම් වහා, ප්‍රමාණවත් හා කාර්යක්‍ෂම වන්දියක් ගෙවිය යුතු බව දක්වයි. මේ යටතේ ජනසතු කිරීමට ලක් වූ දේපළේ සම්පූර්ණ වටිනාකම වන්දි වශයෙන් ගෙවිය යුතු බව දක්වයි. මීට ප්‍රතිවිරුද්ධ ලෙස සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයන් සාමූහිකව ''ප්‍රමාණවත් වන්දියක්'' (adequate compensation) යන සම්මතයට කැමැත්ත දක්වයි. මෙය වඩා නම්‍යශීලි සම්මතයක් සේ දක්විය හැක්කේ එහිලා ගෙවිය යුතු වන්දි ප්‍රමාණය තීරණය කිරීමේදී විවිධ සාධක එනම් ආයෝජකයා විසින් උපයන ලද අධික ලාභ, ඔහු විසින් පරිසරාත්මක වශයෙන් හෝ සමාජීය වශයෙන් සිදුකළ හානි වැනි සාධක ගෙවිය යුතු වන්දිය නිර්ණය කිරීමේ දී සලකා බැලිය හැකි වීමයි. සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයන් තවදුරටත් දක්වන්නේ වන්දි ගෙවීමේ දී අදාල ප්‍රමාණය තීරණය කිරීමේ බලය හිමිවන්නේ සත්කාරක රාජ්‍යයේ ගෘහස්ථ අධිකරණ හෝ පර්ෂද වලට පමණක් බවයි.

මෙයාකාරයට රාජ්‍යයන් අතර මේ ආශ්‍රයෙන් පවතින පරස්පර විරෝධි මතිමතාන්තර හේතුවෙන් ද්වී පාර්ශවීය සම්මුතීන් යටතේ මෙම සියලු ආකාරයේ අවිනිශ්චිතතාවන් ගිවිසුමේ දෙපාර්ශවය සම්බන්ධයෙන් තුරන් කිරීම සඳහා පියවර ගනු ලැබෙයි. සමහර රාජ්‍යයන් විසින් වෙනත් රටවල් සමග එළඹෙන ද්වී පාර්ශවීය සම්මුතීන් වල දී ඒ ඒ රාජ්‍යයේ ස්වභාවය මත පොරොන්දු වන සම්මතය එකනෙකට වෙනස් වේ. එක්සත් රාජධානිය සමග ඇති කරගත් බොහෝ ද්වි පාර්ශවීය ගිවිසුම්වල Hull මූලය දැකිය හැකි මුත් ඉන් වෙනස්ව යන අවස්ථා ද දැකිය හැකි ය. නිදසුනක් ලෙස බ්‍රිතාන්‍ය සමගින් Antigua, Hungary සහ Poland යන රාජ්‍යයන්

විසින් ඇතිකරගත් ද්වී පාර්ශවීය සම්මුතීන් වල Hull මූලය දක්නට නැත. සිංගප්පූරුව විසින් ඇති කරගත් ද්වී පාර්ශවීය සම්මුතීන් වලද විවිධාකාර ස්වභාවයේ සම්මතයන් දැකිය හැකිය. ඔවුන් එක්සත් රාජධානිය හා ස්විට්සර්ලන්තය අතර ඇති කරගත් ද්වී පාර්ශවීය සම්මුතීන් වල දී Hull මූලය අදාල කරගත්ත ද නෙදර්ලන්තය හා ජර්මනිය සමග ඇතිකරගත් ගිවිසුම්වල දී සාධාරණ වන්දියක් පිළිබඳව පමණක් දක්වීය. ප්‍රංශය හා ඇතිකරගත් ද්වී පාර්ශවීය සම්මුතියෙහි දක්වූයේ 'අපසර්ජනය' සිදුවූ දිනයට වත්කම් වල වානිජ වටිනාකම ගෙවිය යුතු බවත් ය. ලන්දේසීන් විසින් ඇතිකරගත් ද්වී පාර්ශවීය සම්මුතීන් වල සාධාරණ වන්දියක් දක්වූව ද ඔස්ට්‍රේලියාව සෑම ගිවිසුමක දීම Hull මූලය ඇතුලත් කරගැනීමට සමත්ව ඇත. තවද සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයන් අතර උද්ගතව ඇති ද්වී පාර්ශවීය සම්මුතීන් වල ද Hull මූලය දක්නට ඇත. නිදසුනක් ලෙස ශ්‍රී ලංකාව සිංගප්පූරුව හා කොරියාව සමග ඇති කරගත් ද්වී පාශ්වීය සම්මුතීන් දැක්විය හැකිය. මෙවන් වෙනස්කම් සිදුකිරීමේ දී බොහෝදුරට රාජ්‍යයන්හි ගිවිසුම් ඇතිකර ගැනීමේ ප්‍රබල භාවය හේතු වේ.

මෙහිලා ද්වී පාර්ශවීය සම්මුතීන් ඇතිකරගත් කාල වකවානුව ද වැදගත් වේ. එනම් විදේශ ආයෝජනයන් අවශ්‍ය තරම් පවතී නම් එහිලා ආයෝජන ආකර්ශනය කරගැනීම සඳහා ඉහළ ආකාරයේ සම්මතයන් ලබාදීමට රාජ්‍යයන් යුහුසුළු නොවනු ඇත නමුත් විදේශ ආයෝජනයන් ආකර්ශනය කරගැනීම කෙරහි රාජ්‍යයන් අතර ප්‍රබල තරගකාරිත්වයක් පවතී නම් එහි දී Hull මූලය වැනි ඉහළ සම්මතයක් පොරොන්දු වීමට සත්කාරක රාජ්‍යයට සිදුවනු ඇත. එසේම අවධානම් සහගත ඉතිහාසයක් ඇති රාජ්‍යයන් ද තමා වෙත ඇති එම ආකල්පයන් දුරුකර ගැනීමේ අදහසින් විශාල ප්‍රාග්ධන හැකියාවන් ඇති රාජ්‍යයන් ආකර්ශනය කරගැනීමේ දී Hull මූලය යොදාගැනීමට පෙළඹෙයි. විශේෂයෙන්ම චීනය සහ වියට්නාමය විසින් ඇතිකරගත් ද්වී පාර්ශවීය සම්මුතීන් බහුතරයකම වූයේ Hull මූලයයි. එසේම තවද සමහර රාජ්‍යයන් වෙසෙසින්ම දියුණු වෙමින් පවතින රාජ්‍යයන් මෙහිලා ද්විත්ව සම්මතයක් අනුගමනය කරනු ලැබේ. එනම් පොදුවේ Hull මූලයට එරෙහි ප්‍රතිපත්තියක් අනුග

මනය කරන මුත් තමා විසින් ඇතිකරගනු ලබන ද්වී පාර්ශවීය සම්මුතීන් වලදී විදේශ ආයෝජකයන් ආකර්ශනය කරගැනීමේ පරමාර්ථයෙන් Hull මූලය උපයෝගී කරගනියි.

එසේම සිංගප්පූරුව වැනි කාර්මිකකරණයට බඳුන් වූ ධනවත් දියුණු වෙමින් පවතින රාජ්‍යයන් හා ද්වී පාර්ශවීය සම්මුතීන් වලට එළඹීමේ දී Hull මූලය අදාල කරගැනීමේ තවද හේතුවක් පවතී. එනම් මෙහි වන අරමුණ ධනවත් දියුනු වෙමින් පවතින රාජ්‍යයක් ආකර්ශනය කරගැනීමම නොවේ. එම රාජ්‍යයන් තුළ ක්‍රියාත්මක වන බහුජාතික සමාගම් ආකර්ශනය කරගැනීම ද මෙහි යම් අදහසකි. මන්දයත් මෙම බහුජාතික සමාගම් සිංගප්පූරුවේ සංස්ථාපිත පුද්ගලයන් ලෙස සැලකෙන නිසා ඔවුන්ට ද මෙම ද්වී පාර්ශවීය සම්මුතීන් වල අන්තර්ගත වන ප්‍රතිපාදනයන්හි ප්‍රයෝජන ලද හැකිය. මෙමගින් එම සමාගම් ආකර්ශනය කරගැනීමේ හැකියාව ද අදාල රාජ්‍යයන්ට ලැබෙයි. මේ අනුව වන්දි ගෙවීම හා එහිලා අදාල වන සම්මතයන් ගත්කල රාජ්‍යයන් අනුගමනය කරන ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ඒකමතිකත්වයක් නොමැති අතර බහුතර රාජ්‍යයන් ප්‍රමාණයක් Hull මූලය පිළිගන්නා අතර ඉතිරි රාජ්‍යයන් ප්‍රමාණවත් හෝ සාධාරණ මූලය යන්න පිළිගෙන ඇත.

පොරොන්දු, සහතිකවීම් එලෙසම ඉටුකරන බවට වන ප්‍රතිපාදන

එනම් අන්‍යෝන්‍ය වශයෙන් රාජ්‍යයන් තම තමන්ගේ රටවල පුරවැසියන් වෙත යම් යම් පොරොන්දු ඉටුකරන බවට ප්‍රතිඥා දී ඇත්නම් ඒවා එලෙසම ඉටුකිරීමේ අවශ්‍යතාව පිළිගන්නා ප්‍රතිපාදන ද ද්වී පාර්ශවීය සම්මුතීන් වල දක්නට ඇත. නිදසුනක් ලෙස වන්දි නොගෙවා ජනසතු කිරීම් නොකරන බවට, විදේශ ආයෝජකයා උපයන ලාභ මව් රාජ්‍ය කරා යැවීමට අවකාශ සලසාදෙන බවට යනා දී වශයෙන් යම් සහතිකවීම් විදේශ ආයෝජකයා වෙත ලබා දී ඇත්නම් හා ඒවා ද්වී පාර්ශ්වීය සම්මුතීන්හි අන්තර්ගත වූ යම් විශේෂිත වගන්තියකින් ආවරණය වී නොමැති නම් ඒවා සම්බන්ධයෙන් මෙම ප්‍රතිපාදනයේ ආරක්ෂාව සැපයේ. එසේම සත්කාරක රාජ්‍යය තුළ පවතින යම් විදේශ ආයෝජන ආශ්‍රිතව පවතින නීතියක් මගින් ප්‍රතිඥා දී ඇති යම් රැකවරණයක් පවතී ද ඒවා මෙම වගන්තියේ ක්ෂේත්‍රය තුළට අයත් වේ.

ගිවිසුම් සහගත ප්‍රතිඥාවන් අනුසාරයෙන් ද මෙම වගන්තියේ ආවරණය ලබාදීමට උත්සාහයක් පවතී. එනම් විදේශ ආයෝජන ඇතුලත් කරගැනීමේ දී විදේශ ආයෝජකයාගේ අයදුම්පත සලකා බලන මූලික අවස්ථාවල දී රාජ්‍යය විසින් හෝ එහි නියෝජිත මහජන අධිකාරයක් (ආයෝජන මන්ඩලය වැනි) විසින් ආයෝජකයා වෙත යම් ප්‍රතිඥාවක් ලබා දී ඇත්නම් එවන් ප්‍රතිඥා ඉටු නොකිරීම මෙම ප්‍රතිපාදනය යටතේ වගකීම උද්ගත කිරීමට හේතු වේ. යම් හෙයකින් සත්කාරක රාජ්‍යය හා විදේශ ආයෝජකයා අතර උද්ගතව ඇති විදේශ ආයෝජන ගිවිසුමක ස්ථායිකරණ ප්‍රතිපාදනයක් (stabilization clause) වේ නම් ද්වී පාර්ශවීය සම්මුතියෙහි ප්‍රතිඵලයක් වශයෙන් සත්කාරක රාජ්‍යයට එම ගිවිසුමට ප්‍රතිවිරුද්ධ වන ස්වභාවයේ අනාගත නීති පැනවිය නොහැකි යයි විදේශ ආයෝජකයාට තර්ක කළ හැකි දැයි මෙහිලා ප්‍රශ්නයක් පැන නගියි. නමුත් මෙවන් තර්කයක් ඉදිරිපත් කිරීමේ දුෂ්කරතාව නම් එම ආයෝජන ගිවිසුම් සත්කාරක රාජ්‍යය සමග ඍජුව ඇති කරගත් ඒවා නොවීමයි. එනම් ඒවා රජයේ නියෝජිත ආයතන සමග ඇති කරගත් ගිවිසුම් බැවින් එම ආයතන විසින් ලබාදෙන ලද ප්‍රතිඥාවන් මගින් හා සහතිකයන්ගෙන් රජය බැඳීමට යටත් වේ දැයි ප්‍රශ්නයක් හටගනියි. එම නිසා ද්වී පාශ්වීය සම්මුතීන් වල අන්තර්ගත වන ප්‍රතිපාදන, මෙම ආයතන විසින් ලබාදුන් සහතික කිරීම් වලට අදාල නොවෙතැයිද එමගින් රජය බැඳීමට යටත් නොවෙතැයි ද රජයට තර්ක කළ හැකි ය. නමුත් පරිපාලනමය ස්වභාවයේ පොරොන්දු එනම් යම් ව්‍යාපාරයක සාර්ථක ලෙස නිරත වීම සඳහා අවසර පත්‍ර, බලපත්‍ර යනාදිය ලබාදෙන බවට පොරොන්දු වී ඇත්නම් එවන් ආකාරයේ සහතික වීම් මෙම ප්‍රතිපාදනයේ ආවරණය තුළට අයත්වනු ඇත. කෙසේවෙතත් මෙම ප්‍රතිපාදනය මගින් රාජ්‍යයක පරමාධිපත්‍ය බලය හා ඊට නීති පැනවීමට ඇති හැකියාව කොතරම් දුරට සීමා කරයිද යන්න එතරම් පැහැදිලි නැත.

යුදමය වශයෙන් හෝ ජාතික වශයෙන් පැන නැගෙන හදිසි තත්ත්වයක් නිසා හටගන්නා විපත් සඳහා වන්දි ගෙවන බවට වන ප්‍රතිපාදනය

එනම් සත්කාරක රාජ්‍යය තුළ හටගන්නා යුද්ධයක් සිවිල් ආරවුලක් හෝ හදිසි අවස්ථාවක් පැනනැගීම නිසා විදේශ ආයෝජකයාගේ දේපලවලට හානි සිදුවුනොත් එහිලා වන්දි ප්‍රදානය කරන බවට ආයෝජන සම්මුතීන්හි ප්‍රතිපාදන අන්තර්ගත වෙයි. මෙහිලා සාමාන්‍ය වශයෙන් ජාතික සම්මතය උපකාරී කරගන්නා අතර ඒ අනුව ඉහත කී ලෙස සිදුවන හානිදායක අවස්ථාවලදී සත්කාරක රාජ්‍යය සිය දේශයේ පුරවැසියන්ට වන්දි ගෙවීමට තීරණය කරයි නම් සමාන ආකාරයටම විදේශ ආයෝජකයා වෙත ද වන්දි ප්‍රදානය කිරීමට සිදු වේ. මෙම ප්‍රතිපාදනය තවදුරටත් දක්වන්නේ රජයේ හමුදා විසින් විදේශ ආයෝජකයා සතු දේපළ අත්පත් කරගතහොත් හෝ ඔවුන්ගේ ක්‍රියා හේතුවෙන් ඊට හානි සිදුවුනොත් එහිලා ද වගකීම උද්ගත වේ. එහෙත් යුද්ධයක ප්‍රතිඵලයක් වශයෙන් හෝ උද්ගතව ඇති අවස්ථාව අනුව එවන් විපතක් සිදුවීම වළක්වාලීමට නොහැකි නම් එවන් විපත් සම්බන්ධයෙන් විදේශ ආයෝජකයා වෙත වගකීමට සිදු නොවේ.

AAPL vs Republic of Sri Lanka[1] නඩුවේ දී ශ්‍රී ලංකාව හා එක්සත් රාජධානිය අතර පැවති ද්වි පාර්ශවීය සම්මුතියෙහි අන්තර්ගත මෙවන් ප්‍රතිපාදනයක් ප්‍රශ්න සහගත විය. මෙම ආරවුල උද්ගත වූ වකවානුවේ Hong Kong, එක්සත් රාජධානියේ රක්ෂිත රාජ්‍යයක් ව පැවති බැවින් ඉහත රාජ්‍යයන් දෙක අතර පැවති ද්වි පාර්ශවීය සම්මුතියේ ප්‍රයෝජනය Hong Kong දේශයට ද ලද හැකි විය. මෙහිලා පැන නැගි ප්‍රශ්නය වූයේ Hong Kong සතුව තිබූ ගොවිපොලට ශ්‍රී ලාංකික හමුදාව මගින් සිදු වූ හානි සඳහා වන්දි අයැද සිටිය හැකි ද යන්නයි. එනම් ශ්‍රී ලාංකික යුද හමුදාව ද්‍රවිඩ ත්‍රස්තවාදීන්ට එල්ල කළ ප්‍රහාරයක ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාව සහ Hong Kong එකතුව වවුනියා ප්‍රදේශයේ පිහිට වූ ගොවිපොල හානියට පත්විය. අදාල වගන්තිය යටතේ දක්වා තිබුනේ සම්පූර්ණ රැකවරණය හා සුරක්ෂිතභාවය ලබාදෙන බවයි. එහෙයින් අදාල විදෙස් දේපල රැකදීමේ ඉහළ ප්‍රමාණයක වගකීමක් ලංකාවට ඇති බව පැමිණිලිකාර සමාගම තර්ක කරන ලදී.

1. (1991) 30 ILM 577

ආරවුල් නිරාකරණය

බොහෝ ද්වි පාර්ශවීය සම්මුතීන් යටතේ විදේශ ආයෝජන ආශ්‍රිතව උද්ගත වන ආරවුල් බේරුම්කරණය තුළින් අපක්ෂපාති විනිශ්චයාසනයක දී නිරාකරණය කරගැනීම සඳහා නීති සම්පාදනය කර ගනියි. බේරුම්කරණය සඳහා ඉදිරිපත් කිරීමේ වගකීම් ඉස්මතු කරන මෙම ප්‍රතිපදාන විවිධාකාර වේ. අවම වශයෙන් වන ප්‍රතිපාදන යටතේ, විදේශ ආයෝජන ආශ්‍රිතව උද්ගත වන ආරවුල් නිරාකරණය පිණිස බේරුම්කරණය වෙත පාර්ශවයන් යොමු කරනු ලැබේ. එනම් මෙවන් ප්‍රතිපාදනයක් මගින් බේරුම්කරණය පිළිබඳව හුදු සඳහනක් දැක්වීම පමනක් සිදුකරන අතර ආරවුල් බේරුම්කරණයට යොමු කිරීමේ අනිවාර්යය වගකීමක් කිසිදු පාශ්වයක් වෙත නොපවරයි. උපරිම වශයෙන් වන ප්‍රතිපාදන යටතේ විදේශ ආයෝජකයාට විදේශ ආයෝජනය ආශ්‍රිතව උද්ගත වන ආරවුලක දී සිය නඩුව ඔහු විසින්ම ICSID බේරුම්කරණය වෙත ඉදිරිපත් කිරීමේ අවස්ථාව සලසාදෙයි. ද්වි පාර්ශවීය සම්මුතීන්හි අන්තර්ගත වන මෙවන් ප්‍රතිපාදනයක් විදේශ ආයෝජනය ආරක්ෂා කිරීම සඳහා වන මූලික පියවරක් සේ සැලකිය හැකිය. මන්ද මේ යටතේ අපක්ෂපාති විනිශ්චයාසනයක් වෙත විදේශ ආයෝජකයාට ඍජු ප්‍රවේශයක් පැවතීම ඉතා වැදගත් වේ. මන්දයත් සත්කාරක රාජ්‍යයේ අධිකරණය විසින් හෝ වෙනත් යුක්තිය ඉටුකරන විනිශ්චයාසනයක් විසින් විදේශ ආයෝජන ආශ්‍රිතව උද්ගත වන ආරවුල් අපක්ෂපාති ලෙස විසඳනු ඇති බවට විදේශ ආයෝජකයා වෙත විශ්වාසයක් නොමැති වීම පිළිගත හැකි කරුණකි. එමනිසා එවැන්නකු වෙත යුක්තිය ඉටු කරලීම සඳහා අපක්ෂපාති විනිශ්චයාසනයක් ඉදිරියේ පවතින බේරුම්කරණයක් උචිත වන බව පාරම්පරිකව පවා පිළිගැනුණි. මේනිසා ජාත්‍යන්තර සම්මුතියක් මගින් විදේශ ආයෝජකයා වෙත මෙම අයිතිය සුරක්ෂිත කරදීම විදේශ ආයෝජකයාගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිණිස ඉතාමත් යෝග්‍ය වන බව පෙන්වා දිය හැකිය.

කෙසේ වෙතත් සෑම ද්වි පාර්ශවීය සම්මුතියක් මගින්ම මෙලෙසින් සත්කාරක රාජ්‍යය අනිවාර්ය බැඳීමකට යටත් කරන ස්වභාවයේ ප්‍රතිපාදන අන්තර්ගත කරන බව නිශ්චිතව

පැවසිය නොහැකිය. මන්දයත් සමහර සම්මුතීන් දක්වන පරිදි බේරුම්කරණයට ආරවුල යොමු කිරීමට පෙරාතුව එය සමථය මගින් නිරාකරණය කරගැනීම පිණිස උත්සාහ ගත යුතු වේ. විශේෂයෙන්ම චීනය විසින් ඇති කරගත් සම්මුතීන් සමථය සම්බන්ධයෙන් එම රාජ්‍යය දක්වන රුචිකත්වය පැහැදිලි කරමින්, සෑම ද්වී පාර්ශවීය සම්මුතියකම මෙවන් ප්‍රතිපාදනයක් පවතී. කෙසේවෙතත් මෙලෙස බේරුම්කරණයට පෙර සමථය පිළිබඳව උත්සාහ දැරිය යුතු බව දක්වන ප්‍රතිපාදනයක් පවතින විටෙක එහිලා සමථයට යොමු කිරීමේ කාලය සීමාකර ඇතොත් මිස, නොඑසේ නම් යම් යම් උපක්‍රම මගින් ආරවුල බේරුම්කරණය පිණිස ඉදිරිපත් කිරීම සත්කාරක රාජ්‍යයට පමා කළ හැකිය.

මෙලෙස බේරුම්කරණය පිණිස බලාත්මක ප්‍රතිපාදනයක් පැවතීමට නම් බේරුම්කරණය සඳහා ආරවුල යොමු කිරීම අනිවාර්ය විය යුතු අතර එලෙස යොමු කිරීමේ අයිතිය ඍජුවම විදේශ ආයෝජකයා වෙත ලබා දිය යුතුයි. කෙසේ වෙතත් ද්වී පාර්ශවීය සම්මුතියක අන්තර්ගත මෙවන් ප්‍රතිපාදනයක ප්‍රයෝජන ලැබීමට නම් සත්කාරක රාජ්‍යය හා විදේශ ආයෝජකයා අතර පවතින ගිවිසුමේ බේරුම්කරණ ප්‍රතිපාදනයක් තිබීම ද අවශ්‍ය වේ. මෙහිලා සම්මුතිය මගින් සිදුකරනුයේ විදේශ අයෝජන ගිවිසුම යටතේ පවතින ප්‍රතිපාදනයට බලාත්මකභාවයක් ලබා දීමයි. එනම් එවන් බේරුම්කරණ ප්‍රතිපාදනයක් පවතිද්දීත් සත්කාරක රාජ්‍යය ආරවුල බේරුම්කරණය වෙත යොමු කිරීම ප්‍රතික්ෂේප කරයි නම් එහි දී විදේශ ආයෝජකයා අයත් මව් රාජ්‍යය වෙත සත්කාරක රාජ්‍යය විසින් ලබාදුන් ප්‍රතිඥාවක් කඩකිරීමක් සේ සලකනු ලැබෙයි. එනම් විදේශ ආයෝජන ගිවිසුම යටතේ ආරවුල බේරුම්කරණය සඳහා යොමු කිරීමේ වගකීම ඍජු ලෙස ආයෝජකයා වෙත වන බැඳීමක් වුව ද, සත්කාරක රාජ්‍යය එකී යුතුකම උල්ලංඝනය කරයි නම් එහි වගකීම ද්වී පාර්ශවීය සම්මුතියේ ප්‍රතිඵලයක් ලෙස උද්ගත වන්නේ විදේශ ආයෝජකයා අයත් මව් රාජ්‍යය සම්බන්ධයෙනි.

ජනසතු කිරීම (අපසර්ජනය)
Nationalisation and Expropriation

හැඳින්වීම

ජනසතු කිරීමක් දේපල පැහැර ගැනීමකින් වෙනස් කොට හඳුනාගත යුතුයි. දේපල පැහැර ගැනීමක් (confiscation of property) යනු රටේ පාලකයන් විසින් සිය පෞද්ගලික ප්‍රයෝජනය සඳහා සිදු කරන දේපල පවරා ගැනීමකි. දේපල පැහැර ගැනීමක් තුළින් සිදු කරන අත්පත් කර ගැනීමකින් රාජ්‍යයකට කිසිදු ප්‍රයෝජනයක් අත් නොවේ. ජනසතු කිරීම හෝ අපසර්ජනය තුළින් රාජ්‍යයක් දේපලක් අත්පත් කර ගන්නේ ආර්ථික වාසියක් අරමුණු කරගෙනය.

අතීතයේ දී විදේශ ආයෝජනයන් නොතිබිණි. තනි පුද්ගලයින් රටින් රටට ධනය සොයා ගිය බල විරහිත පුද්ලගලයන් විය. ඔවුන්හට සත්කාරක රාජ්‍යයන් හෝ ඒකාධිපති පාලකයන් විසින් සිදු කරන නීතිවිරෝධී දේපල අත්පත් කර ගැනීම් වලක්වා ගැනීමට හැකියාවක් නොවීය. මෙම තනි පුද්ගලයින්ගේ ආරක්ෂාව පිළිබඳව, ඔවුන්ගේ මූල්‍යමය අයිතිවාසිකම් සහ දේපලමය අයිතිවාසිකම් රැක ගැනීම සඳහා නීතින් සකස් කිරීමට ජාත්‍යන්තර නීතිය උත්සුක විය.

වර්තමානයේ බහුතර විදේශ ආයෝජකයන් වන බහුජාතික සමාගම් අතීතයේ සිටි තනි පුද්ගලයින් මෙන් බල විරහිත තත්ත්වයක නොසිටියි. ඔවුන් බොහෝ සත්කාරක රාජ්‍යයන්ට වඩා බලසම්පන්න පුද්ගලයින් වේ. ජනසතු කිරීම ආශ්‍රිත අතීත නීතිය වර්තමාන තත්ත්වයට වඩා සම්පූර්ණ වෙනස් අවස්ථාවක්

අරමුණු කරගෙන නිර්මාණය වූවක් වෙයි. පෞද්ගලික අරමුණු මුදුන් පමුණුවා ගැනීම පිණිස නීතිවිරෝධී ලෙස දේපල බලෙන් පවරා ගැනීමට විරෝධය පෑමක් ලෙස නිර්මාණය වූවකි. මෙයින් ආරක්ෂා කිරීමට අපේක්ෂා කරනු ලැබුවේ බල විරහිත තනි පුද්ගලයින් හෝ කුඩා පුද්ගල කණ්ඩායම් වේ. එබැවින් මුල්කාලීනව ජාත්‍යන්තර නීතිය විසින් සත්කාර රාජ්‍යයට එරෙහිව දැඩි වූත් අනම්‍ය වූත් නීතියක් පිළිගනු ලැබිණ. වෙනත් අරමුණු පාදක කර ගනිමින් ඇති වූ මෙම අතීත නීතිය ඒ ආකාරයෙන්ම වර්තමානයේ සිදුවන නීත්‍යානුකූල ජනසතු කිරීම් සම්බන්ධයෙන් පවා අදාළ කර ගැනීම කොතෙක් දුරට සාධාරණ වේදැයි ප්‍රශ්නයක් උද්ගත වේ. එයට හේතුව දේපල පැහැර ගැනීමක් වර්තමානයේ උද්ගත නොවන බැවිනි. නමුත් සිදුව ඇත්තේ වර්තමානයේ උද්ගත වන්නා වූ නීත්‍යානුකූල ජනසතු කිරීම් ආශ්‍රිතව පවා අතීත නීතිය ඒ ආකාරයෙන්ම අදාළ කර ගැනීමකි. මෙයට හේතුව ඉහත දැක්වූ විභේදනය නිසි ලෙස අවබෝධ කර නොගැනීමයි. රාජ්‍යයක් සිය ආර්ථිකමය අරමුණු මුදුන්පත් කර ගැනීමේ අරමුණින් සිදු කරන ජනසතු කිරීමක් ජාත්‍යන්තර නීතිය උල්ලංඝනය කිරීමක් සේ සැලකිය නොහැක.

අපසර්ජනය හෝ ජනසතු කිරීම සම්බන්ධයෙන් ජාත්‍යන්තරව ස්ථාපිත වූ නීති පද්ධතියක් නොමැත. මෙයට හේතුව රාජ්‍යයන් අතර පවතින්නා වූ විවිධාකාර වෙනස්කම්ය. එනම්, ධනවාදී සහ සමාජවාදී වශයෙන් රාජ්‍යයන් දේශපාලනික වශයෙන් බෙදී පවතින අතර දියුණු වෙමින් පවතින රාජ්‍යයන් සහ දියුණු රාජ්‍යයන් වශයෙන් ආර්ථිකමය වශයෙන් ද බෙදී පවතී. මෙකී වෙනස්කම් ජනසතු කිරීම ආශ්‍රිතව ඒකාබද්ධ නීතියක් නිර්මාණය නොවීමට හේතු වී ඇත. දියුණු රාජ්‍යයන් ඉදිරිපත් කරන තර්කය වන්නේ ජනසතු කිරීමක් ජාත්‍යන්තර නීතිය පිළිගත් ප්‍රතිපත්තීන් මත සිදු විය යුතු බවයි. නමුත් දියුණු වෙමින් පවතින රාජ්‍යයන් දක්වන්නේ ජනසතු කිරීමක් පදනම් වන සියලුම කොන්දේසි සහ නියමයන් තීරණය කළ යුත්තේ සත්කාරක රාජ්‍යය සිය අභිමතානුකාරී බලය භාවිත කරමින් බවයි.

Starrett Housing Corporation vs Iran[1] නඩු තීරණයේ දී ගිවිසුම් සහගත අයිතිවාසිකම් දේපල යන වචනයේ අර්ථයට අයත් නොවන බව දැක්වින. නමුත් Anglo Iraian Oil Company[2] නඩුවේ දී දැක්වූයේ විදේශිකයෙකු ගිවිසුමක් යටතේ අත්පත් කර ගත් අයිතිවාසිකම් පවා දේපල යන වචනයේ අර්ථ නිරූපණයට අයත් වන බවයි. එමනිසා ජාත්‍යන්තර නීතිය දේපල අයිතිවාසිකම් කෙරෙහි ලබා දී ඇති රැකවරණය ගිවිසුම් සහගත අයිතිවාසිකම් කෙරෙහිද අදාළ වන බවයි.

Schufeldt Claim[3] මෙහි දී ඇමරිකා එක්සත් ජනපද සමාගමක් හා ගෝතමාලාව අතර මෙම ප්‍රශ්නය පැන නැගුණි. ගෝතමාලාව ව්‍යවස්ථාමය නියෝගයක් පනවා ඇමරිකාවට බණිජ වර්ගයක් ලබා ගැනීම සඳහා ලබා දී තිබුණු සහනදායී එකඟත්වය එහි කාලය ඉකුත් වීමට පෙර අවසන් කරන ලදී. බේරුම්කාර මණ්ඩලය ගෝතමාලාව විසින් ඇමරිකා එක්සත් ජනපද සමාගම වෙත වන්දි ගෙවිය යුතු බව තීරණය කරන ලදී.

Amoco Internationl Finance Corporation vs Iran[4] නඩු තීන්දුව ඇමරිකා එක්සත් ජනපද සමාගමක් හා ඉරානය අතර ඇති වූ සංධීය ව්‍යාපාරයක් ආශ්‍රිතව උද්ගත වූවකි. ඇමෙරිකානු සමාග මක් හා ඉරානය විසින් පාලනය කරන ලද සමාගමක් එකතු වී Khemco නමැති සංධීය ව්‍යාපාරය පිහිටුවන ලදී. මෙම ව්‍යාපාරයේ අයිතිය හා කළමනාකරණය ආයතන දෙකටම හිමි විය. මෙම ගිවිසුම අවුරුදු 35 ක කාලයක් සඳහා ඇති විය. නමුත් 1979 ඉරාන විප්ලවයෙන් පසුව ඉරානය ව්‍යවස්ථාවක් පනවා සිය ආර්ථිකය ජනසතු කිරීමේ ව්‍යාපෘතියකට යටත් කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස සංධීය ව්‍යාපාරය අවලංගු සහ බල විරහිත බවට පත් විය. මෙමගින් සංධීය ව්‍යාපාරය යටතේ හිමිවුණු ගිවිසුම් සහගත අයිතිවාසිකම් අහිමි වූ නිසා වන්දි ලැබිය හැකි බව බේරුම්කරණ මණ්ඩලය තීරණය කරන ලදී.

1. (1987) 16 Iran – US CTR 112
2. (1952) ICJ Reports 93
3. (1930) 5 AD 179
4. (1987) 15 Iran – US CTR 189

රාජ්‍යයන් විසින් දේපල අත්පත් කර ගැනීම ඍජුව මෙන්ම ව්‍යංගව ද සිදු කරයි. මුල්කාලීනව පිළිගත් තත්ත්වයන්ට අනුව විදේශීය පුද්ගලයකුගේ දේපල අයිතිවාසිකම් කිසිදු ආකාරයකින් අත්පත් කර ගත නොහැක. වර්තමානයේ රාජ්‍යය පරමාධිපත්‍ය බලය මත රජයකට සිය දේශ සීමාව තුළ පවතින දේපල හා ව්‍යාපාර සම්බන්ධයෙන් තමන් කැමති තීරණයක් ගැනීමට හැකිය. වර්තමානයේ රාජ්‍යයක් විදේශකයකුගේ දේපලක් අත්පත් කර ගත් පමණින්ම එය ජාත්‍යන්තර නීතිය උල්ලංඝණය වීමක් සේ පිළිනොගනී. එයට හේතුව රාජ්‍යය පරමාධිපත්‍ය බලයයි.

Siderman de Blake vs Republic of Argentina[5] නඩුවේ දී තීරණය වූයේ දේපල අත්පත් කර ගැනීම මුළුමනින්ම නීති විරෝධී බවයි. එයට හේතුව වූයේ දේපල අත්පත් කර ගැනීම පදනම් වූයේ විදේශිකයන්ගේ ජාතිකත්වය මතයි. එය වෙනස් කොට සැලකීමක් බව නීතිය පිළිගන්නා ලදී. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය ජාතිකයන් සතු දේපල ජනසතු කරනු ලැබුවේ ආර්ථික ස්වෛරීයභාවය රඳවා ගැනීමට මිස ජාතිකත්වය මත වෙනස් කොට සැලකීමට නොවේ. මහජන අරමුණු මුදුන් පමුණුවා ගැනීමක් මත මෙලෙස වෙනස් කොට සැලකීමක් සාධාරණීකරණය කළ හැකි නම් එමගින් ජාත්‍යන්තර නීතිය උල්ලංඝනය වීමක් සිදු නොවේ.

ජනසතු කිරීම නිර්වචනය

මින් අදහස් කරන්නේ රාජ්‍ය ආයතනයක් විසින් යමෙකු සතු දේපළ අහිමි කිරීම හෝ දේපළ පිළිබඳ භාරකාරත්වය හා පාලනය කෙනෙකුගෙන් ස්ථිර වශයෙන්ම අහිමි කිරීමයි. ඉහත කී නිර්වචනයට අනුව ජනසතු කිරීමක් හා අපසර්ජනය කිරීමක් නීත්‍යානුකූල වීම පිණිස වැදගත් වන කරුණු හයකි.

1.මෙහිලා දේපළ පවරා ගැනීමක් සිදු වී ද?

2. එම දේපළ පවරා ගැනීම, ජනසතු කිරීම හා අපසර්ජනය පිළිබඳ නීතිමය රාමුව තුළ සිදු වී ද?

3. එම පවරා ගැනීම රජය විසින් සිදු කළේ ද?

5. 965 F 2d 699 (1992)

4. එම පවරා ගැනීම අන්තර්ජාතික නීතිය යටතේ නීත්‍යානුකූල වේ ද?

(අ) එම පවරා ගැනීම මහජන අරමුණු උදෙසා කරන ලද්දක් ද?

(ආ) එමගින් වෙනස් කොට සැලකීමක් සිදු නොවූයේ ද?

(ඇ) ප්‍රමාණවත් වන්දි ගෙවීමක් සිදු වී ද?

5.අගය නිර්ණය කිරීම සඳහා උපයෝගි කරගත් ක්‍රම මොනවා ද?

6. ජනසතු කළ රාජ්‍යය සිය ක්‍රියාව සාධාරණීකරණය කිරීම පිණිස නිදහසට කරුණු දැක්වීමක් සිදු කළා ද?

ඉහත දැක්වූ කරුණු හයේ අදාළත්වය පිළිබඳ ව Kalamazoo Spice Extraction Co. v. Provisional Military Government of Socialist Ethiopia[6] (U.S 1984) නඩුවේදී සැලකිල්ලට භාජනය විය. මෙහි කරුණු නම් මිචිගන් (Michigan) නම් වූ ඇමරිකා එක්සත් ජනපද සමාගමක් ඉතියෝපියාවේ කුළුබඩු නිෂ්පාදනය කිරීමේ අරමුණින් කටයුතු ආරම්භ කළේය. ඔවුන්ගේ ප්‍රධාන අරමුණු වූයේ ගම්මිරිස් උපයෝගි කර ගෙන Paprika නම් වූ නිෂ්පාදනයක් කිරීමයි. මිචිගන් සමාගම මෙම ආයෝජන කාර්යාවලිය ඉතියෝපියානු පුරවැසියන් විසින් ස්ථාපනය කරන ලද සමාගමක් වූ Ethiopian Spice Extraction Co. (ESESCO) සමග සන්ධිය ව්‍යාපාරයක් වශයෙන් ආරම්භ කරන ලදී. Kalamazoo spice Extraction Co. (Kal – Spice) නම් වූ මිචිගන් සමාගමට ඉහත කී සන්ධිය ව්‍යාපාරයෙහි 80% ක කොටස් ප්‍රමාණයක් හිමි වූ අතර ඉතිරිය ඉතියෝපියානු පුරවැසියන්ට හිමි විය. ඇමරිකානු සමාගම විසින් ව්‍යාපාරයට අවශ්‍ය ප්‍රාග්ධනය යෙද වූ අතර නිෂ්පාදන පහසුකම් හඳුන්වා දී ඉතියෝපියානු පුරවැසියන් අවශ්‍ය රැකියා සඳහා පුහුණු කොට ඉතියෝපියානු ගොවීන් වෙත ගම්මිරිස් නිපදවීම සඳහා නවතම තාක්ෂණය ඥානය ද හඳුන්වා දුන්නේය. වසර ගණනාවකට පසු 1970 දී සමාගම නිෂ්පාදන ආරම්භ කළ අතර එය සීඝ්‍ර ලෙස ලාභ ලැබීය.

6. 729 F.2d 422 (6th Cir. 1984)

Haile Selassie විසින් වසර 40 ක් ඉක්මවන කාලයක් ඉතියෝපියාවේ බලය දැරූ අතර 1974 දී කැරලිකාරී කණ්ඩායමක් විසින් ඔහුව නෙරපා එහි බලය අල්ලා ගති. 1975 දී මෙම නව ආණ්ඩුව විසින් ඉතියෝපියාවේ පෞද්ගලික අංශය සතු දේපළවලින් සැහෙන ප්‍රමාණයක් ජනසතු කිරීමට නියෝගයක් නිකුත් කළේය. නව ආණ්ඩුවේ ප්‍රතිපත්තිය වූයේ ඉතියෝපියානු කාර්මික කටයුතු සමාජවාදී ප්‍රතිපත්තීන්ට අනුව කරගෙන යාමයි. මේ අනුව ප්‍රශ්නගත සන්ධීය ව්‍යාපාරයේ කොටස්වලින් බහුතර බලය අඩුකොට එය 40% දක්වා අඩු කිරීමට තීරණය කළේය. ඊට අමතරව අදාළ සමාගමේ පාලනය හා අධිකරණ බලය ද නව ආණ්ඩුව විසින් පවරා ගති. මේ අනුව ESESCO සම්බන්ධයෙන් Kal – spice සතු වූ 80%ක අයිතිය 40% දක්වා අඩු කෙරිණි. අදාළ ජනසතු කිරීමේ නියෝගය මගින් වන්දි ගෙවීමත් පිළිබඳ ව සඳහන් කළ ද කිසිදු ගෙවීමක් සිදු නොකළේය. ඉතියෝපීය ආණ්ඩුව විසින් අදාළ කරුණු නිරවුල් කිරීම පිණිස වන්දි කොමිසමක් පත් කළේය. මෙම කොමිසම මගින් නඩු ගණනාවක් සලකා බලනු ලැබුව ද එහි කිසිදු වර්ධනයක් නොවීය. එහෙයින් ඉතියෝපියාව වෙත දැක් වූ සහායන් ඇමරිකානු සමාගම විසින් නවතා දමන ලදී. 1981 දී මිචිගන් ව්‍යාපාරය වෙත පවරා ගත් කොටස්වල පොත්ගත අගයෙන් (book value) අඩක් ගෙවීමට යෝජනා කළේය. නමුත් මිචිගන් ව්‍යාපාරය සම්බන්ධයෙන් වූ තම අයිතිවාසිකම්වල සම්පූර්ණ වටිනාකම වන්දි වශයෙන් අයැද සිටියේය. ඔවුන් පැවසුවේ 1953 දී ඇමරිකාව හා ඉතියෝපියාව අතර ඇති වූ මිත්‍රත්ව, වෙළෙඳ හා යාත්‍රණ (Friendship, Commerce and Nevigation - F.C.N.) සම්මුතියට අනුව එය මිත්‍රත්වය හා ආර්ථිකමය සබඳතා තහවුරු කරන සම්මුතියක් වූ බැවින් සම්පූර්ණ වන්දි ලැබීමේ අයිතියක් පවතින බවයි.

එම සම්මුතියේ පහත දැක්වෙන වගන්තියක් අන්තර්ගත විය.

"සිය දේශසීමාව තුළ ගිවිසුම්කාර පාර්ශවයක, ජාතීන්ට සහ සමාගම්වලට අයත් දේපළට හෝ දේපළමය අයිතීන්ට නිරතුරුවම ආරක්ෂාව හා රැකවරණය ලබාදිය යුතුය. එවන් දේපළ මහජන සුබ සිද්ධිය සඳහා මිස නොමැතිව පවරා ගැනීම සිදු නොකළ යුතුය. එසේ පවරා ගැනීමක දී එහිලා සාධාරණ හා කාර්යක්ෂම වන්දි මුදලක් වහා පිරිනැමිය යුතුය."

1978 දී අදාළ සන්ධීය ව්‍යාපාරය විසින් ඇමරිකානු සමාගම ට (Kal- spice) එරෙහිව එමගින් විකුණු සහ භාරදුන් භාණ්ඩ සඳහා ඇමරිකාවේදී නඩු පැවරීය. එනම් ජනසතු කිරීමට පෙර Kal – spice වෙත නැව්ගත කළ සහ ඊට පසු ඔවුන් සතු වූ භාණ්ඩ සම්බන්ධයෙනි. නමුත් Kal spice ඊට එරෙහිව තර්ක කළේ ඉතියෝපියානු සමාගම ඉතියෝපීය රජයේ ආයතනයක් බැවින් ඔවුන්ගෙන් පවරා ගත් කොටස්වල සම්පූර්ණ වටිනාකම ගෙවන ලෙස නියම කරන ලෙසයි.

නමුත් 1982 දී ඇමරිකානු දිසා උසාවිය Kal spice ඉල්ලීම ප්‍රතික්ෂේප කරමින් පැවසුවේ රාජ්‍යමය ක්‍රියා පිළිබඳ න්‍යාය (act of state doctrine) යටතේ ඉතියෝපියානු ආණ්ඩුවේ ක්‍රියාව නීත්‍යානුකූල වන බවත් සහ FCN සම්මුතිය තුළ වූ සාධාරණ හා කාර්යක්ෂම වන්දියක් වහා ගෙවිය යුතු බවට වන ප්‍රතිපාදනය පැහැදිලි නොවන බවත් ය. එහිදී තර්ක කරනු ලැබුවේ එක් රටක දේශසීමාව තුල සිදුවන ක්‍රියාවන් සම්බන්ධයෙන් කරුණු විභාග කිරීමට තවද රටක අධිකරණයක් ඉදිරිපත් නොවන බවයි.

නමුත් ඉහල උසාවිය පහළ උසාවියේ තීන්දුව වෙනස් කරමින් පැවසුවේ රාජ්‍යමය ක්‍රියාවක් නම් වූ මූලධර්මය මගින් මෙහිලා අධිකරණය සතු බලය යටපත් නොකරන බවයි. ඔවුන් පැවසුවේ සම්මුතිය නිරවුල් බවත් අපසර්ජනය කරන දේපළ සම්බන්ධයෙන් වන්දි ගෙවීමේ දී අන්තර්ජාතික නීතිමය මූලධර්ම අනුව පිළිගත් සම්මතිය මෙහි ඇතුළත් වන බවයි. මේ අනුව පාර්ශවයන් අතර වූ FCN සම්මුතිය මගින් රාජ්‍යමය ක්‍රියාවක් නම් වූ මූලධර්මය සම්බන්ධයෙන් ව්‍යතිරේකයක් පිළිගෙන ඇති බවයි. මෙහිදී උසාවිය ඇමෙරිකාව හා වෙනත් රටවල් අතර පැවති FCN සම්මුතීන් කෙරෙහි අවධානය යොමු කළේය. මෙම FCN සම්මුතීන් ඇමෙරිකාව විසින් සිය ජාතිකයින් සහ විදේශ රටවල පවතින ඔවුන්ගේ අයිතිවාසිකම් සුරැකීම සඳහා II ලෝක සංග්‍රාමයෙන් පසුව පිළිගන්නා ලද ඒවාය. මේ සෑම ගිවිසුමකම අපසර්ජනය

කළ දේපළ සඳහා ප්‍රමාණවත් හා කාර්යක්ෂම වන්දියක් වහා ගෙවිය යුතු බව දක්වයි. මෙලෙස වන්දි ගෙවීම සම්බන්ධයෙන් පවතින මේ සම්මතය පෘථුල ලෙස අදාළ කර ගැනීමේ හේතුවෙන් ඊට අන්තර්ජාතික වශයෙන් පිළිගැනීමක් ඇති බවට සැලකිය යුතුයැයි ඔවුන් දැක්වීය. මේ අනුව ඉහල උසාවිය විසින් එම නඩුව විසඳීමට පහළ අධිකරණයට අධිකරණ බලය ඇති බව දක්වමින් එය නැවත පහළ අධිකරණය වෙත යොමු කළේය. මේ අනුව ESESCO ඉතියෝපියානු රජයේ නියෝජිත ආයතනයක් බව දක්වමින් එහිලා වූ පාඩුව විභාග කිරීමට අධිකරණ බලය ඇති බව දැක්වීය. මේ අනුව එම ආයතනය වාණිජමය අරමුණුවල නිරතව සිටි බැවින් රාජ්‍යමය ක්‍රියාවක් නම් වූ මූලධර්මයෙහි රැකවරණය ලැබීමට නුසුදුසු බව තීරණය කළේය.

මෙහි පවරා ගැනීමක් පැවතියේ ද?

Kalamazoo දී ඉතියෝපියානු ආණ්ඩුව පැවසුවේ Kal – spice ට අයත් කොටස්වලින් 40%ක් පමණක් එමගින් ලබාගත් බවත් එමනිසා එහි පැහැර ගැනීමක් නොවූ බවත් ය. නමුත් මේ පැහැර ගැනීම නිසා Kal – spice වෙත වූ ව්‍යාපාරයේ පාලනය අහිමි වූ නිසා එමගින් පැහැර ගැනීමක් සිදු වූ බව තීරණය විය.

මෙහිදී පැහැර ගැනීම සෘජුවම හෝ ව්‍යංගයෙන් සිදු විය හැකිය. සෘජු පවරා ගැනීමක් යනු අයිතිය එලෙසම පවරා ගැනීමයි. ව්‍යංග පවරා ගැනීම විවිධ මට්ටම්වලින් සිදුවිය හැකිය. මෙලෙස ව්‍යංග පවරා ගැනීමක් තුළින් සිදු කරන මැදිහත් වීම එක් අවස්ථාවකදී creeping expropriation ලෙස සැලකීමට ප්‍රමාණවත් අවස්ථාවක් හටගනී.

අපසර්ජන රීතින්ගේ අර්ථානුකූලව මෙහි දේපළ පවරා ගැනීමක් සිදුවී ද?

Kalamazoo දී ඉතියෝපීය ආණ්ඩුව තර්ක කළේ kal- spice ට අහිමි වූයේ ඔවුන්ට ESESCO වෙත වූ කොටස් අයිතිය පමණක් බැවින් හා කොටස් යනු ස්පර්ශනීය නොවන දේපළක් වන බැවින් ඒවා දේපළ යන්නට අයත් නොවන

බවයි. ඉතියෝපියානු ආණ්ඩුව පැවසුවේ ඉතියෝපියානු සහ ඇමරිකානු යන නීති පද්ධති දෙක යටතේම සමාගමක් විසුරුවා හැර අවසන් වන තුරු සමාගමේ කොටස් හිමියන්ට එහි වත්කම් සම්බන්ධයෙන් සෘජු අයිතියක් නොමැති බවයි. එමනිසා ඉතියෝපියානු ආණ්ඩුව තර්ක කළේ ඔවුන් ESESCO හි බහුතර කොටස් මිස එහි වත්කම් අත්පත් කරගත් නොගත් නිසා මෙහි අපසර්ජන නීතිය යටතේ දේපළ පවරා ගැනීමක් නොවූ බවයි. මෙම මතය ප්‍රතික්ෂේප කරමින් අධිකරණය පැවසුවේ ස්පර්ශනීය වත්කම් පවරා ගැනීම හා සමාගමේ පාලනයේ අයිතිය හා හැකියාව අහිමි කරන පරිදි එහි කොටස් අහිමි කිරීම අතර වෙනසක් දැක්විය නොහැකි බවයි. එනම් මේ පවරා ගැනීම තුළින් වත්කම සහ ලාභය පාලනය කිරීමේ හැකියාව අහිමි වීම නිසා අධිකරණයට එහිලා මැදිහත් විය හැකි බවයි. විදේශිකයන්ට සිදුවන හානි සම්බන්ධයෙන් රාජ්‍යයන්ගේ ජාත්‍යන්තර වගකීම පිළිබඳ ව 1961 හාවර්ඩ් සම්මුතිය පැනවීමේ දී ද මේ නඩු තීරණයේ අර්ථ නිරූපණය උපයෝගි කර ගනිමින් පැවසුවේ සියලුම චංචල, නිශ්චල, ස්පර්ශනීය හා ස්පර්ශනීය නොවන එනම් දේපළ පිළිබඳ අයිතිවාසිකම් හා හිමිකම් යන සියල්ල ඊට අයිති වන බවයි.

දේපළ පවරා ගැනීම රජය විසින් සිදු කරන ලද්දක් ද?

Kalamazoo දී පැන නැඟුණ ප්‍රශ්නය ESESCO රජයේ ආයතනයක් ද යන්නයි. Kalamazoo නඩු තීන්දුවට පෙර ඇමරිකානු ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කරනු ලැබුවේ පහත අවස්ථා යටතේ ස්වාධීන ආයතනයක් බවට වන පූර්ව නිගමනය නොසලකා හරින බවයි.

1. රජය විසින් අදාළ සමාගම ඉතා බරපතල ලෙස පාලනය කිරීම නිසා රජය හා ආයතනය අතර ප්‍රධාන නියෝජිත සබඳතාවයක් ගොඩ නැංවී ඇත්නම්,

2. ස්වධීන නෛතික පුද්ගලභාවය පිළිගැනීමෙන් වංචාවක් හෝ අසාධාරණයක් ස්ථාපනය වේ නම් යන අවස්ථා වලදීය.

උසාවිය පැවසුවේ ඉතියෝපීය ආණ්ඩුව ESESCO සම්බන්ධයෙන් ඍජු පාලනයක් ක්‍රියාත්මක කළ බවයි. රජය විසින් අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් බහුතරයක් පත් කිරීමෙන්, එහි චෙක්පත්‍ර බොහෝමයක් ලබා ගැනීමෙන්, අදාළ වියදම් අනුමත කිරීමෙන් හා ESESCO විසින් සිදු කරන නැව්ගත කිරීම් සඳහා සිය මුද්‍රාව තැබීමෙන් මේ බව පැහැදිලි වෙතැයි තීරණය විය. මේ අනුව රජය විසින් දේපළ පවරාගත් බවත් සාධාරණමය මූලධර්ම යටතේ ESESCO හි සංස්ථාපිත භාවය නොසලකා හැරිය යුතු බවත් තීරණය කළේය.

අන්තර්ජාතික නීතිය යටතේ එම දේපළ පවරා ගැනීම නීත්‍යානුකූල ද? නැද්ද ?

චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතිය යටතේ භාවිතය තුළින් අන්තර්ජාතික චාරිත්‍ර බිහිවන අතර මේවා සාමාන්‍ය වශයෙන් පිළිපැදීම තුළින් නීතියක් ලෙස පිළිගනියි. අපසර්ජනය සම්බන්ධ චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතිය මගින් එකිනෙක හා සට්ටනය වන න්‍යායන් තුනක් නියෝජනය කරයි.

1. Hull Doctrine

මෙම න්‍යාය එවකට ඇමෙරිකාවේ රාජ්‍ය ලේකම් වශයෙන් කටයුතු කළ Cordell Hull විසින් ඇමරිකාව සතු තෙල් අයිතිවාසිකම් මෙක්සිකන් රජය විසින් අපසර්ජනය කළ අවස්ථාවේදී නිර්මාණය කරනු ලැබුවකි. මෙය සාමාන්‍ය වශයෙන් බටහිර රටවල් අනුගමනය කරන තත්ත්වයකි. ඉන් පවසන්නේ විදේශිකයන්ගේ දේපළමය අයිතිවාසිකම් අසාධාරණ ලෙස ඔවුන්ට වෙනස් ලෙස සැලකමින් රජය විසින් පවරා නොගත යුතු බවත්, පවරා ගැනීම මහජන සුබ සිද්ධිය සඳහා පමණක් විය යුතු බවත් එහිලා ප්‍රමාණවත් හා සාධාරණ වන්දියක් වහා ගෙවීය යුතු බවත් ය. බටහිර

රටවල පවසන්නේ 1962 දී මහා මණ්ඩලය (General Assembly) විසින් ස්වාභාවික සම්පත් පිළිබඳ රාජ්‍යය සතු ස්ථිර පරමාධිපත්‍යය බලය (permanent sovereneignty over natural resources) පිළිගැනීමෙන් එය තවදුරටත් තහවුරු වූ බවය. ඉන් පවසන්නේ පරමාධිපත්‍ය මෙහෙය වන රාජ්‍ය විසින් අනුගමනය කරන ක්‍රමවලට සහ ජාත්‍යන්තර නීතියට අනුකූලව සුදුසු වන්දි ගෙවිය යුතුය.

2. Calvo Doctrine

ලතින් ඇමෙරිකානු රාජ්‍යයන් විසින් හඳුන්වා දෙන ලද්දකි. සැලකීමේ සමානාත්මතාවක් පිළිගත යුතු බව පිළිගනිමින් ඔවුන් පවසනුයේ සත්කාරක රටේ ජාතිකයන්ට ඉහලින් යන වරප්‍රසාද භුක්ති විඳීමේ අයිතියක් විදේශිකයන් වෙත නොමැති බවයි. එමනිසා ඔවුන්ට සිදුවන හානිවලට පිළියම් සෙවීය යුත්තේ දේශීය අධිකරණයන් තුළින් බවයි.

3. නව අන්තර්ජාතික ආර්ථික න්‍යාය NIEO (New International Economic Order) Position

මේ තත්ත්වය 1974 දී මහා මණ්ඩලය විසින් රාජ්‍යයන් සහ ආර්ථික අයිතීන් හා යුතුකම් දක්වමින් පිළිගනු ලැබීය. ඉන් පවසනුයේ දේශීය නීතින්ට අනුකූලව විදේශිකයන්ගේ දේපළට සැලකිය යුතු බවත් දේශීය නීතියට තමා සුදුසු යැයි සිතන ක්‍රමයක් එහිලා අනුගමනය කිරීමට අන්තර්ජාතික නීතිය ඉඩහල යුතුයැයි මින් පිළිගන්නා බවත්ය.

මහජන අරමුණු පිළිබඳ න්‍යාය (Public Purpose Doctrine)

බටහිර රටවල් පිළිගන්නා පරිදි විදේශිකයන්ගේ දේපළ අයිතිවාසිකම් මහජන අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා මිස අත්පත් කර නොගත යුතුයි. මෙය Hull න්‍යායට සමාන වේ. නව අන්තර්ජාතික ආර්ථික න්‍යායෙහි මහජන අරමුණු යන අවශ්‍යතාව අන්තර්ගත නොවන නිසා එය බටහිර විචාරකයන් විසින් විවේචනය කරයි. නමුත් වෙනත් අය මෙහිලා පවසන්නේ මෙම අවශ්‍යතාව අන්තර්ගත නොවීම එතරම් වැදගත් නොවන බවයි.

මන්ද රාජ්‍යයන් මහජන අරමුණු යන අවශ්‍යතාව තීරණය කිරීමේ දී අනුගමනය කරන පදනමේ වලංගුභාවය අභියෝග කිරීම සඳහා පිළිගත් අන්තර්ජාතික පරීක්ෂණයක් නොවීමයි. මේ අනුව පවරා ගැනීම මුළුමනින්ම අසාධාරණ නොවී නම් මහජන අරමුණු පිළිබඳ අවශ්‍යතාව පිළිපැද ඇතැයි සාමාන්‍යයෙන් තීරණය කරනු ලැබේ.

විදේශිකයන් වෙත නොවෙනස්ව සැලකීමේ න්‍යාය

Hull න්‍යාය මගින් පවසන්නේ අඩුම වශයෙන් විදේශිකයන්ට යම් රටක් එම රටේ පුරවැසියන්ට හා ඔවුන්ගේ දේපළවලට ලබාදෙන රැකවරණය ලබාදිය යුතු බවයි. රටක් වෙනස් කොට නොසැලකීමේ න්‍යාය උල්ලංඝනය කොට ඇත්ද යන්න තීරණය කිරීමේ දී එම රාජ්‍යයේ චේතනාව කෙරෙහි අවධානය යොමු කළ යුතු බව මහාචාර්ය Brownlie පවසයි. පවරා ගැනීම ආර්ථික හෝ සාමාජීය ප්‍රතිපත්ති මුදුන් පමුණුවා ගැනීම පිණිස කරයි නම් එය සාධාරණ වන අතර එමගින් යම් පුද්ගල කොට්ඨාශයකට බලපෑමක් වුවද එය වෙනස්කොට සැලකීමක් නොවන බවයි.

නව අන්තර්ජාතික ආර්ථික න්‍යායෙහි මෙම නොසැලකීමේ න්‍යාය පිළිබඳ ව ද අන්තර්ගත නොවීය. මේ පිළිබඳ ව අන්තර්ගත නොවුව ද කරුණු කිහිපයක් නිසා එය එතරම් වැදගත් නොවන බව සමහරුන්ගේ මතයයි. මන්ද,

1.මෙම න්‍යාය *Jus Cogens* බවට පත්ව ඇත.

2. මහාචාර්ය Baade පවසන්නේ මෙය කෙසේවත් චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතියේ කොටසක් නොවූ බවයි. ඔහුට අනුව රාජ්‍යයන්ට තමා ගනුදෙනු කරන්නේ කා සමග ද යන්න තීරණය කළ හැකි සේම එම ගනුදෙනු නවතා දැමීමේ අයිතිය ද පවතින බවයි. ඒ අනුව යම් පවරා ගැනීමක් එහි නීත්‍යානුකූල භාවය තීරණය කරන අන් පරීක්ෂණ හා එකඟ වෙයි නම් එය වෙනස්කොට නොසැලකීමේ පරීක්ෂණය සමඟින් එකඟ නොවූ පමණින් නීති විරෝධි නොවන බවයි. මේ අනුව පැවසිය හැක්කේ දේපළ පවරා ගැනීම පළිගැනීමේ චේතනාවකින් කරන ලද්දක් නොවී නම් විදේශිකයන්ට වෙනස් ලෙස සැලකූ සෑම පවරා ගැනීමක්ම අවශ්‍යයෙන්ම නීති විරෝධි නොවන බවයි.

කුමන වන්දියක් ගෙවිය යුතු ද?

මේ පිළිබඳව ජාත්‍යන්තර නීතිය තුළ විශාල මතභේදයක් පවතී. මේ ආශ්‍රිතව එකිනෙක හා ගැටෙන න්‍යායයන් තුනක් පවතී. ජාත්‍යන්තර නීතිය පවසන්නේ, ජනසතු කිරීමකදී සාධාරණ වන්දියක් (just compensation) ගෙවිය යුතු බවයි. නමුත් බටහිර රටවල් මෙම සාධාරණ යන වචනය 'සම්පූර්ණ' ලෙස අර්ථ නිරූපණයකට උත්සාහ දරා ඇත. Hull මූලය පවසන්නේ සම්පූර්ණ වන්දිය යන්නෙන් කාරණා තුනක් අදහස් වේ. එනම් වහා (prompt), ප්‍රමාණවත් (adequate), ක්‍රියාකාරී/කාර්යක්ෂම (effective) යන්න සම්පූර්ණ වන්දිය යන්නෙන් අදහස් වේ. ඒ අනුව Hull මූලයෙන් පවසන්නේ වහා, ප්‍රමාණවත් හා කාර්යක්ෂම වන්දියක් ගෙවිය යුතු බවයි. මේ පරීක්ෂණය චාරිත්‍රානුකූලව අන්තර්ජාතික නීතියේ කොටසක් දැයි යන ප්‍රශ්ණය මෙහිදී මතුවේ.

චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතිය ඇති වුනේ රාජ්‍යයන්ගේ අනුගමනය කිරීමත් තුළිනි. එනම් එවන් අනුගමනය කිරීමක් නීතිය බව අවබෝධ කර ගැනීමෙනි. මහාචාර්ය Schacter දක්වන්නේ ජාත්‍යන්තර බේරුම්කරණ පර්ෂද වන්දි ගෙවිය යුතු බව දැක්වුවද ඒවා මගින් ඉහත පරීක්ෂණය කෙරෙහි අවධානය යොමු කොට නැති බවයි.

Chorzow Factory[7] නඩුවේ දී කෙසේ වෙතත් මේ පරීක්ෂණය පිළිගෙන ඇත. මෙහිදී ජාත්‍යන්තර යුක්ති අධිකරණය (Permanent Court of International Justice) පෝලන්තයට නියම කළේ ඔවුන් විසින් අදාළ සම්මුතිය කඩ කිරීමට එරෙහිව ජර්මනියට වන්දි ගෙවිය යුතු බවයි. අධිකරණය පැවසුවේ ඔවුන් අපසර්ජනය කළ දේපළවල වටිනාකම වන්දි වශයෙන් ගෙවිය යුතු බවයි.

නමුත් මෑතකදී නිදහස ලබා ගත් ප්‍රාග්ධනය අපනයනය කරන රාජ්‍යයන් මෙම මතය මුළුමනින්ම ප්‍රතික්ෂේප කරයි. මන්ද යටත් විජිත යුගය අවසාන වීමත් සමඟම සිය ආර්ථික ස්වෛරීභාවය ලබා ගැනීම සඳහා මෙම රාජ්‍යයන්ට සිය ආර්ථිකයන් ප්‍රතිසංසරකරණය කිරීම අවශ්‍ය විය. ඒ නිසා ඔවුන් සම්පූර්ණ වන්දිය යන ප්‍රතිමානයට

7. (1928) PCIJ Series A No. 17

කිසිසේත් රුචි නොවීය. ඔවුන් තර්ක කරන්නේ ජනසතු කිරීම ආර්ථිකමය ක්‍රියාදාමයක ප්‍රතිඵලයක් ලෙස සිද්ධ වේ නම් එහිලා වන්දියෙන් කොටසක් හෝ උචිත වන්දියක් (partial / appropriate compensation) පමණක් ගෙවීම ප්‍රමාණවත් බවයි. මෙලෙස රාජ්‍යයන් විශාල ප්‍රමාණයක් දීර්ඝ කාලයක් තිස්සේ සම්පූර්ණ වන්දිය යන්න ප්‍රතික්ෂේප කරන ලදී. ඒ නිසා බටහිර රටවලින් පැනනැගුණු සම්පූර්ණ වන්දිය නම් වූ වන්දි ගෙවීමේ සම්මතය යම්තාක් දුරකට දුර්වල කිරීමට සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයන්ගෙන් ඉදිරිපත් වූ මෙම අභියෝගය සමත් විය.

NIEO න්‍යාය යටතේ වන්දි ප්‍රදානය කිරීමේ දි අනුගමනය කරන තත්ත්වය සම්බන්ධයෙන් සමහරු පවසන්නේ මෙමගින් පවරා ගැනීම් සම්බන්ධයෙන් අවස්ථාවෙන් අවස්ථාවට වෙනස් තත්ත්වයන් අනුගමනය කිරීම අනුමත කරන බවයි. 1803 සම්මුතිය මගින් අයිතිකරු වෙත සුදුසු වන්දියක් ගෙවිය යුතු බව දක්වන අතර NIEO චාටර් පත්‍රයෙහි දක්වන්නේ ප්‍රමාණවත් වන්දියක් හිමිකරු වෙත ලැබිය යුතු බවත්, මෙම වන්දි ගෙවීමේ පදනම ජනසතු කිරීම සිදුකරන රටේ ගෘහස්ථ නීතිය හා එහි පර්ෂද විසින් තීරණය කළ යුතු බවයි. සමහරු තර්ක කරන්නේ NIEO චාටර් පත්‍රයෙහි පවරා ගැනීමේ අවස්ථාවෙන් අවස්ථාවට අදාළ වන නීතියේ වෙනසක් අනුගමනය කිරීම අනුමත නොකරන බවත්, මන්ද සෑම රාජ්‍යයක්ම සත්භාවයෙන් අන්තර්ජාතික නීතිය යටතේ ඔවුන් වෙත පවරා දී ඇති බැඳීම් ඉෂ්ට කරතැයි මෙමගින් අපේක්ෂා කරන නිසයි.

Libyan American Oil Co. (Liamco) vs Libya[8] වන්දි ගෙවීමේ සම්මතය ලෙස සම්පූර්ණ වන්දිය අදාළ කරගැනීම ප්‍රතික්ෂේප කළේය. වන්දි ගෙවීමේ සම්මතය ලෙස සම්පූර්ණ වන්දිය අදාළ කරගත් අතීත බේරුම්කරණ තීන්දු කෙරෙහි අවධානය යොමු කරමින් මෙම නඩුවේ දී බේරුම්කරු පැවසුවේ මෙම තීන්දු අපසර්ජනය නීතිවිරෝධී යයි සැලකූ වකවානුවක තීන්දු කළ ඒවා බැවින් ඒවා වර්තමානයේ අනුගමනය කළ යුතු සුදුසු පූර්ව නිදර්ශන නොවන බවයි. මෙලෙස බේරුම්කරණ කිහිපයකදීම සම්පූර්ණ වන්දිය අදාළ කරගැනීම ප්‍රතික්ෂේප කර ඇත.[9]

8. (1981) 2 ILM 1
9. Aminoil vs Kuwait (1982) 21 ILM 976;

කොමියුනිස්ට් රටවල් තර්ක කරනු ලැබුවේ ජනසතු කිරීමකදී කිසිම වන්දියක් ගෙවීම අනවශ්‍ය බවයි. නමුත් මෙම මතයට එතරම්ම පක්පාතීත්වයක් නොලැබිණි. එයට හේතුව ජාත්‍යන්තර නීතිය යටතේ කුමන ආකාරයක හෝ වන්දියක් ගෙවීමේ අවශ්‍යතාව ස්ථාපිත වූ මූලධර්මයක් වීමයි. වර්තමානයේ වන්දියෙන් කොටසක් ගෙවිය යුතුය යන්නට වඩා වැඩි මනාපයක් හිමි විය.

Williams and Humbert vs W. and H Tradmarks[10] සහ Sabbation vs Banco National de Cuba[11] යන නඩු තීරණ වලදී වන්දි ගෙවීමේ සම්මතය සම්බන්ධයෙන් ජාත්‍යන්තර නීතිය පිළිගත් ස්ථිර සම්මතයක් නොමැති බව පිළිගත් අතර, ජනසතු කිරීමකදී කිසිදු වන්දියක් ගෙවීමට අසමත් වේ නම් එය ජාත්‍යන්තර නීතිය උල්ලංඝණය කිරීමක් බවත් පිළිගන්නා ලදී.

Lithgow vs United Kingdom[12] නඩුවේ දී මිනිස් අයිතිවාසිකම් පිළිබඳ යුරෝපා අධිකරණය පෙන්වා දුන්නේ රාජ්‍යයක් ජනසතු කිරීමකට ගනු ලබන තීරණය හා එම ජනසතු කිරීම ආශ්‍රිතව ගෙවීමට තීරණය කරන වන්දි ප්‍රමාණය යන දෙකම එකිනෙක හා සම්බන්ධ බවයි. එම නිසා ගෙවීමට තීරණය කළ වන්දිය ප්‍රශ්න කිරීමට අන්තර් ජාතීය අධිකරණය මැදිහත් නොවේ. කෙසේ වුවත් වර්තමානයේ පවා මෙම මතභේදාත්මක නියමයන් තව දුරටත් දක්නට ඇති අතර ජාත්‍යන්තර නීතිය සම්පූර්ණ වන්දිය යන උපමානය තවමත් ආරක්ෂා කරයි. මෙහිලා උද්ගතව ඇති වෙනස නම් සම්පූර්ණ වන්දියක් ගෙවීම සෑම විටම අවශ්‍ය නොවන බවටත් ජනසතු කිරීම ආශ්‍රිතව පැන නැගෙන එක් එක් අවස්ථාවන් වෙන වෙනම සළකා බලා මෙහිලා ගෙවිය යුතු වන්දි ප්‍රමාණය සලකා බැලිය යුතු බවයි.

සත්කාරක රාජ්‍ය විසින් ආයෝජකයා වෙත උචිත වන්දියක් පිරිනැමීමේ දී එම වන්දි ප්‍රමාණය පදනම් වන්නා වූ විවිධ සාධක

10. (1986) AC 368
11. 193 F Supp 375 (1961)
12. (1986) 8 EHRR 329

ආයෝජන ගිවිසුම ඇතිවුණු කාල වකවානුව

ආයෝජන ගිවිසුම ඇති වූයේ සත්කාරක රාජ්‍යය ආයෝජකයා අයත් මව් රාජ්‍යයේ යටත් විජිතයක්ව සිටියදී නම් නිදහස ලැබීමෙන් පසුව සිදු කරන දේපල අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් සම්පූර්ණ වන්දියක් ගෙවීම අවශ්‍ය නොවන බවයි. මන්ද මෙහි දී සත්කාරක රටේත්, ආයෝජකයාගේත් ගිවිස ගැනීමේ හැකියාව සමාන තත්ත්වයක නොපැවති බැවිණි. ඔවුන් තර්ක කරන්නේ ජනසතු කිරීම ආර්ථිකමය ප්‍රතිසංස්කරණ වැඩ පිළිවෙලක ප්‍රතිඵලයක් ලෙස සිදුවිණි නම් එහිලා උචිත වන්දියක් ගෙවීම ප්‍රමාණවත් බවයි. මන්ද යත් සම්පූර්ණ වන්දියක් ගෙවීමට බල කළහොත් එමගින් ආර්ථිකමය වර්ධනය අරමුණු කොටගෙන සිදු කරන මෙම ජනසතු කිරීමේ වැඩ පිළිවෙළ මුළුමනින්ම ව්‍යර්ථ විය හැකි බැවිනි.

විදේශ ආයෝජකයා සත්කාරක රාජ්‍ය තුළ අහිතකර ක්‍රියාවන්හි නිරතව ඇත්නම් විශේෂයෙන්ම, පාරිසරික හානි සිදු කිරීමට පෙළඹී ඇත්නම් ලැබිය යුතු වන්දිය තීරණය කිරීමේ දී මෙම ක්‍රියාවන් අවධානයට ලක් කළ යුතු බවට බලවත් මතයක් පවතී.

Aminoil vs Kuwait[13] නඩුවේ දී කුවේට් විසින් ඇමරිකා එක්සත් ජනපදය සතු තෙල් සමාගම් කිහිපයක් ජනසතු කළ අතර සම්පූර්ණ වන්දිය ගෙවීමෙන් වැලකී සිටීමට කුවේටය මෙම සමාගම් පරිසරයට නොයෙකුත් හානිකර ක්‍රියා සිදු කළ බවටත්, වෙනත් අයුතු ක්‍රියාවල නිරත වුණු බවටත් කියා පෑවේය.

ගෙවිය යුතු වන්දිය තීරණය කිරීමේ දී ආයෝජකයා සත්කාරක රාජ්‍යයෙහි ආර්ථික හා සමාජීය සංවර්ධනයට සහාය දක්වා තිබේදැයි සොයා බලයි. මෙය සම්පූර්ණ වන්දියක් ගෙවිය යුතුය යන්නට සහය දක්වන්නක් වෙයි. Kalamazoo නඩුවේ දී ඇමරිකා එක්සත් ජනපද සමාගම ඉතියෝපියානු රාජ්‍යය සමඟ ඇති කරගත් ආයෝජන ගිවිසුම යටතේ සම්පූර්ණ කාර්යාවලිය පවත්වාගෙන ගියේ ආයෝජකයා විසින් බැවින් ඔහු වෙත සම්පූර්ණ වන්දියක ලැබීමට එය සුදුසුකමක් වෙතැයි තීරණය කරන ලදී.

13. (1982) 21 ILM 976

ආයෝජනයේ විශාලත්වය

එනම් ජනසතු කරන ලද ආයෝජනය ප්‍රමාණයෙන් කුඩා නම් ඉහළ ප්‍රමාණයක වන්දියක් ලැබීමට ඇති ඉඩ වැඩිය. බ්‍රිතාන්‍ය ගොවියන් කැන්සානියාවට ගොස් කුඩා පරිමාණයෙන් ඇරඹි ගොවිපළවල් ජනසතු කිරීමට ගත් තීරණයේ දී ඉහළ වන්දියක් ගෙවිය යුතු බව තීරණය කරන ලදී.

විදේශ ආයෝජකයා උපයා ඇති ලාභ

සත්කාරක රාජ්‍යය තුළ දී ආයෝජකයා ව්‍යාපාරික කටයුතුවල නිරත වීමේ දී අධික ලාභ උපයාගෙන තිබේද යන්න මෙහි දී සලකා බැලෙන තවත් තීරණාත්මක සාධකයකි. ආයෝජනයේ වටිනාකම ඉක්මවා යන ආකාරයෙන් පවා අධික ලාභ උපයාගෙන ඇත්නම් ගෙවන වන්දියෙන් එය අඩු කරනු ලැබේ. මෙම තත්ත්වය චිලී රාජ්‍යය සිය තඹ කර්මාන්තය ජනසතු කිරීමේ දී අදාළ කර ගැනුණි.

Kennecott සහ Anaconda යන ඇමරිකානු සමාගම් දෙක චිලී රාජ්‍යයේ තඹ කර්මාන්තයේ නිරත විය. ඔවුන් විසින් ආයෝජනයේ වටිනාකම බොහෝ සේ ඉක්මවාලමින් අධික ලාභ උපයාගත් බැවින් තඹ කර්මාන්තය ජනසතු කළ අවස්ථාවේ දී වන්දි ගෙවීමේ අවශ්‍යතාවක් නැතැයි තීරණය විය.

මෙලෙස උපයා ගත් අධික ලාභ සත්කාරක රාජ්‍යය විසින් ගෙවිය යුතු වන්දියෙන් අඩු කිරීමේ දී පැනනඟින ප්‍රායෝගික ප්‍රශ්න ගණනාවක් පවතී. එනම් මෙලෙස අඩු කළ යුතු මුදල් ප්‍රමාණය තීරණය කිරීමේ දී එම මුදල් ප්‍රමාණය අවංකව ගණනය කළ එකක් බව තහවුරු කරන්නේ කෙසේදැයි ප්‍රශ්නයක් හට ගනියි. නිදසුනක් ලෙස චිලී රාජ්‍යය ආයෝජකයා විසින් අධික ලාභ ඉපයූ බව පවසා සිටිය ද එය ස්වාධීනව පරීක්ෂා කර බැලීම පිණිස කිසිදු ගණන් හිලව් ඉදිරිපත් කිරීමක් නොකළේය. එමෙන්ම ආයෝජකයා අධික ලාභ උපයන අවස්ථාවේ දී සත්කාරක රාජ්‍යය ඊට ඉඩ ප්‍රස්ථාව ලබා දෙනු ලැබුවේ නම් පසුව එම මුදල් නැවත සත්කාරක රාජ්‍යය විසින් ලබා ගැනීම කොතරම් සාධාරණදැයි මේ සම්බන්ධයෙන් විවේචන ඉදිරිපත් වේ. නිදසුනක් ලෙස ලතින් ඇමරිකාවේ මුල්

පාලනය ගෙනගිය ඒකාධිපති පාලකයින් විදේශ ආයෝජකයන්ට ඔවුන් රිසි සේ ලාභ උපයා ගැනීමට අවස්ථාව සලසා දුන් අතර පසුව බලයට පත් වූ ප්‍රජාතන්ත්‍රවාදී පාලකයින් මෙහිලා සපුරා වෙනස් පියවරයන් අනුගමනය කරන ලදී.

මෙලෙස විදේශ ආයෝජකයා විසින් අධික ලාභ ඉපයීම සම්බන්ධයෙන් සත්කාරක රාජ්‍යය යම්තාක් දුරකට සම්බන්ධතාවක් දක්වා ඇත්නම් එහි දී විදේශ ආයෝජකයා රැගෙන ගිය ප්‍රමාණය කොපමණද, සත්කාරක රාජ්‍යය වෙත ලැබුණු ප්‍රමාණය කොපමණද යන්න ගණන් බැලීම දුෂ්කර කටයුත්තක් වේ.

වන්දි ගෙවීම පිළිබඳ නීතිය අයුතු ධනවත් වීම හා සාධාරණත්වය යන කරුණු මත රඳා පවතින බැවින් උචිත අවස්ථාවල දී උපයාගත් අධික ලාභ ගෙවිය යුතු වන්දියෙන් අඩු කර ගැනීම සාධාරණ ප්‍රතිපත්තියක් ලෙස පිළිගනු ලැබේ.

වක්‍ර (ව්‍යංග) ජනසතු කිරීම්

සත්කාරක රාජ්‍යය විසින් විදේශිකයා සතු දේපල ඍජුව මෙන්ම වක්‍රව පවරා ගත හැකිය. ඍජු පවරා ගැනීමක දී සත්කාරක රාජ්‍යය විසින් ආයෝජකයා සතු අයිතිය ආයෝජකයාගෙන් තමා වෙත පවරා ගැනීම සිදු වේ. නමුත් වක්‍රාකාර පවරා ගැනීමක් විවිධ මට්ටම් වලින් සිදුවිය හැකිය. මෙහි දී ඍජු ලෙස ආයෝජකයාගේ දේපල සත්කාරක රාජ්‍යය විසින් පවරා ගැනීමක් සිදු නොවුවත් එනම් දේපලේ භුක්තිය තව දුරටත් ආයෝජකයා වෙත පැවතිය ද ආයෝජකයා සතු දේපල භුක්ති විඳීමේ අයිතිය, ලාභ ඉපයීමේ අයිතිය, දේපල ආශ්‍රිත තීරණ ගැනීමේ අයිතිය, සිය දේපල මතින් ආර්ථික ප්‍රයෝජන ලැබීමේ අයිතිය යනාදී කාරණා කෙරෙහි සැලකිය යුතු ආකාරයේ මැදිහත් වීමක් සිදු කළහොත් එහි වක්‍ර ජනසතු කිරීමක් පවතී. එනම් දේපල භාවිතය, භුක්ති විඳීම සහ ඵල ප්‍රයෝජන ගැනීම යන අයිතිවාසිකම් කෙරෙහි සැලකිය යුතු බාධා සිදුවන ආකාරයෙන් සිදු කරන සැලකිය යුතු මැදිහත් වීමක් වක්‍ර ජනසතු කිරීමක් වේ.

වක්‍ර ජනසතු කිරීමක් හටගත හැකි අවස්ථා ගණනාවකි:

1. ආයෝජන මත අසාධාරණ ලෙස බදු පැනවීම. නිදසුනක් ලෙස ලැබෙන සම්පූර්ණ ලාභය මත බදු ගෙවීමට නියම කිරීම.
2. අනිවාර්ය කම්කරු ව්‍යවස්ථා පැනවීමෙන් ආයෝජනයන් හි මුළු ලාභය සත්කාරක රාජ්‍යයේ ජාතිකයින් වෙත ලැබෙන පරිදි ක්‍රියා කිරීම.
3. ආයෝජනයට අවශ්‍ය රාජ්‍ය අනුමැතිය ලබාගත නොහැකි වීම හෝ එහිලා අධික වියදමක් දැරීමට සිදුවීම හෝ ලබාදීම විරලව සිදුවීම.
4. මහජන නියෝගයන් පැනවීම තුළින් ව්‍යාපාරයන් ආරම්භ කිරීම අවහිර කිරීම.
5. අවශ්‍ය තාක්ෂණ නිලධාරීන්ගේ පැමිණීම වළක්වාලීමට ඒ සඳහා වීසා බලපත්‍ර නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම.

මෙලෙස දේපළ භාවිතය, භුක්ති විඳීම හෝ බැහැර කිරීම කෙරෙහි වන ඕනෑම මැදිහත් වීමක්, එම මැදිහත් වීමේ ප්‍රමාණය හා කාලය මත පවරා ගැනීමක් ස්ථාපනය කිරීමට සමත්විය හැකිය.

1965 ඉන්දුනිසියානු තෙල් නියෝගය Amco vs Indonesia[14] පිළිබඳ නඩුවේදී ඉන්දුනිසියානුවට එහි වූ තෙල් සමාගම්වල පාලනය තාවකාලිකව ආණ්ඩුව වෙත පවරා ගැනීමට තීන්දු දෙකක් නිකුත් කළේය. එනම් මෙමගින් එම සමාගම්වල අයිතිකරුවන්ගේ දේපළමය අයිතිවාසිකම් කෙරෙහි බාධාවක් සිදු නොවූව ද එම සමාගම්වල කළමණාකරුවන් ආණ්ඩුවේ සියළුම නියෝග පිළිපැදීමට බැඳී සිටියහ. මෙම නියෝග මගින් ව්‍යාපාරයේ සාමාන්‍ය කටයුතු කෙරෙහි බලාත්මක මැදිහත් වීමක් වූ බැවින් එය අසාධාරණ මැදිහත් වීමක් ලෙස දක්වා එමගින් පවරා ගැනීමක් සමන්විත වේයැයි දැක්විය.

---

14. (1984) 23 ILM 351; I ICSID Reports 589

Revere Copper & Brass Inc. vs OPIC[15] නඩුවේදී Revere Copper සමාගම ජැමෙයිකාව තුළ ආයෝජන සිදු කළ අතර එහිදි වසර 25 ක් සඳහා අදාළ බදු ඉහල නොදැම්මේ සහ බදු ලබා දීමේ සහතිකයක් විදේශ ආයෝජන ගිවිසුම තුළ ස්ථායිකරණ ප්‍රතිපාදනයක් යටතේ ලබා දී තිබුණි. නමුත් ඊට පටහැනිව ජැමෙයිකාව අදාළ ආයෝජනයේ රාජ්‍ය භාගය ඉහල දමන ලදී. එහිදි තීරණය වූයේ රාජ්‍ය භාගය ඉහල දැම්ම බදු ඉහල නැංවීමක් හා සමාන වන බැවින් එය වක්‍ර ජනසතු කිරීමක් හා එහිලා වන්දි ලබා දිය යුතු බවත්ය.

යම් ක්ෂේත්‍රයක නිරතවීම සඳහා බලපත්‍ර අවශ්‍ය වන විටෙක සත්කාරක රාජ්‍යය ඒවා ලබාදීම ප්‍රතික්ෂේප කරයි නම් එමගින් ආයෝජකයා සිය ව්‍යාපාරය පවත්වාගෙන යාමට ඇති හැකියාව නැති විය හැකිය. මෙමගින් ආයෝජකයා වෙත ඇති දේපල සම්බන්ධ හිමිකම කෙරෙහි බලපෑමක් නොවුවත් ආයෝජකයාට සිය ව්‍යාපාරය හෝ ව්‍යාපෘතිය පවත්වාගෙන යා නොහැකි බැවින් එය වක්‍ර පවරා ගැනීමකි. විශේෂයෙන්ම විදේශිකයා රාජ්‍යය සබඳතාවක් ඇති ආයතනයක් සමග සන්ධිය ව්‍යාපාරයක් ඇතිකොට ඇති විටෙක මෙවන් බලපත්‍ර අහෝසි කිරීමක් නිසා ව්‍යාපාරය තවදුරටත් පවත්වාගන යා නොහැකි වනවා සේම ව්‍යාපාරයේ දේපලද රජය සතු කර ගනියි නම් එය අපසර්ජනයක් සේ සැලකේ.

පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් අනුගමනය කරන තත්ත්වයන්ට අනුව මෙලෙස බලපත්‍ර අහෝසි කිරීමක් සිදු කර ඇති විටෙක එහි නීත්‍යානුකූලභාවය පරීක්ෂා කිරීමට නිශ්චිත උපමානයක් පිළිගෙන නොමැත. මන්ද මෙවන් බලපත්‍ර නිකුත් කිරීමක් මුළුමනින්ම සත්කාරක රාජ්‍යය සිය අභිමතය භාවිත කිරීමක් මත සිදුවන්නක් වන බැවිනි. බොහෝ අවස්ථාවල තීරණය වී ඇත්තේ බලපත්‍ර අවලංගු කිරීමක් හෝ නිකුත් කළ අවසරයන් මත සීමා පැනවීම දේපල පවරා ගැනීමක් ලෙස නොසලකන බවයි. එසේම අපරාධ වගකීම පැවරීමක් ලෙස විදේශිකයා සතු දේපළ පවරා ගැනීමක් හා එහිලා වන්දි නොගෙවීම නීත්‍යානුකූල යැයි සැලකේ. මන්ද, එසේ වන්දි ගෙව්වොත් අපරාධ වගකීම පැවරීම මුළුමනින්ම නිෂ්ප්‍රභා වන බැවිණි.

15.(1980) 56 ILR 258

විශේෂයෙන්ම පරිසර ආශ්‍රිත කාරණා නගර සැලසුම් යනාදී කාරණා හේතු කොටගෙන මුලින් ලබා දුන් බලපත්‍ර පසුව අහෝසි කිරීම සාධාරණීකරණය කළ හැකි බැවින් මෙවන් අවලංගු කිරීමක් හේතුවෙන් මුළුමනින්ම ආයෝජන කාර්යාවලිය නවතා දැමීමට හේතු වුව ද වන්දි ගෙවීම අනවශ්‍යයයි තීරණය වූ අවස්ථා දැකිය හැකිය.

Dillingham-Moore vs Murphyores[16] නඩුවේ දී ඇමරිකානු සමාගම් දෙකක් ඕස්ට්‍රේලියාවේ ෆේසර් දූපතේ මහා බාධක පරය ආශ්‍රිතව ඛනිජ ද්‍රව්‍යයක් ලබා ගැනීමට ආයෝජන ව්‍යාපෘතීන් ආරම්භ කළේය. මෙම ඛනිජ ද්‍රව්‍යය සම්බන්ධයෙන් ඕස්ට්‍රේලියානු වෙළඳපොල තුළ ඉල්ලුමක් නොතිබිණ. එබැවින් එම ඛනිජ ද්‍රව්‍ය අපනයනය කිරීමට ආයෝජකයාට සිදු විය. පරිසරාත්මක ගවේෂණයකින් අනාවරණය වූයේ මෙම ඛනිජ ද්‍රව්‍ය ලබා ගැනීමේ ක්‍රියාවලිය මහා බාධක පරය ආශ්‍රිත පරිසරයට හානිදායක බවයි. එමනිසා ඕස්ට්‍රේලියානු රජය ඒවා අපනයනය කිරීමට අවශ්‍ය බලපත්‍ර ලබා නොදීමට තීරණය කළේය. මෙමගින් මෙම ව්‍යාපෘතීන්හි ක්‍රියාකාරිත්වය සපුරා නැවතිණ. මෙහි දී ඇමරිකානු සමාගම් ඕස්ට්‍රේලියානු රජයේ මෙම ක්‍රියාවන්ට එරෙහිව වන්දි අයැද සිටියත් බේරුම්කාර මණ්ඩලය කියා සිටියේ මෙහි වන්දි ගෙවිය යුතු ගනයේ පවරා ගැනීමක් නොමැති බවයි. පරිසරාත්මක හේතුන් මත ආයෝජනයන් වන්දි ගෙවීමකින් තොරව අවසන් කළ හැකි බව International Bank of Washington vs OPIC[17] නඩුවේදී ද තීරණය විය.

නමුත් Santa Elena vs Costa Rica[18] නඩුවේදි වෙනස් තීරණයක් ගනිමින් පැවසුවේ අන්තර් ජාතික බැඳීමක් උල්ලංඝණය කිරීම මත අපසර්ජනය සිදු කළද එකී අපසර්ජනය හේතුවෙන් ආයෝජකයාට දැරීමට සිදුවන පාඩුව වෙනුවෙන් වන්දි ගෙවිය යුතු බවයි. තවද Metaclad vs Mexico[19] නඩුවේදී ද පරිසරාත්මක

16. (1979) 136 CLR 1
17. (1972) 11 ILM 1216
18. (2002) 5 ICSID Reports 153
19. (2001) 5 ICSID Reports 209

හේතූන් මත අදාළ අපසර්ජනය සිදු කළද වන්දි ගෙවිය යුතු බව බේරුම්කාර පර්ෂදයේ තීරණය විය. එනම් අපසර්ජනය වන්දි ගෙවීමකින් තොර විය යුතු නැත යන පදනම මත අපසර්ජනය කළේ නම් එය වරදක් ලෙස සලකා වන්දි ප්‍රදානය කෙරිණ.[20]

නමුත් Methanex vs US[21] හිදි නූතන ප්‍රවේශය සඳහා අඩිතාලම සපයන ලදි. එම නඩුවේදී සිදු වූ පරිසරාත්මක හානි සළකා බලා අපසර්ජනය කර තිබුණේ නම් වන්දි ගෙවීමේ වගකීමක් නොමැති බව තීරණය විය.

එමෙන්ම සාමාජීය හෝ මහජන අරමුණක් මුදුන් පමුණුවා ගැනීමේ අරමුණෙන් හෝ පරිපාලනමය, පළාත් පාලනමය හෝ ජාත්‍යන්තර වශයෙන් ක්‍රියාත්මක වන යම් නීතියක් ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් කෙනෙකුගේ දේපලමය අයිතිවාසිකම් සම්බන්ධයෙන් යම් මැදිහත් භාවයක් සිදු වුවත් එය පවරා ගැනීමක් ලෙස නොසලකයි. මන්දයත් සෑම රටකටම සිය පරමාධිපත්‍ය බලය භාවිත කරමින් සිය දේශ සීමාව තුළ නීති පැනවීමේ අයිතියක් හිමි වන බැවිනි. එවන් නීති පැනවීමක ප්‍රතිඵලයක් වශයෙන් යම් දේපල පවරා ගැනීමක් සිදු වුව ද එහිලා වන්දි ගෙවීමේ වගකීමක් උද්ගත නොවේ. මීට හේතුව වනුයේ විදේශ ආයෝජකයා සිය කැමැත්තෙන් සත්කාරක රාජ්‍යය කරා පැමිණෙන බැවින් ඔවුන්හට සත්කාරක රාජ්‍යයේ පවතින නීතීන්ට යටත් වීමට සිදු වේ. සත්කාරක රාජ්‍යය සිය පරමාධිපත්‍ය බලය භාවිත කරමින් පවතින නීතිය සම්බන්ධයෙන් සිදු කරන සංශෝධනයන්ට මුහුණදීමේ අවදානම විදේශ ආයෝජකයා භාරගත යුතු වේ. එවන් නීති පැනවීමකින් විදේශ ආයෝජකයා ආරක්ෂා කිරීමේ ක්‍රමයක් අනුගමනය කිරීම සුදුසු නැත. එනම් විදේශ ආයෝජකයාට යම් යම් කොන්දේසීන්ට යටත්ව ආයෝජන ක්‍රියාවලියේ නිරත වීමට නියම කිරීම දේපල පවරා ගැනීමක් නොවේ. මේ නිසා සත්කාරක රාජ්‍යය සිදු කරන මෙවන් ආකාරයේ මැදිහත්වීමක් සම්බන්ධයෙන් ජාත්‍යන්තර නීතියට මැදිහත් වීමේ අයිතියක් නොමැති අතර එය සත්කාරක රාජ්‍යයේ පරමාධිපත්‍ය බලයයි.

20. Texaco vs Libya (1977) 53 ILR 389; BP vs Libya (1977) 53 ILR
21. NAFTA/UNCITRAL Tribunal, 7 August 2002

කළහකාරීන් පිරිසක් දේපළ පවරා ගත් අවස්ථාවක අදාළ වන නීතිය

මෙහිදී විදේශිකයන්ට වන හානි සම්බන්ධයෙන් රාජ්‍ය වගකීම නම් වු සංකල්පය උද්ගත වේ. මෙවන් අවස්ථාවකදී පැන නැගෙන්නේ ආර්ථිකමය පවරා ගැනීමක් නොව අත්අඩංගුවට ගැනීමක් හා සමාන ක්‍රියාවකි. මේ අනුව සිවිල් කෝලාහලයක, ආරවුලක ප්‍රතිඵලයක් ලෙස විදේශිකයකුගේ දේපළ විනාශ වුවහොත් එහිදී රැකවරණය ලබාදීමට රජය අසමත් වුවහොත් එහිලා විදේශ ආයෝජකයා වෙත රාජ්‍යය වගකීම නම් සංකල්පය යටතේ වගකීමට යටත් වීමට රජයට සිදු වේ. එසේම මෙවන් සිද්ධියක් සම්බන්ධයෙන් රජයේ හෝ එහි නියෝජිතයන්ගේ ක්‍රියාකාරී සම්බන්ධතාවයක් වූයේ නම් උද්ගත වන සියලු හානි සඳහා වන්දි ගෙවීමේ වගකීමක් ද උද්ගත වේ. නමුත් එසේ වීමට නම් රජය හා වැරදිකරුවන් අතර යම් ස්ථිර සම්බන්ධයක් තිබීම හෝ නොසැලකිල්ල හෝ නොකර හැරීම නිසා රජයේ වගකීම උද්ගත විය හැකිය.

ඉරාන ඇමෙරිකා බේරුම්කාර පර්ෂදය මගින් විවිධ අවස්ථාවලදී කැරලිකරුවන් විසින් දේපළ අත්කර ගැනීම හා විනාශ කිරීම පිළිබඳ සලකා බැලීමට යෙදිණි. මේ සෑම අවස්ථාවකදී ම රජය හා කැරලිකාර කණ්ඩායම් අතර පවතින සම්බන්ධතාව ස්ථාපනය කිරීම අවශ්‍ය යැයි තීරණය විය. ඉරාන ඇමෙරිකා ආරවුල ආරම්භ වූ අවස්ථාවේදී රජය හා මෙවැනි සම්බන්ධයක්තිබූ බවට සාක්ෂි නොවූයෙන් කැරලිකරුවන් විසින් සිදුකළ ක්‍රියා සම්බන්ධයෙන් රජයේ වගකීම උද්ගත කිරීමට බේරුම්කරුවන් අකැමැති විය. නමුත් කැරැල්ල අවසාන වූ පසුව රජය හා යම් සම්බන්ධයක් තිබූ බව පෙනී ගිය නිසා මෙම කණ්ඩායම්වල ක්‍රියාවන් සම්බන්ධයෙන් ඉරානය වගකිව යුතු බව තීරණය විය.

ELSI[22] නඩුවේ දී ඇමෙරිකාව ඉතාලියට එරෙහිව ඇමෙරිකානු සමාගමකට අයත් කර්මාන්ත ශාලාවක පදිංචිය එහි පුරවැසියන් විසින් අත්පත් කර ගැනීමට අදාළව නගරයේ නගරාධිපතිවරයා ඔවුන්ට ධෛර්යය ලබා දුන්නේ යැයි යන පදනම මත පසුව එම සමාගම අසාර්ථක වීම සම්බන්ධයෙන් රජයේ වගකීම

22. (1989) ICJ Reports 15

උද්ගත කිරීමට තැත් කළේය. කෙසේ වුවද, සේවකයන්ගේ පදිංචිය සාමකාමී වුවක් වන අතර එමගින් එහි නිෂ්පාදනය කෙරේ බාධාවක් කළ බවට සාක්ෂි නොවීය. එබැවින් මින් එළඹිය හැකි නිගමනය නම් එවන් පදිංචියක් තුළින් යම් හානියක් සිදු වී නම් හා එම පදිංචිය නතර කිරීමට අසමත් වීම මත රාජ්‍ය වගකීම ඉටු නොකිරීම සඳහා වගකීම උද්ගත විය හැකි බවයි. එබැවින් එවැනි නොකර හැරීමක් පවරා ගැනීමකට සමාන යැයි නිගමනය කළ හැකිය. එබැවින් යම් අවස්ථාවක උද්ගතව ඇති හානි සම්බන්ධයෙන් වගකිව යුත්තේ විදේශ ආයෝජකයා නොවන බව පෙනී යයි නම් එවන් හානි සිදුකළ පුද්ගලයන් හා රජය අතර සබඳතාව ස්ථාපනය කළ හැකි නම් චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතිය පිළිගෙන ඇති රාජ්‍ය වගකීම නම් වූ සංකල්පය යටතේ සත්කාරක රාජ්‍යයේ වගකීම උද්ගත විය හැකිය.

එසේම යුද හමුදාවක් විසින් මෙවැනි දේපළ පවරා ගැනීමක් සිදු කරන විටදී එහිලා රජයේ සම්බන්ධතාව පැහැදිලිව ම හැඟී යන බව පිළිගෙන ඇත. **Amoco International Finance Corporation vs Iran**[23] නඩුවේදී දේපළ අත්පත් කර ගැනීම යුද හමුදාව විසින් සිදුකළ අතර **AAPL vs Sri Lanka**[24] නඩුවේ දී යුද වාතාවරණය පැවති වකවානුවක යුද හමුදාව දේපළ විනාශ කරන ලදී. **AAPL** ට අයත් දේපලක් මෙලෙස විනාශ වූ අතර **AAPL** ආයතනය, එක්සත් රාජධානිය සහ ශ්‍රී ලංකාව අතර පැවති ද්වි පාර්ශවීය ගිවිසුම මත පදනම් වෙමින් වන්දි අයැද සිටියේය. මෙහිලා ගිවිසුම යටතේ අදාළ දේපළ වලට පොරොන්දු වූ පූර්ණ රැකවරණය ලබා දීමට අසමත් වූ බැවින් රජයේ වගකීම උද්ගත වේ යැයි තීරණය වූ අතර ශ්‍රී ලංකාව වන්දි ගෙවීමේ වගකීමට යටත් විය.

23. (1987) 15 Iran – US CTR 189
24. (1991) 30 ILM 577